කලා ඔය නිම්නය සඳහා පෙව විවිධත්ව සංරක්ෂණය ඒකාබද්ධ කළ භූ දර්ශන මට්ටමේ ඉඩම් පරිහරණ සැලැස්ම.





ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
විසින් සකස් කරන ලදී.
පාරිසරික සංවේදී භූමි ප්‍රදේශවල පෙව විවිධත්ව සංරක්ෂණය හා
පරිසර පද්ධති සේවා නඩත්තු ව්‍යාපෘතිය.
පරිසර අමාත්‍යාංශය.

LUPD GUIDING FOR BETTER LAND USE

gef

UNDP Empowered lives. Resilient nations.

කලා ඔය නිම්නය සඳහා ජෛව විවිධත්ව සංරක්ෂණය ඒකාබද්ධ කළ භූ දර්ශන මට්ටමේ ඉඩම් පරිහරණ සැලැස්ම

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
විසින් සකස් කරන ලදී

GUIDING FOR BETTER LAND USE

පාරිසරික සංවේදී භූමි ප්‍රදේශවල ජෛව විවිධත්ව සංරක්ෂණය හා පරිසර පද්ධති සේවා නඩත්තු ව්‍යාපෘතිය

පරිසර අමාත්‍යාංශය

Empowered lives.
Resilient nations.

කලා ඔය නිම්නය සඳහා ජෛව විවිධත්ව සංරක්ෂණය ඒකාබද්ධ කළ භූ දර්ශන මට්ටමේ ඉඩම් පරිහරණ සැලැස්ම

ප්‍රකාශන හිමිකම : © ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
සියලු හිමිකම් ඇවිරිණි

ප්‍රකාශිත වර්ෂය : **2020**

සමස්ත සම්බන්ධීකරණය : ඒ. එස්. ඉලන්ගම්ගේ මිය , අධ්‍යක්ෂ ජනරාල්,
ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

තාක්ෂණික කතෘ : එච්. ඩී. සිසිර හපුආරච්චි,
සහකාර අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යා),
ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

පරිගණක අංශයේ
නිලධාරීන්
මෙහෙයවීම හා
මඟපෙන්වීම : ඩබ්ලිව්. එම්.එම්. ප්‍රියන්ති මිය,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු පද්ධති),
ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

සිතියම් සැකසීම : ආර්.එම්.ආර්.ඩී. කරුණාරත්න, ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී,
ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

ඩබ්.ඒ. මනුක සම්පත්, ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී,
ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

තාක්ෂණික සහාය : ගෝලීය පරිසර පහසුකම් හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ වන “පාරිසරික සංවේදී භූමි ප්‍රදේශවල ජෛව විවිධත්ව සංරක්ෂණය හා පරිසර පද්ධති සේවා නඩත්තු ව්‍යාපෘතිය”

ISBN : 978 - 624 - 5543 - 00 - 7

ජායාරූප සඳහා ස්තුතිය : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සෙව්වන්දි ජයකොඩි සහ
සුගන්ධි සමරසිංහ

අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය

වර්තමාන තත්ත්වය අනුව ජෛව විවිධත්ව සංරක්ෂණය ශ්‍රී ලංකාවට ඉතා වැදගත් වේ. විවිධ වූ සංවර්ධන කාර්යයන් නිසා, විවිධාකාරයේ ඉඩම් භාවිතයන් යටතේ ඇති භූමි සම්පත කෙරෙහි අඛණ්ඩව වැඩි වන ඉල්ලුම මත, ජෛව විවිධත්ව සංරක්ෂණය අභියෝගයක් බව පෙනේ. වර්තමානයේ දී ජෛව විවිධත්ව සංරක්ෂණය ආරක්ෂිත ප්‍රදේශ සංරක්ෂණයෙන් ඔබ්බට ගිය ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා වූ පුළුල්ව පිළිගත් භූ දර්ශන මට්ටමේ සංරක්ෂණයක් හඳුන්වා දී ඇත.

“පාරිසරික සංවේදී භූමි ප්‍රදේශවල ජෛව විවිධත්ව සංරක්ෂණය හා පරිසර පද්ධති සේවා නඩත්තු ව්‍යාපෘතිය” ගෝලීය පරිසර පහසුකම් ආයතනයේ (GEF) මූල්‍ය ප්‍රතිපාදන මත පරිසර අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘතියකි. ජෛවවිවිධත්ව සංරක්ෂණය මූලික කර ගනිමින් කලා ඔය ද්‍රෝණියේ සමස්ත භූ දර්ශනය පාදක කර ඉඩම් පරිහරණ සැලැස්මක් සැකසීම ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවට පවරන ලදී. ව්‍යාපෘතිය මඟින් මිශ්‍ර සහ විවිධ වූ ඉඩම් පරිහරණ රටාවන්ගෙන් යුත් පාරිසරික සංවේදී ප්‍රදේශ ආශ්‍රිතව ඒකාබද්ධ ජෛව විවිධත්ව සංරක්ෂණය නාභිගත කරන ලදී.

ජෛව විවිධත්ව සංරක්ෂණය සිදු කරන අතර ම විවිධ තරඟකාරී අවශ්‍යතා අතර භූමි සම්පත බෙදා වෙන් කිරීම සඳහා තීරණ ගැනීමේ කාර්යය පහසු කිරීමට ඉඩම් පරිහරණ සැලසුම්කරණය එක් උපාය මාර්ගයක් ලෙස යොදා ගැනීමට හැකි ය. එසේ වුව ද, පසුගිය කාල සීමාවේදී ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් පරිපාලන මායිම් පදනම් කර විවිධ මට්ටම් වලින් භූමි ඵලදායිතාවය ඉහළ නැංවීම අරමුණු කර ඉඩම් පරිහරණ සැලසුම් සකස් කරන ලදී. ජෛව විවිධත්ව සංරක්ෂණය ප්‍රධාන අරමුණ කර ගනිමින් භූ දර්ශන මට්ටමින් ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම අප දෙපාර්තමේන්තු නිලධාරීන්ට නවමු අත්දැකීමකි. නිලධාරීන් පුහුණු කිරීම තුලින්, විශේෂයෙන් ජෛව විවිධත්ව සංරක්ෂණය ඉඩම් පරිහරණ සැලසුම්කරණයේ ප්‍රමුඛ අරමුණක් ලෙස යොදා ගැනීම පිළිබඳව පුහුණුව තුලින් මෙම අභියෝගයට මුහුණ දීමට හැකි විය. මෙම ධාරිතා වර්ධනය තුලින් සැලසුම් ක්‍රියාවලිය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමට හැකි වූ අතර, මෙම නිමැවුම සියලු පාර්ශවවල එනම්, අපගේ කාර්ය මණ්ඩලය, විෂයානුබද්ධ විශේෂඥයින්, පාර්ශවකාර ආයතන නියෝජිතයින් සහ ඉඩම් පරිහරණය කරන්නන්ගේ ඒකාබද්ධ උත්සාහයක් වේ. මෙම අභ්‍යාසය අනෙකුත් ගංඟා ද්‍රෝණි සඳහා ද භාවිත කිරීම තුලින් රටෙහි ජෛව විවිධත්ව සංරක්ෂණය වඩාත් පුළුල් ලෙස සිදු කිරීමට හැකි වනු ඇත.

මෙම සැලැස්මේ ලබා දී ඇති නිර්දේශ ස්වභාවයෙන් ම විවිධ විෂයයන් හා සම්බන්ධ වේ. එබැවින්, විවිධ ආයතන වෙත එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වගකීම ඔවුන්ගේ විෂය ක්ෂේත්‍ර අනුව වෙන් කර දක්වා ඇත. ගංගා ද්‍රෝණියේ හඳුනාගත් පාරිසරික සංවේදී ප්‍රදේශවල ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම සඳහා මෙම සැලැස්මේ ඇති නිර්දේශ ක්‍රියාත්මක කරන අතර ම, එම ප්‍රදේශයට පරිබාහිරව පිහිටි ප්‍රදේශවල ඉඩම් භාවිතය ද මෙම සැලැස්මට අනුව සියලු පාර්ශවකරුවන්ගේ දායකත්වය ඇතිව නියාමනය කළ යුතු වේ. තව ද, ගංගා ද්‍රෝණිය තුළ වාසය කරනු ලබන ජනතාව, ජෛව විවිධත්ව සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම සඳහා යාන්ත්‍රණයක් සැකසීම ද වැදගත් වේ. මෙම සැලැස්ම පාර්ශවකාර ආයතනවල තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කරනු ඇතැයි බලාපොරොත්තු වන අතර ම, අවසන් වශයෙන් මෙය සමස්ත ද්‍රෝණියේ ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා ඉවහල් වනු ඇතැයි අපේක්ෂා කරමි .

ඒ. එස්. ඉලන්ගම්ගේ
අධ්‍යක්ෂ ජනරාල්
ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

ව්‍යාපෘති අධ්‍යක්ෂතුමියගේ පණිවිඩය

ශ්‍රී ලංකාව ජෛව විවිධත්වය අතින් පොහොසත් සහ ඉහළ මට්ටමේ ඒකදේශිකතාවයක් ඇති කුඩා දිවයිනකි. රටෙහි ජෛව විවිධත්වය අද්විතීය වන බැවින් එයට සර්වත්‍ර වටිනාකමක් හා වැදගත්කමක් ඇත. එසේ වුව ද, වර්තමානයේ නිරන්තරයෙන් සිදුවන මානව ක්‍රියාකාරකම් නිසා රටෙහි ජෛව විවිධත්වය තර්ජනයට ලක්ව ඇත. ඉහත සඳහන් කළ පරිදි සුවිශේෂී ඒකදෙශිකත්වය මෙන් ම ජෛව විවිධත්වයට උද්ගතව ඇති ඉහළ තර්ජන හේතුවෙන් ශ්‍රී ලංකාව ගෝලීය වශයෙන් ජෛව විවිධත්වය අතින් වැදගත් ස්ථානයක් බවට පත්ව ඇත.

ශ්‍රී ලංකාව 1992 දී ජෛව විවිධත්ව සම්මුතියට අත්සන් තබා ඇති අතර, 1994 දී එය බලාත්මක කර ඇති බැවින් එම සම්මුතියේ අදාළ ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කිරීමට බැඳී ඇත. ඒ අනුව මෙම අමාත්‍යාංශය මඟින් එම සම්මුතියේ හයවන වගන්තිය යටතේ ජාතික සංවර්ධන උපාය මාර්ග හා ක්‍රියාකාරකම් තුලට ජෛවවිවිධත්වය මුඛ්‍යධාරාගත කිරීම සඳහා ජාතික ජෛව විවිධත්ව උපාය මාර්ගික ක්‍රියාත්මක සැලැස්ම සංවර්ධනය කරන ලදී. ජාතික ජෛව විවිධත්ව උපාය මාර්ගික ක්‍රියාත්මක සැලැස්ම මගින් රටෙහි ජෛව විවධත්ව හායනයට බලපා ඇති හේතු පිළිබඳව ගැඹුරින් අධ්‍යනය කර විසඳුම් හා ක්‍රියාකාරකම් යෝජනා කර ඇත.

බොහොමයක් ගෝලීය වශයෙන් වැදගත් පරිසර පද්ධති සහ ගෝලීය වශයෙන් වැදගත් විශේෂයන්ගේ වාසස්ථාන ආරක්ෂිත ප්‍රදේශවලට පිටතින් පිහිටා ඇති බැවින්, ඒවා සීඝ්‍ර සංවර්ධනයේ තෙරපුමට මුහුණ පා ඇත. වර්තමානයේ රටේ පවත්නා වේගවත් නාගරීකරණය සහ රටේ ඉහළ ආර්ථික සංවර්ධන සන්දර්භය යටතේ විවිධ නිෂ්පාදන ක්‍රියාකාරකම් සඳහා ජෛව විවිධත්ව සංරක්ෂණය ඇතුළත් කළ වඩාත් සංරක්ෂණ-හිතකාමී සංවර්ධන ගමන් මඟක් සඳහා ශක්තිමත් පියවර නොගත හොත් ආරක්ෂිත ප්‍රදේශවල හා ඉන් පිටත ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම දුෂ්කර වේ. “පාරිසරික සංවේදී භූමි ප්‍රදේශවල ජෛව විවිධත්ව සංරක්ෂණය හා පරිසර පද්ධති සේවා නඩත්තු ව්‍යාපෘතිය”, ගෝලීය පාරිසරික පහසුකම් ආයතනයේ (GEF) අරමුදල් සැපයීම මත එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සහාය ඇතිව පරිසර අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන අතර, එමඟින් ඉහළ ජෛව විවිධත්ව අගයක් ඇති, විවිධ වූ ඉඩම් පරිහරණයන්ගෙන් යුත් ප්‍රදේශයන්හි ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවට නව ඉඩම් පරිහරණ පාලන රාමුවක් හඳුන්වා දෙනු ඇත.

ජෛව විවධත්ව සංරක්ෂණය සඳහා පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනාගනිමින් කලා ඔය ද්‍රෝණිය සඳහා භූ දර්ශන මට්ටමේ ඉඩම් පරිහරණ සැලැස්මක් සකස් කරන ලදී. පුළුල් ප්‍රචාරණයක් තුලින් රට පුරා මෙවැනි ක්‍රියාකාරකම් සඳහා පහළ මට්ටමේ දී ඉල්ලුමක් ජනනය කිරීමට ව්‍යාපෘති ක්‍රියාකාරකම්, එහි බලපෑම් සහ ඒ තුලින් උගත් පාඩම් වාර්තා ගත කර ඇත. එබැවින් මෙම සැලැස්මේ නිර්දේශ ද්‍රෝණියේ වෙසෙන ජනතාව ඇතුළු සියලු පාර්ශවකරුවන් අතර ප්‍රචාරය කළ යුතු වේ. තව ද, ජෛව විවිධත්ව සංරක්ෂණය තහවුරු කිරීම සඳහා මෙම අභ්‍යාසය වෙනත් ද්‍රෝණිවල ද යම් සංශෝධන සහිතව ක්‍රියාත්මක කළ යුතු වේ.

පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම පාරිසරික සංවේදී ප්‍රදේශ ව්‍යාපෘතියේ අනුග්‍රහයෙන් ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද ජෛව විවධත්වය ඒකාබද්ධ කළ භූ දර්ශණ මට්ටමේ මෙම ඉඩම් පරිහරණ සැලැස්ම විශේෂයෙන් උප-ජාතික මට්ටමේදී ඉඩම් පරිහරණ සැලසුම් තුලට ජෛව විවධත්ව ප්‍රමුඛතාවයන් ඒකාබද්ධ කිරීමට ඉඩම් පරිහරණ සැලසුම්කරුවන්ට මහ පෙන්වීමක් ලබා දෙනු ඇත. ඉහළ ජෛව විවධත්ව සහ සංරක්ෂණ අගයන් සහිත නිෂ්පාදන ක්‍රියාවලි සඳහා යොදා ගැනෙන භූ දර්ශනයන් තුළ සිදු කරනු ලබන සංවර්ධන ක්‍රියාකාරකම් නියාමනය සඳහා මෙම මෙවලම් උපයෝගී කර ගනු ඇතැයි අපේක්ෂා කරමි. .

කුලානි එච්. ඩබ්ලිව්. කරුණාරත්න
ව්‍යාපෘති අධ්‍යක්ෂිකා (පාරිසරික සංවේදී භූමි ප්‍රදේශවල ජෛව විවිධත්ව සංරක්ෂණය
හා පරිසර පද්ධති සේවා නඩත්තු ව්‍යාපෘතිය)
පරිසර අමාත්‍යාංශය

ස්තුතිය

කලා ඔය ගංගා ද්‍රෝණිය සඳහා වන ඉඩම් පරිහරණ සැලැස්ම බොහෝ ආයතන හා පුද්ගලයින්ගේ සහාය ඇතිව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ උත්සාහය මත වන එළි දැක්වීමකි. පළමුව මේ සඳහා අඛණ්ඩව මහ පෙන්වීමක් සිදු කරමින් සැලැස්ම සැකසීම සඳහා සහාය දැක් වූ ශ්‍රී ලංකා වයඹ සරසවියේ ජේෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය සෙව්වන්දි ජයකොඩි මහත්මියට ස්තුතිවන්ත විය යුතු වේ. එසේ ම මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා විවිධ අයුරින් සහාය දැක් වූ අනුරාධපුර හා පුත්තලම දිස්ත්‍රික්කයන්හි දිසාපතිවරුන්, අනුරාධපුර දිස්ත්‍රිකයේ පලාගල, ගල්නෑව, ඉපලෝගම හා කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව හා කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නියෝජනය කළ ප්‍රාදේශීය ලේකම්වරුන්, අදාළ පාර්ශවකාර ආයතනවල ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් සඳහා ස්තුතිය පුද කෙරේ. තව දුරටත් මෙම සැලසුම් ක්‍රියාවලියේ දී අඛණ්ඩව සහාය දැක් වූ පාරිසරික සංවේදී ව්‍යාපෘතියේ ව්‍යපෘති අධ්‍යක්ෂ, ව්‍යපෘති කාර්ය මණ්ඩලය සහ ව්‍යාපෘතිය මඟින් පත් කරන ලද ජෛව විවධත්ව විශේෂඥ කණ්ඩායමට ස්තුතිය හිමි වේ. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ තාක්ෂණික සම්බන්ධීකාරක සුගන්ධි සමරසිංහ මහත්මියටත් එම වැඩසටහනේ ක්ෂේත්‍ර සම්බන්ධීකරුවන්ටත් ඔවුන් ලබා දුන් සහාය වෙනුවෙන් ස්තුතිය හිමි වන අතර ම අවසාන වශයෙන් සැලසුම් ප්‍රදේශයේ ජනතාව ක්ෂේත්‍ර කටයුතුවල දී ලබා දුන් මහඟු දායකත්වය ඉතාමත් අගය කොට දැක්විය යුතු ය.

කෙටි යෙදුම්

BDS	- ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය
BRMS	- සමුද්‍රීය කොරල් පර අභයභූමිය
BZ	- ප්‍රේරක කලාපය
CBO	- ප්‍රජා මූල සංවිධාන
DCS	- ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
DFC	- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
DSD	- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
DWLC	- වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
EPA	- පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ
ESA	- පාරිසරික සංවේදී ප්‍රදේශය
F&FPO	- වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනත
FAO	- ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය
FO	- වන ආඥා පනත
GAP	- මනා කෘෂිකාර්මික පිළිවෙත්
GDP	- දල දේශීය නිෂ්පාදනය
GEF	- ගෝලීය පරිසර පහසුකම
GND	- ග්‍රාම නිලධාරී කොට්ඨාසය
IAS	- ආක්‍රමණශීලි ආගන්තුක විශේෂ
IPM	- ඒකාබද්ධ පලිබෝධ පාලනය
IUCN	- ස්වභාව සංරක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර සන්ධානය
KOB	- කලා ඔය ද්‍රෝණිය
LUPPD	- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
MASL	- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
MER	- වන අලි කළමනාකරණ රක්ෂිතය
MoL	- ඉඩම් අමාත්‍යාංශය
MoE	- පරිසර අමාත්‍යාංශය
NBSAP	- ජාතික ජෛව විවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම
NEA	- ජාතික පාරිසරික පනත
NEP	- ජාතික පාරිසරික ප්‍රතිපත්තිය
NLUP	- ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය
NPPD	- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
PA	- ආරක්ෂිත ප්‍රදේශ
SLM	- තිරසාර ඉඩම් කළමනාකරණය
UDA	- නාගරික සංවර්ධන අධිකාරිය
UNDP	- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
USDA	- එකසත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ක්ෂේත්‍ර සැලසුම් කණ්ඩායම

අනුරාධපුර දිස්ත්‍රික්කය

ආර්.ඊ.ඩබ්:එම්.එස්. බණ්ඩාර මහතා (නැසීගිය) සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ)

පී.ආර්.යූ. අබේරත්න මයා	ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී
එස්.එස්.කේ.දිසානායක මිය	සංවර්ධන නිලධාරී
සී.ආර්.එම. දේවිකා ප්‍රියදර්ශනී මිය	සංවර්ධන නිලධාරී
ආර්.බී.ආර්.එන්. කුමාරි මිය	සංවර්ධන නිලධාරී

පුත්තලම දිස්ත්‍රික්කය

මහින්ද පේමසිරි මයා	සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ)
ඩබ්:යූ.එස්.සිල්වා මිය	ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී
අයි.එම්.ඒ. ප්‍රේමලාල් මයා	ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී
එස්.පී.එන්. සී. අබේරත්න මයා	සංවර්ධන නිලධාරී
ජේ.ඒ.ආර්.සුදර්ශනී මිය	සංවර්ධන නිලධාරී

පටුන

පිටුව

අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය i

අධ්‍යක්ෂතුමියගේ පණිවිඩය ii

ස්තුතිය iii

කෙටි යෙදුම් Iv

ක්ෂේත්‍ර සැලසුම් කණ්ඩායම v

පටුන vi

වගු නාමාවලිය viii

සිතියම් නාමාවලිය ix

ඡායාරූප නාමාවලිය xi

1. **ව්‍යාපෘතිය පිළිබඳ හැඳින්වීම** 1

1.1 පාරිසරික සංවේදී ප්‍රදේශ විෂය පථය; වත්මන් ප්‍රතිපත්ති සහ ප්‍රතිපත්ති අවශ්‍යතා 2

2. **කලා ඔය ද්‍රෝණිය සඳහා වන ඉඩම් පරිහරණ සැලසුමේ අරමුණු** 7

3. **කලා ඔය ද්‍රෝණිය** 8

3.1 පරිපාලන මායිම් 8

3.2 කලා ඔය ද්‍රෝණියේ උප ජල පෝෂක 9

3.3 භෞතික පරිසරය 10

3.3.1 භූ විෂමතාවය 10

3.3.2 පස 12

3.3.3 දේශගුණය 14

3.3.4 ජලය 16

3.4 ජනගහනය 17

3.5 ඉඩම් පරිහරණය 18

3.6 ද්‍රෝණියේ පරිසර පද්ධති හා ජෛව විවිධත්වය 20

3.7 යෝජිත සංවර්ධන ක්‍රියාකාරකම් 22

3.8 දැනට තිබෙන අවකාශීය සැලසුම් 22

3.9 ජෛව විවිධත්වය ඒකාබද්ධ කල ඉඩම් පරිහරණ සැලැස්මක අවශ්‍යතාවය 25

4. යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම 26

4.1 ඉඩම් පරිහරණ සැලැස්ම සැකසීමේ ප්‍රවේශයන් හා ක්‍රමවේදය 26

4.2 සැලසුම් තීරණ 28

4.2.1 තීරණ 01: තෝරා ගත් පාරිසරික සංවේදී ප්‍රදේ වල ඉඩම් පරිහරණ කළමනාකරණය සහ වැඩි දියුණු කිරීම්.... 29

4.2.2 තීරණ 02: කලා ඔයේ අඛණ්ඩත්වය සඳහා ඉඩම් කළමනාකරණය 44

4.2.3 තීරණය 03: ද්‍රෝණියේ මානව හා පාරිසරික යහ පැවැත්ම සඳහා ආරක්ෂිත ප්‍රදේශ වටා පිහිටි පර්යන්ත ප්‍රදේශය හඳුනාගැනීම 47

4.2.4 තීරණය 04: මිනිස්-අලි සහපැවතුම් කලාප නිර්මාණය සඳහා ඉඩම් පරිහරණ සැලසුම්කරණය.... 52

4.2.5 තීරණ 05: කලා ඔයේ මෝය සහ ඒ අවට පරිසරය ආරක්ෂා කිරීමේ උපාය මාර්ග. 55

4.2.6 තීරණය 06: ජෛව විවධත්ව සංරක්ෂණය – ශාක හා සත්ත්ව විශේෂවල සංරක්ෂණ තත්ත්වය 58

4.2.7 තීරණ 07: ජෛව විවිධත්ව සංරක්ෂණය - ශාක සහ සත්ත්ව විශේෂවල තත්ත්වය 67

4.2.8 තීරණය 08: ද්‍රෝණිය තුළ ඇති ආක්‍රමණශීලි ආගන්තුක විශේෂ 67

4.2.9 තීරණය 09: ද්‍රෝණිය තුළ බෝග වන දර්ශයන්ගේ පැවැත්ම 68

4.2.10 තීරණය 10: උස් බිම්වල කෘෂිකාර්මික ශක්‍යතාවය සහ ඉඩම් පරිහරණ නිර්දේශ 70

4.3 කලා ඔය ද්‍රෝණිය සඳහා යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම 71

4.4 යෝජිත පාරිසරික සංවේදී ප්‍රදේශ සහ විශේෂ ඉඩම් පරිහරණ කලාප(SLUZs) සඳහා ඉඩම් පරිහරණ නිර්දේශ 74

4.5 නිෂ්පාදන හා සංරක්ෂණ ඉලක්ක 80

4.6 ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය සහ පසු විපරම 81

4.7 අනාගත පර්යේෂණ අවශ්‍යතා.... 81

වගු නාමාවලිය

වගුව 1. කලා ඔය ද්‍රෝණියේ උප ජලපෝෂක ප්‍රදේශ සහ ඒවායේ වපසරියන් 9

වගුව 2. කලා ඔය ද්‍රෝණියේ බෑවුම් කලාප සහ එම කාණ්ඩ වල දල වපසරිය මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස. 10

වගුව 3. ද්‍රෝණියේ මහා පාංශු කාණ්ඩ හා වපසරියන් 13

වගුව 4. ද්‍රෝණියේ ඇති විවිධ පාංශු ශ්‍රේණි 14

වගුව 5. කලා ඔය ගංගා ද්‍රෝණියේ ප්‍රධාන භූමි පරිහරණයන්/භූමි ආවරණයන් සහ ඒවායේ දල වපසරියන්. 18

වගුව 6. තෝරාගත් පාරිසරික සංවේදී ප්‍රදේශවල භූමි ප්‍රමාණයන් 35

වගුව 7. පාරිසරික සංවේදී ප්‍රදේශවල ඉඩම් පරිහරණය සහ භූමි ආවරණයේ විශාලත්වය එම ප්‍රදේශවල භූමි මුළු භූමි ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස 38

වගුව 8. පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ භූමියේ දක්නට ලැබෙන බෑවුම් කලාප 41

වගුව 9. පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ මහා පාංශු කාණ්ඩ 41

වගුව 10. පාරිසරික සංවේදී ප්‍රදේශවල දක්නට ලැබෙන පාංශු ශ්‍රේණි 42

වගුව 11. රජයේ ඉඩම් කාර්යය සංග්‍රහයට අනුව ගඟක පළල අනුව තැබිය යුතු රක්ෂිත සීමාවන් 44

වගුව 12. සලකුණු කරන ලද කලාපවල දල වපසරිය 54

වගුව 13. යෝජිත පාරිසරික සංවේදී ප්‍රදේශ, විශේෂ ඉඩම් පරිහරණ කලාප සහ අනෙකුත් ප්‍රදේශ සඳහා ඉඩම් පරිහරණ නිර්දේශ 75

සිතියම් නාමාවලිය

සිතියම 1. කලා ඔය ද්‍රෝණියේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාම නිලධාරී කොට්ඨාස 8

සිතියම 2. කලා ඔය ද්‍රෝණියේ උප ජල පෝෂක 10

සිතියම 3. කලා ඔය ද්‍රෝණියේ බෑවුම් කාණ්ඩ 11

සිතියම 4. කලා ඔය ද්‍රෝණියේ භූ විෂමතාවය 11

සිතියම 5. මහා පාංශු කාණ්ඩ හා ඒවායේ ව්‍යාප්තිය 12

සිතියම 6. පාංශු ශ්‍රේණි ව්‍යාප්තිය 13

සිතියම 7. කෘෂි පාරිසරික කලාප 15

සිතියම 8. ද්‍රෝණිය තුළ ජල දේහවල ව්‍යාප්තිය 17

සිතියම 9. ද්‍රෝණිය තුළ ජන ඝනත්වය 18

සිතියම 10. කලා ඔය ද්‍රෝණියේ ඉඩම් පරිහරණය සහ භූමි ආවරණය 19

සිතියම 11. ද්‍රෝණිය තුළ ස්වභාවික හා මිනිසා විසින් සැකසූ පරිසර පද්ධති 22

සිතියම 12. ජාතික භෞතික සැලැස්ම 2030 23

සිතියම 13. ජාතික භෞතික සැලැස්ම 2050 24

සිතියම 14. පාරිසරික සංවේදී ප්‍රදේශ තෝරා ගැනීම සඳහා සලකා බලන ලද යෝජිත ස්ථාන 34

සිතියම 15. සුදුසුකම් ලැබූ පාරිසරික සංවේදී ප්‍රදේශ 36

සිතියම 15a. තෝරා ගන්නා ලද පාරිසරික සංවේදී ප්‍රදේශයක විශාල කරන ලද සිතියම (පුත්තලම) 37

සිතියම 15b. තෝරා ගන්නා ලද පාරිසරික සංවේදී ප්‍රදේශයක විශාල කරන ලද සිතියම (අනුරාධපුර) 37

සිතියම 15c. විශාල කරන ලද පාරිසරික සංවේදී ප්‍රදේශ අංක 5 38

සිතියම 16a. සලකුණු කරන ලද කලා ඔය ඉවුරු රක්ෂිතය 45

සිතියම 16b. සලකුණු කරන ලද කලා ඔය ඉවුරු රක්ෂිතය (ඉහළ මධ්‍යම) 46

සිතියම 16c. සලකුණු කරන ලද කලා ඔය ඉවුරු රක්ෂිතය (ඉහළ ප්‍රදේශය) 46

සිතියම 17. ආරක්ෂිත ප්‍රදේශවල ප්‍රේරක කලාපය 48

සිතියම 18. කලා ඔය ද්‍රෝණියේ ආරක්ෂිත ප්‍රදේශ 49

සිතියම 19. කලා වැව, බළලු වැව ප්‍රදේශයේ ප්‍රේරක කලාපය (1.6km) 50

සිතියම 20. ගහේ ගහේ වාඩිය ප්‍රදේශයේ ප්‍රේරක කලාපය (1.6km) 50

සිතියම 21. විල්පත්තු ජාතික වනෝද්‍යානයේ නැගෙනහිර මායිමේ ප්‍රේරක කලාපය (1.6km) 51

සිතියම 22. කලා ඔය ද්‍රෝණියේ වන අලි ව්‍යාප්තිය 52

සිතියම 23. අලි සඳහා සුදුසු වාසස්ථාන “Maxent” නිමැවුමෙන් දක්වා ඇති අයුරු 54

සිතියම 24. අලි-මිනිස් සහපැවත්ම සඳහා යෝජිත කලාප 55

සිතියම 25a. කඩොලානවල සංරක්ෂණ තත්ත්වය. 56

සිතියම 25b. කඩොලානවල සංරක්ෂණ තත්ත්වය (විශාල කරන ලද) 56

සිතියම 26. කලා ඔය ද්‍රෝණියේ ශාක සහ සත්ත්ව විශේෂ වල සංරක්ෂණ තත්ත්වය 59

සිතියම 27. ද්‍රෝණිය තුළ උභයජීවින්ගේ සංරක්ෂණ තත්ත්වය 59

සිතියම 28. උභයජීවින් සඳහා වාසස්ථාන යෝග්‍යතාවය 60

සිතියම 29. පක්ෂීන්ගේ සංරක්ෂණ තත්ත්වය 60

සිතියම 30. සමනලුන්ගේ සංරක්ෂණ තත්ත්වය 61

සිතියම 31. සමනලුන් සඳහා වාසස්ථාන යෝග්‍යතාවය 62

සිතියම 32. කූරන් විශේෂවල සංරක්ෂණ තත්ත්වය 63

සිතියම 33. කූරන් විශේෂ සඳහා වාසස්ථාන යෝග්‍යතාවය 63

සිතියම 34. ක්ෂීරපායිගේ සංරක්ෂණ තත්ත්වය 64

සිතියම 35. උරගයින්ගේ සංරක්ෂණ තත්ත්වය 65

සිතියම 36. උරගයින් සඳහා වාසස්ථාන යෝග්‍යතාවය 65

සිතියම 37. මත්ස්‍ය විශේෂවල සංරක්ෂණ තත්ත්වය 66

සිතියම 38. කොරල් පරය ආශ්‍රිත මත්ස්‍ය විශේෂවල ව්‍යාප්තිය 66

සිතියම 39. ද්‍රෝණිය තුළ ශාක හා සත්ත්ව විශේෂවල තත්ත්වය 67

සිතියම 40. කලා ඔය ද්‍රෝණියේ ආක්‍රමණශීලි විශේෂවල ව්‍යාප්තියේ ඝනත්වය 68

සිතියම 41. කලා ඔය ද්‍රෝණියේ බෝග වන දර්ශවල ව්‍යාප්තිය 69

සිතියම 42. ද්‍රෝණිය තුළ කෘෂිකාර්මික ශක්‍යතාවය 70

සිතියම 43. කලා ඔය ද්‍රෝණිය සඳහා යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම 73

ඡායාරූප නාමාවලිය

ඡායාරූප 1. කලා වැවේ දර්ශනයක් 16

ඡායාරූප 2. කලා ඔය ඉවුරේ ඉදිරී වැටී ඇති විශාල ගසක් 44

ඡායාරූප 3. මෝය පිහිටි ගඟේ වාඩිය ප්‍රදේශයේ ගුවනේ සිට ලබා ගත් දර්ශනයක් 57

ඡායාරූප 4. කලා ඔය පහළ ප්‍රදේශයේ හොඳින් වැවුණු කඩොලාන 57

ඡායාරූප 5. ද්‍රෝණිය තුළ ජීවත් වන සමනලුන් 62

1. ව්‍යාපෘතිය හැඳින්වීම

''පාරිසරික සංවේදී භූමි ප්‍රදේශවල පෙව විවිධත්ව සංරක්ෂණය හා පරිසර පද්ධති සේවා නඩත්තු ව්‍යාපෘතිය'', ගෝලීය පරිසර පහසුකම (GEF) මඟින් අරමුදල් සපයන ව්‍යාපෘතියක් වන අතර, එය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සහාය ඇතිව පරිසර අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කෙරේ. සංරක්ෂණය සඳහා දැඩි අවශ්‍යතාවයක් සහිත නිෂ්පාදන කාර්යයන් සඳහා යොදා ගැනෙන ඉඩම්වල ගෝලීය වශයෙන් වැදගත් පෙව විවිධත්වයන් ආරක්ෂා කිරීමට මෙම ව්‍යාපෘතිය දායක වේ. නව ඉඩම් පරිහරණ පාලන රාමුවක් තුළින් ආරක්ෂිත ප්‍රදේශවලින් පිටත විශේෂ පාරිසරික සංවේදී ප්‍රදේශවල පෙව විවිධත්වය ආරක්ෂා කිරීමට ව්‍යාපෘතියේ මෙම පියවර තුලින් ශක්තිමත් කරනු ඇත. ව්‍යාපෘති ක්‍රියාකාරකම් තුලින් ඉහළ සංරක්ෂණ වටිනාකම් සහිත විවිධ භාවිතයන් සඳහා යොදාගෙන ඇති ඉඩම්වල ගෝලීය වශයෙන් වැදගත් පෙව විවිධත්වයන් ආරක්ෂා කිරීමට ඉවහල් වනු ඇත.

මෙම ව්‍යාපෘතියේ මූලික පරමාර්ථය වනුයේ "ආරක්ෂිත ප්‍රදේශ ජාලයෙන් පිටත, ඉහළ සංරක්ෂණ වැදගත්කමක් ඇති ප්‍රදේශවල පෙව විවිධත්ව කළමනාකරණය, සංවර්ධනයේ ප්‍රධාන අංගයක් වශයෙන් යොදා ගැනීම සඳහා යාන්ත්‍රණයක් ලෙස ''පාරිසරික සංවේදී ප්‍රදේශ'' සංකල්පය ක්‍රියාත්මක කිරීම ය. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය ප්‍රධාන නිමැවුම් දෙකක් අපේක්ෂා කෙරේ. එනම්; (1) පාරසරික සංවේදී ප්‍රදේශ නම් කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ජාතික බලාත්මක රාමුව ශක්තිමත් කිරීම සහ (2) කලා ඔය ද්‍රෝණියේ හඳුනාගෙන ඇති ස්ථානවල දිගු කාලීනව හා අඛණ්ඩව ඔරොත්තු දීමේ හැකියාව සඳහා පෙව විවිධත්වයට හිතකර වන ලෙස පාරිසරික සංවේදී ප්‍රදේශ කළමනාකරණ ය.

භූ දර්ශනයක් හෝ මුහුදු තීරයක් කළමනාකරණය කිරීමේ මෙවලමක් ලෙස, පාරිසරික සංවේදී ප්‍රදේශ සංකල්පය පාරිසරික දෘෂ්ටි කෝණයකින් මෙම ව්‍යාපෘතිය යොදා ගනී. පාරිසරික සංවේදී ප්‍රදේශ යනු විධිමත් ආරක්ෂිත ප්‍රදේශයකින් පිටත ප්‍රදේශයක් වන අතර, එය පෙව විවිධත්වය දිගු කාලීනව නඩත්තු කිරීම සඳහා සහ ජලය, පස සහ අනෙකුත් ස්වාභාවික සම්පත්වල ඵලදායිතාව පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. එමෙන් ම එයට සම්බන්ධ එම ප්‍රදේශයේ ජනතාවට, රටෙහි සමස්ත ප්‍රජාවට මෙන් ම ගෝලීය ප්‍රජාවට ද පාරිසරික, ආර්ථික හා සංස්කෘතික ප්‍රතිලාභ ලබා දීම සඳහා මෙය ඉතා වැදගත් වේ. "

කලා ඔය ද්‍රෝණියේ සිදු කරන ලද මූලික සමීක්ෂණයේ දී ලබාගත් පාරිසරික නිර්ණායක හා පරිසර පද්ධති සේවාවන් පදනම් කර ලබා දුන් සමුච්චිත ලකුණු අනුව කලා ඔය ද්‍රෝණියේ පාරිසරික සංවේදී ප්‍රදේශ 13 ක් මුලින් ම හඳුනා ගන්නා ලදී. එම ප්‍රදේශ අතුරින් ප්‍රදේශ පහක් ප්‍රමුඛතාවය අනුව තෝරා ගන්නා ලදී. එම ප්‍රදේශ නම් වනාත විල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි (1) විල්ලු පාරිසරික සංවේදී ප්‍රදේශය, (2) ගහේ වාඩිය පාරිසරික සංවේදී ප්‍රදේශය, (3) වේවැල් කැලේ පාරිසරික සංවේදී ප්‍රදේශය, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි (4) මානෑවකන්ද පාරිසරික සංවේදී ප්‍රදේශය සහ (5) කලා ඔයේ දෙපස කිලෝ මීටර් හතරක් දිගැති ගංගාශ්‍රිත පාරිසරික සංවේදී ප්‍රදේශය වේ.

පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ නිසි කළමනාකරණය යටතේ තිරසාර ආර්ථික ක්‍රියාකාරකම් සඳහා ඉඩ දෙන අතර ම, එම ප්‍රදේශ තුළ පෙව විවිධත්වය සහ අනෙකුත් ස්වභාවික සම්පත් සංරක්ෂණය සඳහා ඉඩම් කළමනාකරණය ප්‍රශස්ත අයුරින් පවත්වා ගැනීමේ ප්‍රධාන ප්‍රවේශය ලෙස ඉඩම් පරිහරණ සැලසුම්කරණ හා කළමනාකරණ රාමුව භාවිත කිරීමට මෙම ව්‍යාපෘතිය යෝජනා කර ඇත. පෙව විවිධත්ව සංරක්ෂණය අරමුණු කර ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවට (LUPPD) පවරන ලද අතර, ඒ

අනුව එම දෙපාර්තමේන්තුව විසින් කලා ඔය ද්‍රෝණිය සඳහා ජෛව විවිධත්ව සංරක්ෂණය ඒකාබද්ධ කර, ඉඩම් පරිහරණ සැලැස්මක් සැකසීම 2018 වර්ෂයේ ආරම්භ කරන ලදී.

1.1 පාරිසරික සංවේදී ප්‍රදේශ විෂය පථය; වත්මන් ප්‍රතිපත්ති සහ ප්‍රතිපත්ති අවශ්‍යතා

පාරසරික සංවේදී ප්‍රදේශ විෂය පථය

සාමාන්‍යයෙන් පාරසරික සංවේදී ප්‍රදේශයක් යනු දේශීය ප්‍රජාවට පාරසරික, ආර්ථික සහ සංස්කෘතික ප්‍රතිලාභ ලබා දීම සඳහා ජෛව විවිධත්ව සංරක්ෂණය හා නඩත්තුව මෙන් ම ජලය, පස සහ අනෙකුත් ස්වභාවික සම්පත්වල දිගු කාලීන ඵලදායිතාවය පවත්වාගෙන යා යුතු ඉතා වැදගත් ප්‍රදේශයකි.

‘‘පාරිසරික සංවේදී ප්‍රදේශ’’ සංකල්පය 1987 දී එක්සත් රාජධානිය විසින් හඳුන්වා දෙන ලද අතර, ඒ අනුව එම සංකල්පයේ ආරම්භය සිදුව ඇත. එවැනි ක්‍රමයක් සංවර්ධනයට පදනම් වී ඇත්තේ ‘‘ග්‍රාමීයව පවතින වනජීවී සහ ඓතිහාසික ලක්ෂණ සංරක්ෂණය හා වැඩි දියුණු කිරීම කෙරෙහි කෘෂිකර්මාන්තය මඟින් විශාල බලපෑමක් සිදු කළ හැකි ය’’ යන කරුණ වේ[1]. විශේෂයෙන් ඉහළ අගයක් සහිත භූ දර්ශනයන්, වන ජීවීන් හෝ ඓතිහාසික වටිනාකමක් ඇති රටේ ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීමට ගොවීන් දිරිමත් කිරීම සඳහා දිරිගැන්වීම් ලබා දීමේ අරමුණින් පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුන්වා දෙන ලදී[2]. පාරසරික සංවේදී ප්‍රදේශ ක්‍රමය තුලින් එවැනි ප්‍රදේශ ආරක්ෂා කිරීමට ගොවීන් දිරිමත් කරන ලදී. එක්සත් රාජධානියේ, පාරිසරික සංවේදී ප්‍රදේශ යනු ග්‍රාමීය බොහෝ ලක්ෂණ ඇතුළත් ජාතික වැදගත්කමින් යුත් භූ දර්ශනයන්, වන ජීවීන් සහ ඓතිහාසික අභිරුචියක් සහිත ප්‍රදේශ (උදා: වන තීරු, තණබිම්, ගංගා නිම්න ආශ්‍රිත තෘණ බිම්) වන අතර, ඒවා දර්ශනීයත්වය අතින් ඉහළ අගයක් ගන්නා අතර ම ශාක සහ වන ජීවීන් සඳහා වාසස්ථාන සපයනු ලැබේ. සෑම පාරිසරික සංවේදී ප්‍රදේශයක් ම අද්විතීය වන අතර, එයට ම ආවේණික වූ පාරිසරික ලක්ෂණ ඇති බැවින් ගොවීන් විසින් ඉටු කළ යුතු ඉඩම් කළමනාකරණ අවශ්‍යතා ඒවා පිහිටි ස්ථාන අනුව විවිධ වේ[3]. එක්සත් රාජධානියේ, විශේෂ පාරිසරික ලක්ෂණ ආරක්ෂා කරන ගොවිතැන් ක්‍රම පවත්වා ගෙන යාම හෝ අනුගමනය කිරීම සඳහා පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ ගොවීන් දිරිමත් කිරීම සෑම විට ම ස්වේච්ඡාවෙන් ක්‍රියාත්මක වේ[4]. විවිධ රටවල පාරිසරික සංවේදී ප්‍රදේශ යන යෙදුමේ විවිධ අර්ථකථන සහ භාවිතයන් දක්නට ලැබේ.

මෙම ව්‍යාපෘතියේ ‘‘පාරිසරික සංවේදී ප්‍රදේශ’’ පහත දක්වා ඇති ලෙස පුළුල්ව නිර්වචනය කර ඇත[5];

[1] Website Department for Environment Food and Rural Affairs (DEFRA), available at: http://adlib.everysite.co.uk/adlib/defra/content.aspx?id=000HK277ZW.0A75HQWNML25Y9Z.

[2] Nature net, available at: http://naturenet.net/status/esa.html

[3] Ibid.

[4] Website Department for Environment Food and Rural Affairs (DEFRA), available at: http://adlib.everysite.co.uk/adlib/defra/content.aspx?id=000HK277ZW.0A75HQWNML25Y9Z.

[5] Website Department for Environment Food and Rural Affairs (DEFRA), available at: http://adlib.everysite.co.uk/adlib/defra/content.aspx?id=000HK277ZW.0A75HQWNML25Y9Z. It is mentioned by DEFRA that in some cases, farmers are offered financial incentives to open their land for public access.

අදාළ කාර්යයට සහභාගී වන දේශීය ප්‍රජාවට මෙන්ම සමස්ත ගෝලීය ප්‍රජාවට ම පාරිසරික, ආර්ථික සහ සංස්කෘතික ප්‍රතිලාභ ලැබෙන ලෙස ජෛව විවිධත්වය සහ ජලය, පස සහ අනෙකුත් ස්වාභාවික සම්පත් දිගු කාලීනව නඩත්තු කිරීම ඉතා වැදගත් වන විධිමත් ආරක්ෂිත ප්‍රදේශයකින් පිටත පිහිටි ප්‍රදේශයක් ලෙස නිර්වචනය කර ඇත.

ජාන විශේෂ හා පරිසර පද්ධති ඇතුළුව එහි තීරණාත්මක ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකාව දැනටමත් වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනත හා වන ආඥා පනත යටතේ ආරක්ෂිත ප්‍රදේශ ජාලයක් පිහිටුවා ඇත. ප්‍රායෝගිකව, භූ දර්ශනයක් තුළ ජෛව විවිධත්වය ආරක්ෂිත ප්‍රදේශයන්ට පමණක් සීමා නොවේ. ආරක්ෂිත ප්‍රදේශයන්ට පිටතින් පිහිටි විවිධ වූ ඉඩම් භාවිතයන්/භූමි ආවරණයන් නිසා නිර්මාණය වන විවිධ පාරිසරික පද්ධති ද ජෛව විවධත්වය අතින් පොහොසත් වේ. මෙවැනි බොහෝ ප්‍රදේශවලට ආරක්ෂිත ප්‍රදේශවල ප්‍රේරක කලාප, ගංගා ඉවුරු වෘක්ෂලතා තීර ඇතුළත් ගංගා රක්ෂිත, හුදකලා වන ලැහැබ්, වැව් රක්ෂිත සහ විවිධ ඉඩම් පරිහරණයන් ඇතුළත් වේ.

රට තුළ විවිධ ඉඩම් පරිහරණයන්/භූමි ආවරණයන් මිශ්‍රව පවතින බැවින්, ආරක්ෂිත ප්‍රදේශ මඟින් පමණක් සියලු ම ජාන විශේෂ සහ පරිසර පද්ධති සංරක්ෂණයට හෝ ආරක්ෂා කිරීමට නො හැකි වේ.

එම නිසා ප්‍රධාන වශයෙන් මානව ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස සිදුවන වෙනස්වීම් නිසා ආරක්ෂිත ප්‍රදේශවලට පිටතින් පිහිටි පාරිසරික වැදගත්කමින් යුත් ප්‍රදේශවලට අහිතකර බලපෑම් දැනටමත් සිදුව ඇති හෝ ඉදිරියේදී එලෙස සිදු වීමට ඉඩ ඇත. පාරිසරික වැදගත්කමක් ඇති මෙම ප්‍රදේශවල තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සහ මෙම ප්‍රදේශවල පරිසර පද්ධති සේවාවන් පවත්වාගෙන යාම සහතික කිරීම අරමුණු කර ගනිමින් මානව ක්‍රියාකාරකම් සහ සංවර්ධන කටයුතු නිසා උද්ගතවන තර්ජන කළමනාකරණය කිරීමට නිශ්චිත උත්සාහයක් අවශ්‍ය වේ. ආරක්ෂිත ප්‍රදේශ ජාලයෙන් පිටත පිහිටා ඇති පාරිසරික වැදගත්කමක් ඇති මෙම ප්‍රදේශ ප්‍රමාණවත් ලෙස සංරක්ෂණය කිරීම, වඩාත් පරිසර හිතකාමී ඉඩම් පරිහරණයන් හඳුන්වාදීම සහ සංරක්ෂණය, ඒවා පවතින සම්පත් භාවිතය සහ සමාජ ආර්ථික සංවර්ධනය අතර හුවමාරු කිරීම පිළිබඳ මනා අවබෝධයක් සඳහා පහසුකම් සැලසීම මෙහි අරමුණ වේ. එවැනි හුවමාරුවකට පහසුකම් සැලසීම සඳහා ජෛව විවිධත්ව සංරක්ෂණය අරමුණු කරගනිමින් සකස් කරන ලද භූ දර්ශන මට්ටමේ ඉඩම් පරිහරණ සැලැස්මක් වැනි සුදුසු තීරණ ගැනීමේ මෙවලමක් භාවිත කළ හැකි අතර ම සමාජයට ප්‍රශස්ත ප්‍රතිලාභ සහතික කළ හැකි වේ.

එබැවින්, භූ දර්ශනය තුළ ආරක්ෂක ප්‍රදේශ වලින් පිටත පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා නව ප්‍රවේශයක් ව්‍යාපෘතිය විසින් යෝජනා කළ අතර, එය ආරක්ෂක ප්‍රදේශ වලින් පිටත ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සඳහා ඉඩම් පරිහරණ සැලැස්ම සැකසීමේ දී භාවිත කරන ලදී. මෙම ප්‍රවේශය ආරක්ෂිත ප්‍රදේශවලට සීමා නො වී ඉන් ඔබ්බට භූ දර්ශන මට්ටමින් සංරක්ෂණය සඳහා නව හා පුළුල් කළමනාකරණ රාමුවක් ලෙස එළි දක්වන ලදී.

එබැවින් පාරිසරික සංවේදී ප්‍රදේශ නිශ්චිත සංරක්ෂණ හෝ ආරක්ෂිත ප්‍රදේශයකට වඩා “කළමනාකරණය සඳහා වූ සංකල්පයක්” ලෙස සැලකිය යුතු ය. මෙම ප්‍රදේශ ආරක්ෂා කිරීමේ ක්‍රියා මාර්ගවලට පමණක් සීමා නොවී විවිධ වර්ගයේ මානව භාවිතයන් ඇති ප්‍රදේශවල (උදා: කෘෂිකාර්මික, ධීවර, වාරිමාර්ග, සංචාරක ආදිය) ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත, 1988 අංක 56 දරණ ජාතික පාරිසරික පනත (සංශෝධිත) සහ 2000 අංක 53 දරණ ජාතික පාරිසරික පනත (සංශෝධිත) යන පනත්වල පාරිසරික සංවේදී ප්‍රදේශ (ESA) යන යෙදුම භාවිත නො කෙරේ. එසේ වුව ද, එම පනත්වල තිබෙන ප්‍රතිපාදන යටතේ "පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ" (EPA) හඳුනා ගෙන ප්‍රකාශයට පත් කිරීමට හැකියාව ඇත. පරිසර විෂය පිළිබඳ අදාළ අමාත්‍යවරයාට 1980 අංක 47 දරණ ජාතික පරිසර පනතේ සහ එහි සංශෝධනවල 24 (A) සහ 24 (d) ප්‍රතිපාදන අනුව පාරිසරික වැදගත්කමක් ඇති හෝ තර්ජනයට ලක්ව ඇති හෝ වැඩි ආරක්ෂාවක් අවශ්‍ය ඕනෑ ම ප්‍රදේශයක් පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයක් ලෙස ගැසට් මඟින් ප්‍රකාශයට පත් කළ හැකි ය. ඒ අනුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් සුදුසු ස්ථාන / ප්‍රදේශ හඳුනාගෙන ඒවා පරිසර ආරක්ෂණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාවලිය සිදු කරනු ලැබේ. පහත දක්වා ඇති ප්‍රදේශ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ලෙස සැලකිය හැකි ය; (1) සුවිශේෂී ලක්ෂණ වලින් යුත් පාරිසරික පද්ධති (උදා: තර්ජනයට ලක්ව ඇති හෝ ඒකදේශීය ශාක සහ සත්ත්ව විශේෂ සහිත ඉහළ ජෛවවිවිධත්ව වටිනාකමකින් යුත් ප්‍රදේශ), (2) සෞන්දර්යාත්මක වශයෙන් වටිනාකමක් හෝ වැදගත්කමක් ඇති භූ දර්ශනයන් හෝ පරිසරයන් හෝ භූගෝලීය ප්‍රදේශ (උදා: දිය ඇලි, උණු දිය උල්පත්, හුණු ගල් ගුහා ඇතුළු වෙනත් ගුහා), (3) ජල විද්‍යාත්මකව වැදගත් ස්ථාන (උදා: තෙත්බිම්, ජල පෝෂක ප්‍රදේශ, වැදගත් ජල මාර්ග, විල්), (4) සංචාරක ආකර්ෂණීය ස්ථාන සහිත භූ දර්ශන (උදා: මුහුදු වෙරළ, කඳු වැටි, ගංගා, දර්ශනයන් නිරීක්ෂණය කළ හැකි ස්ථාන), (5) වැඩි අවදානමක් සහිත ප්‍රදේශ (උදා: නායයෑම් අවදානම් ප්‍රදේශ, පස ඛාදනය වීමේ වැඩි ප්‍රවණතාවක් ඇති ප්‍රදේශ), (6) විද්‍යාත්මකව වැදගත් වන ප්‍රදේශ/භූ දර්ශන, (7) ගංවතුර රඳවා තබා ගැනීමට වැදගත් වන ප්‍රදේශ, (8) වෙනත් පනත් මඟින් ප්‍රකාශයට පත් කර ඇති පාරිසරික වශයෙන් වැදගත් ප්‍රදේශවල ප්‍රේරක කලාප, (9) වෙනත් ප්‍රතිපත්ති හෝ විද්‍යාත්මක අධ්‍යන මඟින් ආරක්ෂා කිරීමට නිර්දේශ කර ඇති ප්‍රදේශ හෝ වෙනත් ආයතනවල ප්‍රධාන සැලසුම් (Master Plans) මඟින් ආරක්ෂා කිරීමට / සංරක්ෂණය කිරීමට හඳුනාගෙන ඇති ප්‍රදේශ සහ (10) වෙනත් වැඩසටහන් යටතේ ආරක්ෂා කිරීම / සංරක්ෂණය කිරීම සඳහා හඳුනාගෙන ඇති ප්‍රදේශ හෝ විද්‍යාත්මක අධ්‍යයන මඟින් හඳුනාගෙන ඇති ප්‍රදේශ.

පාරිසරික සංවේදී ප්‍රදේශ හෝ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ යන යෙදුම කුමක් වුවත්, එම ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීමේ අරමුණු අඩු වැඩි වශයෙන් සමාන වේ. මධ්‍යම පරිසර අධිකාරියට පාරිසරික ආරක්ෂණ ප්‍රදේශවල රෙගුලාසි සහ මාර්ගෝපදේශ බලාත්මක කළ හැකි නමුත් ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ විය නො හැකි ය. පාරිසරික සංවේදී ප්‍රදේශ කළමනාකරණයේ දී එක් නීතියක් පමණක් බොහෝ විට ප්‍රමාණවත් නොවේ. විවිධ නීති රීති ඒකාබද්ධ කර (පනත්, අතුරු ව්‍යවස්ථා ආදිය) සකස් කළ යාන්ත්‍රණයක් සහ හවුල්කාරිත්වය මත පදනම් වූ පාලනයක් සඳහා මෙවලම් සහ මාර්ගෝපදේශ, තිරසාර මූල්‍ය යාන්ත්‍රණයක් සහ පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනා ගැනීම සහ කළමනාකරණය සඳහා සහභාගීත්ව පාලන යාන්ත්‍රණයක් තිබිය යුතු ය.

එසේ වුව ද, පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ පවත්නා ඉඩම් පරිහරණය මෙමඟින් සම්පූර්ණයෙන් ම වෙනස් කිරීමක් සිදු නො වන අතර, ආර්ථික ක්‍රියාකාරකම්වල තිරසාර බව සහතික කරමින් ජෛව විවිධත්ව හිතකාමී පරිසරයක් ඇති කිරීම සඳහා විවිධ ක්‍රමෝපායන් මඟින් ඉඩම් පරිහරණයන් වැඩි දියුණු කරනු ඇත. පාරිසරික සංවේදී ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීමෙන් එම ප්‍රදේශවල අයෝග්‍ය ව්‍යාපෘති / ක්‍රියාකාරකම් සීමා කිරීම නිසා වඩාත් හිතකර ලෙස එම ප්‍රදේශවල ඉඩම් පරිහරණය නියාමනය කිරීමට එය රුකුලක් වේ.

වර්තමාන ප්‍රතිපත්ති සහ ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා වන ප්‍රතිපත්ති අවශ්‍යතා

ජාතික ප්‍රතිපත්ති හා ක්‍රියාකාරී සැලසුම් කිහිපයක් හරහා ශ්‍රී ලංකාව ජෛව විවිධත්ව සංරක්ෂණයට ප්‍රමුඛත්වය දී තිබේ. ප්‍රජාවේ යහපත සඳහා පරිසරය ආරක්ෂා කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා රටේ ව්‍යවස්ථාවෙන් විධිවිධාන සලසා ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නියමයන්ට අනුකූලව රටේ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම සඳහා ආංශික හා අනු ආංශික ප්‍රතිපත්ති කිහිපයක් සංවර්ධනය කර තිබේ. ජෛව විවිධත්ව සංරක්ෂණය කැපී පෙනෙන ලෙස ආවරණය වන ප්‍රධාන ප්‍රතිපත්තිය 2003 ජාතික පාරිසරික ප්‍රතිපත්තිය වන අතර, එම ප්‍රතිපත්තිය යටතේ ජෛව විවිධත්ව සංරක්ෂණය සම්බන්ධයෙන් නිමැවුම්/ප්‍රතිලාභ කිහිපයක් අත්කර ගැනීමට අපේක්ෂා කෙරේ. මෙම නිමැවුම්/ප්‍රතිලාභ වනුයේ; (1) භායනයට පත් පාරිසරික පද්ධති පුනරුත්තාපනය හා රටෙහි ජෛව විවිධත්වය තව දුරටත් භායනය වළකාලීම (2) විවිධ වූ වනාන්තර පද්ධති නිරූපනය කරනු ලබන වන පාරිසරක පද්ධති රටට සරිලන ප්‍රමාණයක් පවත්වා ගැනීම (3) ජෛව විවිධත්වයෙන් පොහොසත් ප්‍රධාන වෙරළබඩ හා සමුද්‍ර පරිසර පද්ධති, සංරක්ෂණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබා දීම. (4) වගා කරනු ලබන විශේෂවල බෝග වන දර්ශ ද ඇතුළත්ව තර්ජනයට ලක්ව ඇති සියලු ම සත්ත්ව හා ශාක විශේෂ සඳහා ස්ථානීය සංරක්ෂණ ක්‍රියාමාර්ග මඟින් ප්‍රමාණවත් ආරක්ෂාවක් සැපයීම. (5) දුර්ලභ හා තර්ජනයට ලක් ව ඇති විශේෂ අභිජනනය/ප්‍රචාරණය දිරිමත් කිරීම, (6) තර්ජනයට ලක් ව ඇති හෝ සීමාකර ඇති විශේෂ එකතු කිරීම තහනම් කරන අතර ම ස්වාභාවික පරිසර පද්ධති වලින් විශේෂ තිරසාර ලෙස එකතු කිරීම දේශීය ප්‍රජාවට ප්‍රතිලාභ ලැබෙන පරිදි නියාමනය කිරීම, (7) වටිනා මෙන් ම තර්ජනයන්ට ලක්ව ඇති ජානමය අගයන් සහිත දේශීය ආහාර බෝග ප්‍රචාරණය සහ වගාව දිරිමත් කිරීම, (8) කෘෂිකාර්මික විශේෂවල සහ ඔවුන්ගේ වන දර්ශයන් ජානමය වැදගත්කම සලකා ක්ෂේත්‍රවල ම සංරක්ෂණය කිරීම, (9) පාරිසරික වශයෙන් හානිදායි, ජාන වෙනස් කළ සහ ආක්‍රමණශීලි හානිකර විශේෂ ශ්‍රී ලංකාවට ඒම වැළැක්වීමට ඵලදායි පියවර ගැනීම, (10) ආක්‍රමණශීලී හා හානිකර ශාක විශේෂ සහ ක්ෂුද්‍ර ජීවීන් රට තුළ ව්‍යාප්ත වීම පාලනය කිරීම, (11) ජාතික ගිණුම්කරණයේ දී ජෛව විවිධත්වයේ වටිනාකම හඳුනාගැනීම, (12) ජෛව විවිධත්ව සංරක්ෂණය හා තිරසාර ලෙස භාවිත කිරීම පිළිබඳ පර්යේෂණ හා අධ්‍යයන සිදු කිරීම, (13) ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය පිළිබඳ සාම්ප්‍රදායික දැනුම ආරක්ෂා කිරීම හා විදේශීය සංවිධාන / පුද්ගලයින් විසින් දේශීය ජෛව විවිධත්වය ප්‍රවේශ වීම මෙරටට සමාන ප්‍රතිලාභ සහතික නො වන්නේ නම් වැළැක්වීම.

කෙසේ වෙතත්, ආරක්ෂිත ප්‍රදේශවලින් පිටත ජෛව විවිධත්ව අතින් වැදගත් ස්ථාන කළමනාකරණය කිරීම සඳහා වන අන්තර් අංශික ප්‍රවේශයකට උපකාරී වන ශක්තිමත් ජාතික යාන්ත්‍රණයක අඩුපාඩුවක් විද්‍යාමාන වේ.

පාරිසරික ආරක්ෂාව සඳහා ජාතික පාරිසරික ප්‍රතිපත්ති හැරුණු විට වෙනත් ජාතික ප්‍රතිපත්ති කිහිපයක් ද තිබේ. ඒවායින් සමහරක් නම්, (1) 1995 ජාතික වන විද්‍යා ප්‍රතිපත්තිය, (2) 2004 ජාතික ජල කළමනාකරණ ප්‍රතිපත්තිය, (3) තෙත්බිම් කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2005, (4) අලි සංරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2006 සහ 2017 සංශෝධනය, (5) ජාතික වනජීවී සංරක්ෂණය පිළිබඳ ප්‍රතිපත්තිය, 2000 (6) ජල ප්‍රභවයන් ඒවායේ පෝෂක ප්‍රදේශ සංරක්ෂණය හා ආරක්ෂා කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, 2014 සහ (7) 2007 ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය. මෙම සියලු ප්‍රතිපත්තීන් සෘජුව හෝ වක්‍රව ජෛව විවිධත්ව සංරක්ෂණය ආවරණය කරනු ලැබේ.

නිසි ඉඩම් පරිහරණය, ආහාර සුරක්ෂිතතාවය, ආර්ථික සංවර්ධනය සහ ඉහළ මට්ටමේ ඉඩම් ඵලදායිතාවය පවත්වා ගැනීම සහතික කිරීම සඳහා ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය ප්‍රතිපත්තිමය රාමුවක් සපයනු ලැබේ. ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය තුළ ප්‍රධාන වශයෙන් ඉඩම් ඵලදායිතාවය ඉලක්ක කර ඇති අතර, ජෛව විවිධත්ව සංරක්ෂණය ද එක් ප්‍රතිපත්තිමය අරමුණක් ලෙස දක්වා ඇත. ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියේ "පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනා ගෙන ඒවා ආරක්ෂා කිරීමට හා සංරක්ෂණය කිරීමට පියවර ගනු ඇත" යන ප්‍රතිපත්තිමය ප්‍රකාශය ඇතුළත් වේ. පාරිසරික සහ ඓතිහාසික සාධක සැලකිල්ලට ගනිමින් සංරක්ෂණය/ ආරක්ෂා කිරීම සඳහා නිර්දේශ කළ හැකි අමතර ප්‍රදේශ ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියේ මහ පෙන්වීම් පදනම්ව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම්කරණයේ දී හඳුනා ගෙන එම ස්ථාන එම සැලසුම් මඟින් ඉදිරිපත් කර ඇත.

ජාතික වන ප්‍රතිපත්තියේ එක් ප්‍රධාන පරමාර්ථයක් වන්නේ ජෛව විවිධත්වය, පස, ජලය, ඓතිහාසික, සංස්කෘතික, ආගමික හා සෞන්දර්යාත්මක අගයන් සැලකිල්ලට ගනිමින් වනාන්තර පසු පරම්පරාව සඳහා සංරක්ෂණය කිරීමය. තෙත්බිම් ප්‍රතිපත්තියේ (2006) අරමුණු අතර තෙත්බිම්වල ජෛව විවිධත්වය හා ඵලදායිතාවය යථා තත්ත්වයට පත් කිරීම හා පවත්වාගෙන යාම අරමුණක් ලෙස දක්වා ඇත. ජෛව විවධත්වය, පාරිසරික පද්ධතින්, ආර්ථිකය සහ සමාජය කෙරෙහි ආක්‍රමණශීලී ආගන්තුක විශේෂ පැතිරීම නිසා වන අයහපත් බලපෑම අවම කර තිරසර ආර්ථික සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා ආක්‍රමණශීලී ආගන්තුක විශේෂ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2016) අරමුණු කර ඇත.

ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා විවිධ අංශ හා එම අංශ අතර ක්‍රියාකාරකම් රාශියක් සංවර්ධනය කර ඇත. උදාහරණයක් ලෙස ''හරිත ලංකා'' වැඩසටහන තුලින් සංරක්ෂණය අරමුණු කර ගත් සුවිශේෂී ක්‍රියාකාරකම් කිහිපයක් හඳුනාගෙන ඇත. එසේ ම, 1999 ජාතික ජෛව විවිධත්ව උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලැස්ම තුලින් සංරක්ෂණය සඳහා ඉහළ ප්‍රමුඛතා ප්‍රදේශ සලකා බලා ඇත. තව ද, ජාතික සංරක්ෂණ උපාය මාර්ග, ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම, මහා වන සැලැස්ම, ජාතික වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම යන සැලසුම් ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා වූ ප්‍රතිපත්තිමය මෙවලම් වේ.

ජෛව විවිධත්වය ඇතුළුව භූමිය , ජලය සහ සාගර සම්පත් කළමනාකරණයට අදාළ නීති ගණනාවක් තිබේ. උදාහරණයක් ලෙස මෙයට පෙර සඳහන් කළ පරිදි ජාතික පාරිසරික පනතෙහි පාරිසරික සංවේදී ප්‍රදේශවලට සමාන පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ (EPAs) ප්‍රකාශයට පත් කිරීමේ විධිවිධාන සලසා ඇත. 1907 අංක 16 වන වන ආඥා පනත, 1937 අංක 2 දරණ වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ ආඥා පනත, 1951 අංක 09 දරණ ගස් කපා හෙලීමේ පාලක පනත, 1988 අංක 3 දරන ජාතික උරුම හා වන භූමි පනත, 1996 අංක 2 දරණ ධීවර හා ජලජ සම්පත් පනත යන පනත් ජෛව විවිධත්වය ඇතුළු ස්වාභාවික සම්පත් කළමනාකරණය කිරීම සඳහා ඇති පනත් කිහිපයකි. මෙම ප්‍රතිපත්ති හා නීති බොහොමයක් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත්තේ රජයේ ඉඩම් කෙරෙහි මිස පෞද්ගලික ඉඩම් කෙරෙහි නොවේ. එබැවින් පෞද්ගලික ඉඩම්වල ද ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ඵලදායි යාන්ත්‍රණයක් සකස් කිරීම අවශ්‍ය වේ. එවැනි අවස්ථාවල දී සැලසුම් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ජනතාවගේ ක්‍රියාකාරී සහභාගීත්වය ලබා ගැනීම සඳහා යාන්ත්‍රණයක් සකස් කළ යුතු වේ.

දැනට පවතින බොහෝ ප්‍රතිපත්ති සහ නීති ප්‍රධාන වශයෙන් එක් එක් අංශවල පවතින ගැටලු සඳහා විසඳුම් ලබා දෙන නමුත් විශේෂයෙන් ජෛව විවිධත්ව සංරක්ෂණය තහවුරු කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් කෙරෙහි වැඩි අවධානයක් යොමු කර නැත. මෙය පවතින

ප්‍රතිපත්තිවල ඇති එක් දුර්වලතාවයක් ලෙස දිස්වේ. එබැවින්, ජෛව විවිධත්ව සංරක්ෂණය පිළිබඳ ප්‍රතිපත්තිමය හිඩැස් අවම කිරීම සඳහා ප්‍රතිපත්ති සහ නීති සම්පාදනය / සංශෝධන සඳහා සහාය වීමට මෙම ව්‍යාපෘතියේ සංරචකයක් ඇතුළත් කර ඇත.

මෙම ඉඩම් පරිහරණ සැලැස්මේ තීරණ සංවර්ධනය කිරීම සඳහා පවත්නා ආඥා පනත් සහ පනත්වල ප්‍රතිපාදනයන් විශේෂයෙන් ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත, වන සත්ත්ව හා වෘකෂලතා ආඥා පනත, වෙරළ සංරක්ෂණ පනත යනාදී පනත් ප්‍රධාන වශයෙන් භාවිත කරන ලදී.

2. කලා ඔයා ද්‍රෝණියේ ඉඩම් පරිහරණ සැලැස්මේ අරමුණු

ප්‍රධාන පරමාර්ථය:

ප්‍රවේශයන් සත්‍යාපනය කිරීම සඳහා ආකෘතියක් ලෙස සහ උගත් පාඩම් වාර්තාගත කිරීම සඳහා ජෛව විවිධත්වය ඒකාබද්ධ කළ ඉඩම් පරිහරණ සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම.

සුවිශේෂී අරමුණු:

1. ජෛව විවධත්ව සංරක්ෂණය සඳහා කලා ඔය ද්‍රෝණියේ ආරක්ෂිත ප්‍රදේශවලින් පිටත පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනා ගැනීම.

2. ගංගා ද්‍රෝණි මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම්කරණයේ දී ජෛව විවිධත්ව සංරක්ෂණය ඒකාබද්ධ කිරීම සඳහා ඇති අවස්ථා හඳුනා ගැනීම.

3. කලා ඔය ද්‍රෝණියේ ආරක්ෂිත ප්‍රදේශවලින් පිටත ජෛව විවිධත්වය සංරක්ෂණය හා වැඩි දියුණු කිරීමේ අවස්ථා හඳුනා ගැනීම.

4. කලා ඔයා ද්‍රෝණියේ ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා ඉඩම් පරිහරණය සැලසුම් කිරීම දී භාවිත කළ හැකි සිතියම් සංවර්ධනය කිරීම.

5. උපායමාර්ගික ඉඩම් පරිහරණ සැලසුම් මඟින් ආරක්ෂිත ප්‍රදේශ තව දුරටත් එකිනෙක සම්බන්ධ කළ හැකි විභවතාවයන් සහිත ප්‍රදේශ හඳුනා ගැනීම.

6. කලා ඔය ද්‍රෝණියේ ප්‍රජාවගේ මානව, පාරිසරික හා ආර්ථික යහපැවැත්ම සහතික කිරීම සඳහා ප්‍රජා මූලික ජෛව විවිධත්ව යෝජනා ක්‍රම සඳහා ප්‍රදේශ හඳුනා ගැනීම.
7. කලා ඔයේ අඛණ්ඩ ගැලීම තහවුරු කිරීම සඳහා වන ප්‍රවේශය තුලින් ගොඩබිම හා මුහුදු තීරය අතර සම්බන්ධය පවත්වා ගැනීම.

3. කලා ඔය ද්‍රෝණිය


3.1 පරිපාලන කොට්ඨාස

කලා ඔයා ගංගා ද්‍රෝණියේ මුළු භූමි ප්‍රමාණය දළ වශයෙන් හෙක්ටයාර 284,691 (වර්ග කි.මී. 2847) කි. ද්‍රෝණිය ප්‍රධාන වශයෙන් අනුරාධපුර සහ පුත්තලම පරිපාලන දිස්ත්‍රික්ක දෙකට අයත් වේ. කෙසේ වෙතත්, ද්‍රෝණියේ මායිම සැලකූ විට දකුණු හා ගිනිකොන දෙසින් ද්‍රෝණියේ කුඩා කොටසක් මාතලේ සහ කුරුණෑගල දිස්ත්‍රික්කවලට ද ඇතුළත්ව ඇත. (සිතියම් අංක 1).

ද්‍රෝණිය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 18 ක් දක්නට ලැබෙන නමුත් එයින් කොට්ඨාස තුනක් පමණක් සම්පූර්ණ වශයෙන් ද්‍රෝණිය තුළ පිහිටා ඇති අතර, ඉතිරි කොට්ඨාස අර්ධ වශයෙන් පමණක් ද්‍රෝණිය තුළට ඇතුළත් වේ. ද්‍රෝණියේ දළ වශයෙන් ග්‍රාම නිලධාරී කොට්ඨාස 524 ක් පිහිටා ඇති නමුත්, සමහර කොට්ඨාස සම්පූර්ණයෙන් ම ද්‍රෝණිය තුළ පිහිටන අතර, ඉතිරි කොට්ඨාස අර්ධ වශයෙන් පිහිටයි.

සැලසුම් ප්‍රදේශය

ස්වාභාවික සීමාවන් මත පදනම්ව ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම එම සැලසුම් වඩාත් ඵලදායි වීමට හේතු වන බව පිළිබඳව විවාදයක් නොමැත. එබැවින්, ද්‍රෝණියේ ඉඩම් පරිහරණ සැලසුම් කිරීමේ අභ්‍යාසය පරිපාලනමය සීමාවන් සලකා බැලීමට වඩා ස්වාභාවික සීමාවන් සැලකිල්ලට ගෙන සිදු කරන ලදී. කෙසේ වෙතත්, ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම පහසු කිරීම සඳහා පරිපාලන සීමාවන් සලකා බැලිය හැකි වේ.



සිතියම් අංක 1: කලා ඔය ද්‍රෝණියට අයත් පරිපාලන මායිම්

3.2 කලා ඔය ගංගා ද්‍රෝණියේ උප ජල පෝෂක ප්‍රදේශ


කලා ඔය ද්‍රෝණියේ මුළු වපසරිය දල වශයෙන් වර්ග කිලෝ මීටර 2847 ක් වන අතර, එය උප ජල පෝෂක ප්‍රදේශ 14 ක් පුරා විසිරි ඇත. වගු අංක 1 මඟින් එම උප ජල පෝෂකවල දල වපසරියත්, සිතියම් අංක 2 මඟින් ඒවායේ පිහිටීමත් දක්වා ඇත.

කලා ඔය ද්‍රෝණිය වටා වෙනත් ගංගා ද්‍රෝණි හයක් පිහිටා ඇති අතර, ඒවා උතුරින් මෝදරගම් ආරු, මල්වතු ඔය සහ යාන් ඔය ද, නැගෙනහිරින් මහවැලි ගඟ ද , දකුණින් දැදුරු ඔය සහ මී ඔය ද වශයෙන් හඳුනාගත හැකි ය.

වගු අංක 1. කලා ඔය ද්‍රෝණියේ උප ජලපෝෂක ප්‍රදේශ සහ ඒවායේ වපසරියන්

	උප ජල පෝෂකයේ නම	දල වපසරිය **(sq.km.)**
1	හැවන්හෙල	261
2	දඹුලු ඔය	212
3	මිරිස් ගෝනියා ඔය	282
4	ඉහළ කලා ඔය	75
5	ඉහළ මධ්‍යම කලා ඔය	183
6	කළන්කුට්ටිය ඇල	118
7	සියඹලන්ගමුව ඔය	325
8	ඉහළ රාජංගනය	196
9	අංගමුව වැව	160
10	පහළ රාජංගනය	153
11	පහළ මාරගහවැව	211
12	පහළ මධ්‍යම කලා ඔය	235
13	පහළ උත්තුමාඩු ආරු	234
14	පහළ කලා ඔය	181
	එකතුව	2847

Source: Vitharana, (2011)



සිතියම් අංක 2: කලා ඔය ද්‍රෝණියේ උප ජල පෝෂක ප්‍රදේශ


3.3 භෞතික පරිසරය

3.3.1 භූ විෂමතාවය


කලා ඔය ගංගා ද්‍රෝණියේ බොහෝ ප්‍රදේශ සමතලා සහ රැලි සහිත භූ විශමතාවයකින් යුතු වේ. (සිතියම් අංක 3 සහ වගු අංක 2) එසේ වුව ද, මුහුදු මට්ටමේ සිට මීටර් 800 දක්වා පමණ උස් වූ ශේෂ කඳු දක්නට ලැබේ (සිතියම් අංක 4). අනෙකුත් පාංශු සීමාකාරී සාධක සැලකිල්ලට නොගෙන භූමි ශක්‍යතාවය සලකා බැලූ විට ද්‍රෝණියේ බොහෝ ප්‍රදේශ ඉහළ කෘෂිකාර්මික ශක්‍යතාවයකින් යුක්ත බව පෙනේ.

වගු අංක 2: කලා ඔය ද්‍රෝණියේ බෑවුම් කලාප සහ එම කාණ්ඩවල දල වපසරිය මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස.

බෑවුම් කලාපය (%)	වපසරියේ ප්‍රතිශතය(%)
0-2	71
2-8	26
8-16	2.8
16-30	0.5
30 ට වැඩි	0



සිතියම් අංක 3: කලා ඔය ද්‍රෝණියේ බැවුම් කලාප



සිතියම් අංක 4: කලා ඔය ද්‍රෝණියේ උන්නතාංශ කලාප

3.3.2 පස

කලා ඔය ද්‍රෝණියේ පාංශු කාණ්ඩ හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකාව සඳහා පිළියෙළ කර ඇති මහා පාංශු ගණ සිතියම භාවිත කරන ලදී[6]. (සිතියම් අංක 5). මෙම සිතියමේ පරිමාණය විශාල බැවින් මෙමඟින් ප්‍රදේශයේ පස් පිළිබඳ දල අදහසක් පමණක් ලබා දේ. එම සිතියම අනුව බොහෝ ප්‍රදේශයක උස් බිම්වල රතු දුඹුරු පස් දක්නට ලැබෙන අතර, එම භූ දර්ශනයේ පහත් තැනිතලා ප්‍රදේශවල අව හියුමික ග්ලේ පස දක්නට ලැබේ (වගු අංක 3). මෙම පස ජලය ලබා ගැනීමේ හැකියාව මත ගොඩ බෝග සහ වී වගාවට සුදුසු වේ.

පාංශු ශ්‍රේණි වර්ගීකරණයට අනුව ද්‍රෝණිය තුළ පාංශු ශ්‍රේණි විස්සක් පමණ දක්නට ලැබේ[7]. (සිතියම් අංක. 6). විශාල ප්‍රදේශයකට මැදවච්චිය, රනොරාව, ඇලයාපත්තුව, භූරත්ගම, නවගත්තේගම ශ්‍රේණිය අයත් වේ (වගු අංක 4).




Fig. 5. Great soil groups and their distribution in the Kala Oya River Basin(adapted from Alwis and Panabokke, 1972).

සිතියම් අංක 5: කලා ඔය ද්‍රෝණියේ ප්‍රධාන පාංශු කාණ්ඩ

සාමාන්‍යයෙන් වියළි කලාපීය පස සැලකූ විට එහි ලක්ෂණ හා රූපාකාරයේ විචල්‍යත්වය තෙත් සහ අතරමැදි කලාප වල පසෙහි විචල්‍යත්වයට වඩා අඩුවේ[8]. වියළි කලාපයේ පවතින දිගුකාලීන වියලි කාලය සහ අඩු වර්ෂාපතනය නිසා පසේ අනෙකුත් සිමාකාරී සාධකයන්ට වඩා තෙතමනය සීමා වීම වඩාත් ඉස්මතුව පෙනේ. වියළි කලාපයේ බොහෝ පාංශු ශ්‍රේණීන් ඉහළ කෘෂිකාර්මික යෝග්‍යතාවයක් පෙන්වයි. එසේ වුවද, වියළි කලාපයේ සමහර ප්‍රදේශ වල පසේ යටි ස්ථරයේ දක්නට ලැබෙන බොරළු තට්ටුව බෝග වල මුල් වර්ධනයට බාධාවක් වීමට ඉඩ ඇත. තවද, සමහර ප්‍රදේශ වල පාංශු බාදන තත්ත්වයන්, ලවනතාවය, දුර්වල ජල වහනය නිසා ඇතිවන පසේ වාතනයේ අඩුකම යනාදී සීමාකාරී තත්ත්වයන් ද නිරීක්ෂණය වේ.


[6] (Alwis and Panabokke, 1972)
[7] (Mapa et al., 2010)
[8] (Kumaragamge and Kendaragama, 2010)

සාමාන්‍යයෙන් පසේ තෙතමනය අඩු කම වියළි කලාපයේ වාරි පහසුකම් නොමැති බොහෝ ප්‍රදේශවල දක්නට ලැබේ.

පාංශු පෝෂක කළමනාකරණය විශේෂයෙන් කාබනික ද්‍රව්‍ය කළමනාකරණය වියළි කලාපයට ඉතා වැදගත් වේ. පාංශු බාදනය අවම කිරීමට, පාංශු තෙතමන සංරක්ෂණයට සහ පසේ සාරවත්භාවය වැඩි දියුණු කිරීමට කාබනික ද්‍රව්‍ය පසට එක් කිරීම, වසුන් භාවිතය, අවම බිම් සැකසුම් ක්‍රම හඳුන්වා දීම සහ සෙවන කළමනාකරණය යනාදී ක්‍රම අවශ්‍ය වේ.

වගු අංක 3: කලා ඔය ද්‍රෝණියට අයත් ප්‍රධාන පාංශු කාණ්ඩ

Soil Group	Extent as a percentage (%)
Reddish Brown Earth & Low Humic Glay Soil; undulating terrain	56
Reddish Brown Earth with high amount of gravel in sub soil &Low HumicGlay Soil; undulating terrain	2
Reddish Brown Earth with moderate amount of gravel in sub soil & Low Humic Glay Soil; undulating terrain	1
Reddish Brown Earth& Immature Brown Loam; rolling hilly and steep terrain	1
Red Yellow Latosols; flat to slightly undulating terrain	4
Alluvial soils of variable drainage and texture; flat terrain	11
Rock knob plain	14
Eroded land	5
Erosional remnants	4
Water area	2
Total	100



සිතියම් අංක 6: කලා ඔය ද්‍රෝණියේ දක්නට ලැබෙන පාංශු ශ්‍රේණි

වගු අංක 4: කලා ඔය ද්‍රෝණියේ දක්නට ලැබෙන පාංශු ශ්‍රේණි හා ඒවායේ භූමි ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස

Soil series	Extent (%)
Aluthwewa-Hurathgama association	8
Aruvi series associated with undifferentiated soils of alluvial origin with variable texture and drainage	5
Kiruwana –Kuliyapitiya- Kurunegala – Batalagoda Association	1
Kiruwana _Malsiripura Association	2
Madawachchiya-Aluthweva-Hurathgama Association with Lithosols derived from quartzite	3
Medawachchiya-Aluthweva-Divulweva-Hurathgama-Kahatagasdigiliya Association	10
Medawachchiya-ranorawa-Elayapaththuwa-Hurathgama-Nawagaththegama Association	32
Negombo, Puttalam Association	0.3
Regosols	2
Siyabala, Puttalam Association	0.4
TonigalaAnamaduwaNawagaththegama Complex	3
UkuwelaHunugalaMatale Complex	1
UkuwelaHunugalaMatale Association	4
Undifferentiated soils of alluvial origin with variable texture and drainage	2
WillpattuGamburaMavilluBorupana Association	4
Erosional remnants	9
Erosional remnants steep Rocklands and lithosols	1
Rock Knob Plains	13

3.3.3 දේශගුණය

වර්ෂාපතනය

කලා ඔය ද්‍රෝණිය ප්‍රධාන වශයෙන් වියළි කලාපය තුළ පිහිටා ඇති අතර, ද්‍රෝණියේ ඉහළ කෙළවරේ සුළු ප්‍රදේශයක් අතර මැදි කලාපයට අයත් වේ. සාමාන්‍යයෙන් වියළි කලාපයේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 1750 ට වඩා අඩු වන අතර, මැයි සිට සැප්තැම්බර් දක්වා වන වියළි කාලයක් දක්නට ලැබේ. ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ප්‍රධාන කාල සීමාවන් හතරක් දක්නට ලැබේ[9].

- මාර්තු සිට අප්‍රේල් – පළමු අන්තර් මෝසම් වර්ෂාව
- මැයි සිට සැප්තැම්බර් – නිරිත දිග මෝසම් වර්ෂාව
- ඔක්තෝබර් සිට නොවැම්බර් – දෙවන අන්තර් මෝසම් වර්ෂාව
- නොවැම්බර් සිට පෙබරවාරි – ඊසාන දිග මෝසම් වර්ෂාව

ප්‍රධාන වශයෙන් අන්තර් මෝසම් සහ ඊසාන දිග මෝසම් මඟින් වියලි කලාපයට වර්ෂාව ලැබේ. මෙම වර්ෂාපතන රටාව අනුව වියළි කලාපයේ වගාවන් සම්ප්‍රදායිකව යල සහ මහ කන්න දෙකට සීමාවී ඇත.

[9]Punyawardana, B.V.R. 2010.Climate of the Dry Zone of Sri Lanka. Soils of the Dry Zone of Sri Lanka.R.B.Mapa, S. Somasiri, A.R.Dasnayaka (Ed.).Morphology, Characterization and Classification.Soil Sci. Soc. Sri Lanka.


උෂ්ණත්වය

මධ්‍ය වාර්ෂික උෂ්ණත්වය වර්ෂය පුරා විචල්‍යත්වයක් පෙන්වන අතර, උපරිම හා අවම උෂ්ණත්ව අගයන් දෙකෙහි ම අවම අගය ඊසාන දිග මෝසම් කාලය වන නොවැම්බර් සිට පෙබරවාරි දක්වා කාල සීමාවේදී දක්නට ලැබේ. මැයි සිට සැප්තැම්බර් කාලයේ දී උෂ්ණත්වය 38 ^{0}C පමණ දක්වා ඉහළ යාම සිදුවේ[10].

ස්වභාවික වෘක්ෂලතා ද ඇතුළුව අනෙකුත් ඉඩම් පරිහරණයන් සහ භූමි ආවරණයන් ප්‍රධාන වශයෙන් මෙම ප්‍රදේශයේ පවතින දේශගුණය (වර්ෂාපතනය, උෂ්ණත්වය, හිරු එළිය ලැබෙන පැය ගණන, සුළඟ, වාෂ්පීකරණය, සාපේක්ෂ ආර්ද්‍රතාවය යනාදිය) මත තීරණය වේ. එබැවින්, සුවිශේෂී පරිසරයක් හා බැඳුණු ජෛව විවිධත්වයක් මෙම ද්‍රෝණිය තුළ නිරීක්ෂණය කළ හැකි වේ.

කෘෂි-පාරිසරික තත්ත්වය

කලා ඔය ද්‍රෝණිය තුළ කෘෂි පාරිසරික කලාප හතක් දක්නට ලැබේ (සිතියම් අංක.7). ද්‍රෝණියේ වැඩි බිම් ප්‍රමාණයක් පහත රට වියලි කලාපයට අයත් වේ (DL1 and DL3). ඉතිරි ප්‍රදේශය පහත රට අතරමැදි කලාපයට හා මැදරට අතරමැදි කලාපයට අයත් වේ. ද්‍රෝණියේ පහළ කොටස වියලි වන අතර ඉහළ කොටස සාපේක්ෂව තෙත් ස්වභාවයකින් යුතු වේ.



සිතියම් අංක 7. කලා ඔය ද්‍රෝණිය තුළ කෘෂි පාරිසරික කලාප

[10]Punyawardana, B.V.R. 2010.Climate of the Dry Zone of Sri Lanka. Soils of the Dry Zone of Sri Lanka.R.B.Mapa, S. Somasiri, A.R.Dasnayaka (Ed.).Morphology, Characterization and Classification.Soil Sci. Soc. Sri Lanka.

3.3.4 ජලය


ද්‍රෝණිය තුළ කලා ඔය සහ එහි අතු ගංගා, ජලාශ, ග්‍රාමීය කුඩා වැව් ඇතුළු ව ජල දේහ රාශියක් පිහිටා ඇත. මෙම ජල දේහ සියල්ලට ම අයත් වන භූමි ප්‍රමාණය දල වශයෙන් හෙක්ටයාර 21766 පමණ වන අතර, එම ජල දේහ සිතියම් අංක 8 හි දක්වා ඇත. ද්‍රෝණිය තුළ අත් හරින ලද වැව්ද ඇතුළු ව කුඩා වැව් 600 ක් පමණ දක්නට ලැබෙන අතර, ඒවා මඟින් වාරි පහසුකම් සැපයීමට අමතරව ප්‍රජාව සඳහා විවිධ පරිසරාත්මක සේවාවන් ලබා දීමක් සිදුවේ. එසේ ම සමහර වැව් මහවැලි යෝජනා ක්‍රමය යටතේ පෝෂණය වේ. සමහර කුඩා වැව් එකතුව එල්ලංගා පද්ධතීන් ගොඩ නඟා ඇති බැවින් එතුලින් විවිධ වූ ශාක හා සත්ත්ව විශේෂ සඳහා සුවිශේෂී පරිසරයන් නිර්මාණය කර ඇත. කලා ඔය ද්‍රෝණියේ අඩක් පමණ උතුරු මැද පළාතට අයත් වන අතර, එම පළාතේ එල්ලංගා පද්ධතීන් 457 ක් පමණ පිහිටා ඇත[21].

කලා ඔය ද්‍රෝණියේ පවත්නා පස සහ වායව පරිසරය එකතුව අද්විතීය පරිසරයක් නිර්මාණය කර ඇති අතර, එය ඉහළ ජෛව විවිධත්ව අගයක් සහිත සුවිශේෂී වෘක්ෂලතාවල පැවැත්ම සඳහා උපකාරී වේ. කෙසේ වුව ද, ආරක්ෂිත ප්‍රදේශවලට පිටතින් පිහිටි ප්‍රාථමික වෘක්ෂලතා වැස්ම විවිධ මානව ක්‍රියාකාරකම් නිසා විශාල වශයෙන් විනාශ වී ඇත. එබැවින්, පාරිසරික සංවේදී කලාප සංකල්පය තුලින් සුවිශේෂී පරිසර පද්ධතීන්ගේ පැවැත්ම තහවුරු කිරීම ඉතා වැදගත් වේ.



ඡායාරූප 1. කලා වැවේ දර්ශනයක්

[21]Panabokke, C.R., Sakthivadivel R., Weerasinghe A.D.(2002), Small Tanks in Sri Lanka: Evolution, Present Status and Issues.




සිතියම් අංක 8. කලා ඔය ද්‍රෝණිය තුළ ඇති ජල දේහයන්

3.4 ජනගහනය

ජනගහන දත්ත පරිපාලන මායිම් පදනම්ව තිබෙන බැවින් ද්‍රෝණිය පදනම් කර ජනගහන තොරතුරු ලබා දීම දුෂ්කර වේ. එසේ වුව ද, ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් තිබෙන ජනගහන තොරතුරු භාවිත කර ජන ඝනත්ව සිතියමක් සකස් කරන ලද අතර, එය සිතියම් අංක 9 හි දක්වා ඇත.

ද්‍රෝණියේ ඉහළ සහ පහළ ප්‍රදේශ ආශ්‍රිතව ආරක්ෂිත ප්‍රදේශ පිහිටා ඇති බැවින්, එම ප්‍රදේශවල අඩු ජන ඝනත්වයක් පෙන්වයි. (වර්ග කිලෝමීටරයට පුද්ගලයන් 2-280 අතර ප්‍රමාණයක්) වැඩිම ජන ඝනත්වයක් (4000-9000) ග්‍රාම නිලධාරී කොට්ඨාස අඩු ප්‍රමාණයක ඇති අතර, ඒවා නාගරික ප්‍රදේශවල පිහිටා ඇත. ජන ඝනත්වය වැඩි ග්‍රාම නිලධාරී කොට්ඨාස වැඩි වශයෙන් නේවාසික කලාප හා වගා කටයුතු සිදු කරනු ලබන ද්‍රෝණියේ මධ්‍ය ප්‍රදේශයේ පිහිටා ඇත.



සිතියම් අංක 9 කලා ඔය ද්‍රෝණියේ ජන ඝනත්වය

3.5 ඉඩම් පරිහරණය


ඉඩම් පරිහරණය (2019)

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව 2019 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කළ ඉඩම් පරිහරණ හා භූමි ආවරණය සිතියම් අංක 10 හි දක්වා ඇති අතර, ඒවායේ දල වපසරියන් 5 වගුවේ දක්වා ඇත. ද්‍රෝණියේ ප්‍රධාන භූමි ආවරණය වනාන්තර වන අතර, එය මුළු භූමි ප්‍රමාණයෙන් 38% ක් හෙවත් හෙක්ටයාර 107721 පමණ ප්‍රමාණයක් ආවරණය කරයි. ගෙවතු ඇතුළුව කෘෂිකාර්මික බිම් හෙක්ටයාර 97282 පමණ වන අතර එය සමස්ත භූමියෙන් 34% ක් පමණ වේ. නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශ ඇතුළත් ගොඩනැගිලි සහිත ප්‍රදේශ හෙක්ටයාර 53000 ක් පමණ වේ. ඉතිරි බිම් ප්‍රදේශය තුළ තෙත් බිම්, වැලි සහිත ප්‍රදේශ, කඳු, ජලාශ, ගංගා ඇල දොල හා හිස් බිම් පිහිටා ඇත.

වගු අංක 5. කලා ඔය ගංගා ද්‍රෝණියේ ප්‍රධාන භූමි පරිහරණයන්/භූමි ආවරණයන් සහ ඒවායේ දල වපසරියන්.

ප්‍රධාන භූමි පරිහරණයන්/භූමි ආවරණයන්	වපසරිය (ha)	ප්‍රතිශතය (%)
ගෙවතු ඇතුළු කෘෂිකාර්මික බිම්	97282.10	34.2
ගොඩනැගිලි සහිත ප්‍රදේශ	53111.02	18.7
වනාන්තර	107720.56	37.8
තෙත් බිම්	1733.33	0.6
ගල්	2335.44	0.8
වැලි ප්‍රදේශ	4.47	0.001
ඇල, දොළ ගංගා සහ වැව්	21766.44	7.6
හිස් භූමි	738.96	0.3
එකතුව	284692.33	100

සිතියම්වල සුචියන්ගේ සහ පරිමානයන්ගේ ඇති වෙනස්කම් නිසා මෙයට පෙර පැවති ඉඩම් පරිහරණ රටාවන් හා එවකට ඒ ඒ කාණ්ඩ යටතේ පැවති භූමි ප්‍රමාණයන් වර්තමාන තත්ත්වය සමඟ සංසන්දනය කිරීම දුෂ්කර වේ.



සිතියම් අංක .10 කලා ඔය ද්‍රෝණියේ භූමි පරිහරණය සහ භූමි ආවරණය (2019)

3.6 ද්‍රෝණිය තුළ ඇති පරිසර පද්ධති හා ජෛව විවිධත්වය

ජෛව විවධත්වය සඳහා වන සරල නිර්වචනය වනුයේ පෘථිවිය මත හඳුනාගත හැකි විවිධ ආකාර ජීවීන් සමුහයක් යන්න වේ. එය වඩාත් විස්තරාත්මකව නිර්වචනය කළ විට සියලු ගොඩ බිම්, සාගර හා ජලජ පරිසර පද්ධති සහ සංකීර්ණ පාරිසරික පද්ධති ද ඇතුළත්ව සහ ඒවායේ කොටසක් ලෙස පවතින විවිධාකාර වූ ජීවීන්ගේ විශේෂ තුළ හා විශේෂ අතර මෙන්ම පරිසර පද්ධති අතර වූ විවිධත්වය වේ[22].

මෙම ප්‍රදේශය තුළ ස්වභාවික හා මිනිසා විසින් ගොඩ නැගූ පරිසර පද්ධති කිහිපයක් දක්නට ලැබේ. ද්‍රෝණිය තුළ දක්නට ලැබෙන පරිසර පද්ධති සිතියම් අංක 11 මඟින් පෙන්වා දී ඇත. මෙම ද්‍රෝණියේ ප්‍රධාන පරිසර පද්ධති වනුයේ; (1) කෘෂිකාර්මික පරිසර පද්ධතිය, (2) වනාන්තර පරිසර පද්ධතිය, (3) ගංගා ආශ්‍රිත පරිසර පද්ධතිය, (4) තෙත් බිම් පරිසර පද්ධතිය, (5) ජලජ පරිසර පද්ධතිය සහ (6) වෙරළබඩ පරිසර පද්ධතිය යන පරිසර පද්ධතීන් ය. මෙම පරිසර පද්ධතීන් විශේෂිත ශාක හා සත්ත්ව විශේෂ සඳහා වාසස්ථාන සපයනු ලැබේ. එසේ ම, සමහර පරිසර පද්ධති වඩාත් විවිධත්වයකින් සහ විශේෂ සුලභාතවය අතින් පොහොසත් වන අතර ම, සමහර පද්ධතීන් වඩාත් සජාතියත්වයක් පෙන්වයි. සමහර පරිසර පද්ධති, වඩාත් වැදගත් පාරිසරික පද්ධති ක්‍රියාවලි සහ එම පද්ධති පිහිටි ස්ථාන පදනම්ව සමහර පාරිසරික සේවා සඳහා උපකාරී වේ. සාමාන්‍යයෙන් බොහෝ පරිසර සතුව ඉතා ඉහළ මට්ටමේ ඒකදේශිකතාවයක් දක්නට ලැබෙන අතර, එම නිසා එවැනි පද්ධති වෙනස් කළ හොත් හෝ හායනය වීමට ලක් වුව හොත් ඒවා නැවත ප්‍රතිස්ථාපනය හෝ නැවත සකස් කිරීම කළ නොහැකි වේ.

වනාන්තර පරිසර පද්ධති වැඩි වශයෙන් මිශ්‍ර සදාහරිත වනාන්තර වලින් යුක්ත වන අතර, ශ්‍රී ලංකාවේ මෙම වනාන්තර කාණ්ඩය තුළ සත්ත්ව විශේෂ 136 ක් හා ශාක විශේෂ 100 ක් වාර්තා වී ඇත. එම ශාක විශේෂ අතුරින් 18% ක් ඒකදේශීය වේ[23]. ද්‍රෝණිය තුළ කුඩා වැව් ඇතුළු ව ජල දේහ රාශියක් පිහිටා ඇති හෙයින් මේවා ආශ්‍රිතව විවිධ වූ සත්ත්ව හා ශාක විශේෂ දක්නට ලැබේ.

විවිධ පාරිසරික පද්ධති හා සතුව සුවිශේෂී ලක්ෂණ දක්නට ලැබෙන බැවින් ඒවා සුවිශේෂී පාරිසරික සේවා සැපයීමක් සිදු කරයි. කලා ඔය ද්‍රෝණියේ පාරිසරික සේවාවන්හි වාර්ෂික වටිනාකම රුපියල් මිලියන 23,500 ක් පමණ වේ. මෙහිදී කාබන් අගය තුලින් ඉහළ ම ආර්ථික වටිනාකම ලබා දේ (77%). ඇස්තමේන්තුගත අගය අනුව එය රටෙහි දල දේශීය නිෂ්පාදනයෙන් 1.16% ක් නියෝජනය කරන අතර (2004) කෘෂිකාර්මික අංශය සැලකූ විට එය 7.33% ක් වේ. මෙය ද්‍රෝණිය තුළ ඇති ආර්ථික විභවයේ වැදගත්කම විදහා දැක්වීමක් සිදු කරයි.[24].

මෙම භෞමික පරිසර පද්ධති අමතරව ජෛව විවධත්ව සංරක්ෂණය සැලකූ විට ද්‍රෝණිය කෙළවර පිහිටා ඇති සමුද්‍රීය පරිසර පද්ධතිය ද ඉතා වැදගත් වේ. මෙම පරිසර පද්ධතිය වඩාත් වැදගත් වීමට හේතුවක් වී ඇත්තේ ශ්‍රී ලංකාවේ විශාලතම සාගර ආරක්ෂිත ප්‍රදේශය වන සාගර

[22]The Convention on Biological Diversity. 1992.

[23] Project Inception Report, Enhancing Biodiversity Conservation and Sustenance of Ecosystem Services in ESAs Project.

[24]Gunawardena, U.A.D.P. (2009). Valuation of Ecosystem Services of Kala Oya River Basin: Implications for River Basin Management. Vidyodaya Journal of Humanities and Social Sciences. pp 239 - 266

කොරල් පර අභයභූමිය පිහිටා තිබීම ය. මෙය 1992 දී වනසත්ත්ව හා ශාක්ෂලතා ආඥා පනත යටතේ ප්‍රකාශයට පත් කර ඇත. මෙම ප්‍රදේශය වර්ග කිලෝ මීටර 306 පමණ විශාලත්වයකින් යුක්ත වන අතර, කල්පිටිය අර්ධද්වීපයට බටහිරින් මුහුදේ වයඹ දිශාවට වන්නට පිහිටා ඇත.


බොහෝ සාගර පරිසර පද්ධතීන් (කොරල් පර, කඩොලාන, මුහුදු තෘණ සහිත සාගර පත්ල, වැලි කඳු, හා විශාල කළපු) එක ම තැනක දක්නට ලැබෙන ශ්‍රී ලංකාවේ ඇති එකම ස්ථානය මෙය වේ[25]. එසේ ම කොරල් පරයේ ජෛව විවිධත්වය පුත්තලම කළපුව ඇතුළු ඒ වටා පිහිටි පරිසරය හා බැඳේ.

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන කාර්යාංශය විසින් 2013-2015 කාල සීමාවේදී කරන ලද පර්යේෂණයන්ට අනුව මෙම කොරල් පරයේ විනාශ වී තිබූ ප්‍රදේශයට සාපේක්ෂව තද කොරල් යහපත් තත්ත්වයක තිබූ නමුත් සජීවී කොරල් ආවරණය 10% අඩු වී තිබුණි. එසේ ම කැඩුණු කොරල් හා භෞතිකව සිදුව තිබූ හානි 2014 සිට 2015 දක්වා වැඩි වී ඇත[26]. තව ද, විනාශකාරී මසුන් ඇල්ලීමේ ක්‍රම, කොරල් පරයේ සීමාවන් සලකුණු නො කර තිබීම, නියාමනයකින් තොරව සිදු වන සංචාරක කටයුතු වැනි හේතු නිසා මෙම තත්ත්වය මේ වන විට තවත් උග්‍ර වී තිබීමට පුළුවන. එසේ නමුත් මේ වන විට කොරල් පරයේ සීමාවන් සලකුණු කිරීම සහ සමහර කටයුතු සඳහා සීමාවන් පැනවීම නිසා තරමක් දුරට මෙම තත්ත්වය යහපත් අතට හැරි ඇත.

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය එක්ව ජෛව විවිධත්ව සමීක්ෂණයක් සිදු කර ඇති නමුත් එම දත්ත තරමක් පැරණි අතර ම අවශ්‍ය තරමට විස්තරාත්මක නොවේ. ජෛව විවිධත්ව ලේකම් කාර්යාලයේ ඉල්ලීම මත මෙම ව්‍යාපෘතිය මඟින් ද්‍රෝණියේ හරස්කඩ 23 ක් පදනම් කර ගනිමින් කඩිනම් ජෛව විවිධත්ව සමීක්ෂණයක් සිදු කරන ලදී. එසේ වුව ද, මෙම සැලැස්ම සැකසීමේ දී ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය එක් ව සිදු කළ සමීක්ෂණයේ දත්ත ද උපයෝගී කර ගන්නා ලදී.

[25]Jayasiri.H.B. and Hputhanthri.S.S.K. (2015).Template for Submission of Scientific Information to Describe Areas Meeting Scientific Criteria for Ecologically or Biologically Significant Marine Areas. NARA.

[26]Anon, 2015, Education, capacity development and monitoring in support of Bar Reef Marine Sanctuary (BRMS) management.National Aquatic Resources Research and Development Agency Colombo, Sri Lanka.



සිතියම් අංක 11. කලා ඔය ද්‍රෝණියේ ස්වභාවික හා මිනිසා විසින් සැකසූ පාරිසරික පද්ධති.
සිතියමේ පරිමාණය අනුව සමහර පද්ධති මෙහි දෘශ්‍යමාන නොවේ.

3.7 යෝජිත සංවර්ධන ක්‍රියාකාරකම්

යෝජිත සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු පහසුවෙන් ලබා ගැනීම් දුෂ්කර වීමට වෙනත් සාධකවලට අමතරව ජාතික හා දිස්ත්‍රික් මට්ටමේ ආයතන අතර තොරතුරු හුවමාරුවේ අඩුපාඩුකම්ද තරමක් දුරට බලපා ඇත. පුත්තලම දිස්ත්‍රික්කයේ කලා ඔය ද්‍රෝණිය තුළ හෝටල් ව්‍යාපෘති දෙකක් අනුමත වී ඇත. පුත්තලම දිස්ත්‍රික්කයේ අරුවක්කාඩුව කසල කළමනාකරණ ව්‍යාපෘතිය ද්‍රෝණියෙන් පිටත පිහිටා ඇත. කෙසේ වෙතත්, මෙවැනි ව්‍යාපෘතිවල පාරිසරික ඇගයීම් වාර්තා අධ්‍යයනය කර ප්‍රදේශයේ ජෛව විවිධත්වයට වන බලපෑම හඳුනාගැනීම වඩා යෝග්‍ය වේ. ද්‍රෝණිය ආශ්‍රිතව අනුරාධපුර දිස්ත්‍රික්කයේ යෝජිත සංවර්ධන කටයුතු පිළිබඳ තොරතුරු නොමැති අතර, අවිධිමත් තොරතුරුවලට අනුව මෑත දී අනුමත ව්‍යාපෘති එම දිස්ත්‍රික්කයේ නොමැත.

3.8 දැනට තිබෙන අවකාශීය සැලසුම්


ජාතික මට්ටමේ සැලසුම්

රටෙහි ජාතික සංවර්ධනය සඳහා පුළුල් රාමුවක් සපයනු ලබන ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇති ජාතික භෞතික සැලැස්ම සංකල්පීය සැලැස්මකි. එසේ ම එය 2050 දක්වා වන ශ්‍රී ලංකාවේ දැක්ම විදහා දැක්වෙන උපාය මාර්ගික ලේඛනයකි[27]. ශ්‍රී ලංකාවේ භූමිය හා මුහුදු ප්‍රදේශය, ආර්ථික, සමාජීය, භෞතික සහ පාරිසරික කටයුතු ඒකාබද්ධ ලෙස සැලසුම් කිරීම සඳහා අනුබල දීම සහ නියාමනය කිරීම සඳහා වන කාර්යය මෙමඟින් ඉටු කරනු ලබයි. ජාතික භෞතික සැලසුමේ හා එහි ප්‍රතිපත්තිවල ප්‍රධාන

[27]Anon, 2015.National Physical Plan as the Framework for City of Tomorrow.World cities day 2015. Consultative forum, NPPD, Ministry of Mega Polis and Western Development.


අරමුණ වනුයේ කෘෂිකර්මය ද ඇතුළු ව, තිබෙන සම්පත් භාවිත කරමින් ආර්ථික සංවර්ධනයක් ළඟා කර ගැනීමත් එතුලින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමත් සහ ජාත්‍යන්තර වශයෙන් ස්වාධීන ආර්ථික තත්ත්වයක් ස්ථාපිත කිරීමත් වේ[28].

වර්ෂ 2030 දක්වා වූ ජාතික භෞතික සැලැස්ම සිතියම් අංක 12 මඟින් පෙන්වා දී ඇත. මෙම සැලැස්ම සංශෝධනය කර නැවත ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර ඇත. සංශෝධිත 2050 සැලැස්මේ ප්‍රධාන තේමාවන් සිතියම් අංක 13 න් නිරූපණය වේ. එමඟින් සංවර්ධන තීරු, වෙරළ ආශ්‍රිත පාරිසරික සංවේදී කලාපය, මධ්‍ය පාරිසරික සංවේදී ප්‍රදේශය, සංරක්ෂිත ප්‍රදේශ සහ මුහුදු මට්ටමේ සිට මීටර් 1500 වඩා උසින් පිහිටි ප්‍රදේශ දක්වා ඇත. මෙම සැලසුම් දෙක ම විශේෂයෙන් ආරක්ෂිත ප්‍රදේශ වලින් පිටත ප්‍රදේශවල ජෛව විවිධත්ව සංරක්ෂණය කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කර නැත. එසේ නමුත් සංශෝධිත භෞතික සැලැස්ම අනෙකුත් සාධකවලට අමතරව පාරිසරික සංවේදීතාවය කෙරෙහි කේන්ද්‍ර ගත කිරීමක් සිදු කර ඇත.



සිතියම් අංක 12. ජාතික භෞතික සැලැස්ම 2030 (මූලාශ්‍රය: NPPD)

[28] www.nppd.gov.lk



සිතියම් අංක 13. ජාතික භෞතික සැලැස්ම 2050 (මූලාශ්‍රය: NPPD)

ප්‍රාදේශීය හා උප ප්‍රාදේශීය මට්ටමේ සැලසුම්

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් ප්‍රාදේශීය භෞතික ව්‍යුහාත්මක සැලසුම් කිහිපයක් නැගෙනහිර පළාත , උතුරු මැද පුරවර කලාපය, සබරගමුව පළාත, බස්නාහිර පළාත හා ඌව පළාත සඳහා සකස් කර ඇත. මෙයට අමතර ව, සියලු පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් උතුරු පළාත සඳහා උපාය මාර්ගික පාරිසරික තක්සේරුවක් සිදු කර සැලැස්මක් සකස් කර ඇත. මෙම සැලසුම් කලා ඔය ද්‍රෝණියට පිටතින් පිහිටි ප්‍රදේශ පදනම්ව සකසා ඇති බැවින් මෙහිදී එම සැලසුම් පිළිබඳව එතරම් දුරට සලකා බැලීමක් සිදු නො කරන ලදී.

නාගරික සංවර්ධන සැලසුම්

නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රධාන වශයෙන් නාගරික සංවර්ධනය අරමුණු කර නාගරික සංවර්ධන සැලසුම් සකසා කර ඇත. එමෙන් ම මෙම සැලසුම් නාගරික ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කළ ප්‍රදේශවලට පමණක් සීමා වේ.

ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම්

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විවිධ මට්ටම් වලින් ඉඩම් පරිහරණ සැලසුම් සකස් කර ඇත. 2016 වන විට ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් 300 පමණ නිමකර තිබූ අතර, එම සැලසුම් මඟින් ආරක්ෂිත ප්‍රදේශ, තව දුරටත් ආරක්ෂා කරන අතර ම කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම අරමුණු කරන ලදී. එසේ වුව ද, මෙම සැලසුම් මඟින් ආරක්ෂිත ප්‍රදේශ වලට පිටතින් පිහිටි සමහර ප්‍රදේශ වල පාරිසරික, ඓතිහාසික/පුරාවිද්‍යාත්මක වැදගත්කම සලකා ඒවා ආරක්ෂා කිරීම සඳහා නිර්දේශ ලබා දී ඇත. කලා ඔය ද්‍රෝණියට අයත් වන සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් සකස් කර ඇත. එසේ ම, මෙම සැලසුම් යාවත්කාලීන කිරීම මේ වන විට ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර ඇත.

ග්‍රාමීය මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම්

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව 2017 සිට ග්‍රාමීය මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සිදු කරන ලදී. තෝරාගත් ගම්මානවල ජනතාවගේ සහභාගිත්වය ඇතිව ඉඩම් පරිහරණ ගැටලු හඳුනා ගැනීම සහ නිර්දේශ ලබා දීම මෙම සැලසුම් තුලින් සිදු වේ. කලා ඔය ද්‍රෝණිය තුළ පුත්තලම සහ අනුරාධපුර දිස්ත්‍රික්ක දෙකේ ම ගම්මාන හයකට පමණ සැලසුම් සකස් කර ඇත. මෙම සැලසුම් සෘජුව ම ඉඩම් පරිහරණ ගැටලු ඉලක්ක කර ඇති බැවින් ඒවා වඩාත් ප්‍රයෝගික වන අතර ම පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි ද වේ.

3.9 ජෛව විවිධත්වය ඒකාබද්ධ කළ ඉඩම් පරිහරණ සැලැස්මක අවශ්‍යතාවය

දැනට තිබෙන සැලසුම්වල තොරතුරු සලකා බැලීමේ දී ඒවා ආංශික ක්ෂේත්‍ර කෙරෙහි සුවිශේෂිත්වයක් ලබා දෙමින් යටිතල පහසුකම් සංවර්ධනය, නාගරික සංවර්ධනය, සහ භූමි ඵලදායිතා ප්‍රවර්ධනය කේන්ද්‍ර කර ගනිමින් සකස් කර ඇති බව පෙනේ. මෙම සැලසුම් ජෛව විවිධත්ව ගැටලු ඉලක්ක කර ඒකාබද්ධ ප්‍රවේශයක් තුලින් එම ගැටලු විසඳීම සඳහා සකසා ඇති බවක් විද්‍යාමාන නොවේ. තව ද, මෙම සැලසුම්කරණයේ දී ස්වභාවික මායිම් වෙනුවට පරිපාලන මායිම් අනුව තෝරා ගත් සැලසුම් ප්‍රදේශයන් යොදා ගෙන ඇත. එබැවින්, දැනට ඇති සැලසුම්වල පවතින මෙම අඩුපාඩු මගහරවා ගනිමින් සාකල්‍ය ප්‍රවේශයක් තුලින් නිෂ්පාදනය ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගන්නා අතර ම ජෛව විවධත්වය සංරක්ෂණය ළඟා කර ගැනීම මෙම සැලසුම්කරණයේ අපේක්ෂාව වේ. තව ද, දැනට පවත්නා සැලසුම්වල පාරිසරික සංවේදී ප්‍රදේශ සංකල්පය භාවිත කර නොමැති බැවින්, මෙහි දී එය ප්‍රථම වරට ජෛව විවිධත්ව සංරක්ෂණය මුඛ්‍යධාරා ගත කරමින් ඉඩම් පරිහරණ සැලසුම්කරණය සිදු කර ඇත.

4. යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම

4.1 ඉඩම් පරිහරණ සැලැස්ම සඳහා භාවිත කළ ක්‍රමවේදය හා ප්‍රවේශයන්.

හැඳින්වීම

පුත්තලම සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හයක් ආවරණය කරමින් පාරිසරික සංවේදී ප්‍රදේශ/ස්ථාන දෙකක් පදනම් කර භූ දර්ශන මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් හයක් සැකසීම සඳහා ව්‍යපෘති ආරම්භක වාර්තාව මඟින් යෝජනා කර තිබුණි. එසේ ම, එම සැලසුම් හය ඒකාබද්ධ කර දිස්ත්‍රික්ක දෙක සඳහා සංයුක්ත සැලසුම් දෙකක් සැකසීමට යෝජනා කෙරිණි. එසේ වුව ද, මෙම යෝජනාව තව දුරටත් වැඩි දියුණු කර සමස්ත ද්‍රෝණිය සඳහා ජෛව විවිධත්ව සංරක්ෂණය ඒකාබද්ධ කර තනි සැලැස්මක් සැකසීමට තීරණය කරන ලදී. එබැවින් අදාළ ක්‍රමවේදය වෙනස් කර මුළු ද්‍රෝණිය ම ආවරණය වන ලෙස සමස්ත භූ දර්ශනය ම සැලකිල්ලට ගෙන ඉඩම් පරිහරණ සැලැස්ම සකස් කරන ලදී.

භූගෝලීය හා ආර්ථික තත්ත්වයන් මෙන් ම ඓතිහාසික හා සංස්කෘතික සංවර්ධනයන් ද සැලකිල්ලට ගනිමින් අවකාශීය සැලසුම්කරණය සඳහා වෙනස් වූ ප්‍රවේශයන් ලොව පුරාම භාවිත කෙරේ. ඒ අනුව, ප්‍රධාන ප්‍රවේශයන් හතරක් හඳුනාගත හැකි වේ[29]. ඒවා නම්;

a) ප්‍රාදේශීය ආර්ථික සැලසුම් ප්‍රවේශය

මෙම ප්‍රවේශය ප්‍රතිපත්තිමය මෙවලමක් ලෙස භාවිත වන අතර, විශේෂයෙන් සම්පත් භාවිතයේ අසමානකම්, රටවල හෝ ප්‍රදේශවල පවතින රැකියා හා සමාජ තත්ත්වයේ වෙනස්කම් සාපේක්ෂව සලකා බලා පුළුල් සමාජ ආර්ථික අරමුණු ළඟා කර ගැනීම සඳහා මෙය භාවිත කෙරේ[30].

b) පුළුල් ඒකාබද්ධ ප්‍රවේශය

පුළුල් ඒකාබද්ධ ප්‍රවේශයේ දී ක්‍රමවත් හා විධිමත් සැලසුම් ධූරාවලියක් තුලින් අවකාශීය සැලසුම්කරණය සිදු කරනු ලබයි. මෙම ප්‍රවේශයේදී පහළ මට්ටමේ සැලසුම් තීරණ ඉහළ මට්ටමේ සැලසුම් තීරණ සමඟ පරස්පරතාවයක් නොදක්වයි.

c) ඉඩම් පරිහරණ කළමනාකරණ ප්‍රවේශය

මෙම ප්‍රවේශයේ දී ඉඩම් භාවිතය පාලනය සඳහා වඩාත් තාක්ෂණික ලෙස සැලසුම්කරණය සිදු කරනු ලබයි. මෙහි දී ලබා දෙනු ලබන නිර්දේශ හෝ විධි නියමයන් තිරසාර සංවර්ධනය තහවුරු කරනු ලබයි.

[29]EU Commission 1997.The EU Compendium of Spatial Planning Systems and Policies. Brussels: European Union, Office for Official Publications of the European Communities. *http://commin.org/upload/Glossaries/European_Glossary/EU_compendium_No_28_of_1997.pdf*.

[30]Williamson. I., S. Enemark, J. Wallance, A. Rajabifard. 2010. Managing the use of land. Land Administration for Sustainable Development. ESRI Press Academic, California.

d) නාගරිකත්ව ප්‍රවේශය

මෙම ප්‍රවේශයේ දී ප්‍රධාන ඉලක්කය වනුයේ නාගරික නිර්මාණ සහ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ඇතුළත් කිරීම තුලින් අනම්‍ය කලාපීයකරණ හා ඉඩම් පරිහරණ කේත ඇතුළත් විවිධ නීති රීති හා රෙගුලාසි වලින් නියාමනය වන සැලසුම්කරණයක් වේ.

මෙම නියමු ව්‍යාපෘතියේ ප්‍රවේශය ලෙස භාවිත කරන ලද්දේ ඉඩම් පරිහරණ කළමනාකරණ ප්‍රවේශය වන අතර, පවතින ජෛව විවධත්වය හා එහි වැදගත්කම, මානව අවශ්‍යතා හා ආර්ථික ශක්‍යතාව පදනම් කර සකච්ඡා රාශියක් තුලින් ජෛව විවධත්වය මුඛ්‍යාධාරගත කිරීම අරමුණු කර මෙය සිදු කරන ලදී. ජෛව විවධත්ව සංරක්ෂණය හා ඒවා බුද්ධිමත් ලෙස භාවිතය තහවුරු කිරීම සඳහා පවත්නා ප්‍රතිපත්තීන් හා නීතිමය රාමුව, ප්‍රජාවගේ පිළිගැනීම සහ දිගු කාලින බලපෑම යන කරුණු පදනම්ව සත්‍ය වශයෙන් ම ක්ෂේත්‍රයේ මෙය යොදා ගත හැකි ආකාරය පිළිබඳව සියලු ආකෘතීන් පරික්ෂා කරන ලදී. උපදේශකත්වය සඳහා පාර්ශවකරුවන් සමඟ පැවති සාකච්ඡා රාශියක් තුලින් ක්‍රියාත්මක කළ නොහැකි ආකෘති ප්‍රතික්ෂේප කරන ලදී.

මෙම සැලසුම සැකසීමේ දී පාරිසරික සංවේදී ප්‍රදේශ ව්‍යාපෘතිය යටතේ පිළියෙළ කරන ලද පුහුණු අත් පොතෙහි දක්වා තිබූ ප්‍රවේශයන් හා සංකල්පීය ආකෘති ද භාවිතයට ගන්නා ලදී[31]. එයට අමතර ව මෙම සැලසුම්කරණයේදී ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් සකස් කර ඇති ඉඩම් පරිහරණ සැලසුම් මාර්ගෝපදේශ හා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇති මාර්ගෝපදේශ ද භාවිත කරන ලදී[32]. එසේ ම, විල්පත්තු සහ කහල්ල පල්ලේකැලේ ආරක්ෂිත ප්‍රදේශ සංකීර්ණය සඳහා පිළියෙළ කර ඇති උපාය මාර්ගික කළමනාකරණ රාමුවෙහි දක්වා තිබූ ආරක්ෂිත ප්‍රදේශ වටා වූ ප්‍රදේශ සඳහා වන නිර්දේශ ද සැලකිල්ලට ගන්නා ලදී. තව ද, ශ්‍රී ලංකාවේ පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනා ගැනීම, සැලසුම්කරණය, කළමනාකරණය සහ පසුවිපරම හා ඇගයීම සඳහා පිළියෙළ කර ඇති මෙහෙයුම් අත්පොතෙහි සමහර තොරතුරු ද මේ සඳහා භාවිත කරන ලදී.

ඉහත නිර්ණායක පදනම්ව පහත දැක්වෙන උප ප්‍රවේශයන් තෝරා ගන්නා ලදී.

I. ඉහළ සංරක්ෂණ අගයක් ඇති සංවර්ධනයන් සිදු කරනු ලබන ප්‍රදේශවල ජෛව විවිධත්ව කළමනාකරණය/සංරක්ෂණය මුඛ්‍යාධාර කිරීමේ යාන්ත්‍රණයක් වශයෙන් සහ තිරසර මෙහෙයුම් තහවුරු කිරීම සඳහා කලා ඔය ද්‍රෝණිය තුළ වැදගත් පාරසරික සංවේදී ප්‍රදේශ හඳුනා ගැනීමේ ප්‍රවේශය.
II. ගංගාවේ රක්ෂිත ප්‍රදේශ සලකුණු කිරීම මඟින් එහි අඛණ්ඩ ගලා යාම තහවුරු කිරීම සඳහා වන ප්‍රවේශය .
III. ආරක්ෂිත ප්‍රදේශයන් වටා පිහිටි ප්‍රදේශ කළමනාකරණය කිරීමේ ප්‍රවේශය තුලින් මානව හා පාරිසරික යහපැවැත්ම තහවුරු කිරීම.
IV. අලින් සඳහා යෝග්‍ය වාසස්ථාන සහ පවතින ජන ඝනත්වය සැලකිල්ලට ගනිමින් ආර්ථික ක්‍රියාකාරකම් යෝග්‍ය අයුරින් කළමනාකරණය කරන අතර ම පර්යටක

[31]Training Manual for Integrating Biodiversity Conservation and Sustainable Use into Land Use Panning in Environmental Sensitive Areas, Biodiversity Secretariat, Ministry of Mahaweli Development and Environment.
[32]FAO, 1993.Guidelines for Land Use Planning. Food and Agricultural Organization of the United Nations. Rome.

විශාල ශාක භක්ෂකයින්ගේ පැවැත්ම තහවුරු කරමින් අලි-මිනිස් සහපැවතුම් කලාප සලකුණු කිරීමේ කලාපීකරණ ප්‍රවේශය.

V. ජෛව විවධත්ව සංරක්ෂණය සඳහා ප්‍රදේශ හඳුනාගැනීමට නියෝජනයන් වශයෙන් තෝරාගත් සත්ත්ව හා ශාක විශේෂ භාවිත කිරීම.

VI. සමුද්‍ර දර්ශනයේ හා භූ දර්ශනයේ සම්බන්ධතාවය සහ පාරිසරික පද්ධතීන්ගේ අඛණ්ඩත්වය සඳහා පදනමක් ලෙස ගංඟා මෝය ආරක්ෂා කිරීමේ ප්‍රවේශය.

VII. ආක්‍රමණශීලි ශාක විශේෂ පැතිරීම මත සංවේදී බවට පත්ව ඇති ප්‍රදේශ හඳුනා ගැනීම තුලින් එවැනි ආක්‍රමණශීලි විශේෂ වඳ කිරීමේ ප්‍රවේශය.

VIII. ඥානමය වශයෙන් වැදගත් බෝග වන දර්ශ පිහිටි ස්ථානවල ම සංරක්ෂණය කිරීම උනන්දු කිරීම සඳහා වන ප්‍රවේශය.

IX. විශේෂයෙන් නාගරික හා අර්ධ නාගරික කලාපවල ආරක්ෂිත ප්‍රදේශවලට පිටතින් පිහිටි ඉඩම්වල ඵලදායිතාවය වැඩි කිරීම සඳහා තිරසාර ඉඩම් කළමනාකරණ විධි මඟින් ජනතාවගේ සමාජ ආර්ථික යහපැවැත්ම තහවුරු කිරීම සඳහා වන ප්‍රවේශය.

X. ද්‍රෝණිය තුළ කෘෂිකාර්මික ඉඩම් පරිහරණය තහවුරු කිරීම සඳහා කෘෂිකාර්මික භූමි ශක්‍යතා වර්ගීකරණ ප්‍රවේශය.

ද්‍රෝණිය ආවරණය කරනු ලබන භූමි පරිහරණ හා භූමි ආවරණ සිතියම් යාවත්කාලින කිරීම චන්ද්‍රිකා ඡායාරූප හා ඩ්‍රෝන යානා මඟින් ගනු ලැබූ ඡායාරූප අනුසාරයෙන් හා ක්ෂේත්‍ර නිරීක්ෂණ මඟින් සිදු කරන ලදී. මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇති සිතියම් පදනම් සිතියම් ලෙස භාවිත කරමින් 1:10,000 පරිමාණයට සියලු ම සිතියම් සකස් කරන ලදී. මෙහිදී නියමු අධ්‍යයනයක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කයේ වර්ග කිලෝමීටර් 100 ක භූමි ප්‍රදේශයක් ආවරණය කරමින් මිනිසුන් රහිත යානාවක් (UAV alias Drone) භාවිත කරමින් භූමි පරිහරණ සිතියම් යාවත්කාලින කිරීම සිදු කරන ලදී.

ඉඩම් අයිතිය පිළිබඳ තොරතුරු නොමැතිකම නො සලකා මූලික වශයෙන් රජයේ සහ පුද්ගලික ලෙස ඉඩම් අයිතිය හඳුනා ගැනීම සඳහා උත්සාහයක් ගන්නා ලද අතර, ඒ අනුව දල සිතියමක් සකසන ලදී.

කලින් සඳහන් කළ පරිදි ජෛව විවධත්ව තොරතුරු විවිධ මූලාශ්‍ර වලින් ලබා ගෙන භාවිත කරන ලදී. ව්‍යාපෘතිය මඟින් කරන ලද අධ්‍යයනයේ තොරතුරු හා මහවැලි අධිකාරිය විසින් සිදු කළ අධ්‍යයනයේ තොරතුරු සැලසුම් තීරණ සඳහා ප්‍රධාන වශයෙන් භාවිත කරන ලදී. පරිසනක මෘදුකාංගයක් වන “MAXENT” භාවිත කර තිබෙන දත්ත අනුව දත්ත නොමැති ස්ථාන සඳහා තක්සේරුවක් සිදු කර අඩු පාඩු සම්පූර්ණ කරන ලදී.

4.2 සැලසුම් තීරණ

විවිධ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ඉඩම් තිරසාර ලෙස භාවිත කිරීම තහවුරු කරමින් ජෛව විවධත්වය සංරක්ෂණය කරන අතරම සමස්ත ද්‍රෝණියේ ම ඉඩම් පරිහරණය හා භූමි ආවරණය සැලසුම් කළ යුතු වේ. මෙම ක්‍රියාවලියට සමගාමීව ද්‍රෝණියේ ආරක්ෂිත ප්‍රදේශවලට පිටතින් පිහිටි ප්‍රදේශවල සුවිශේෂී ප්‍රදේශ හඳුනා ගත යුතු අතර, එම ප්‍රදේශ සඳහා විශේෂිත කළමනාකරණ විධි හඳුන්වා දීම තුලින් අවම වශයෙන් දැනට පවතින තත්ත්වය පවත්වා ගැනීම හෝ ජෛව විවධත්වය ආරක්ෂා කිරීම සඳහා එම තත්ත්වය තවදුරටත් වැඩි දියුණු කිරීම කළ යුතු වේ. මෙම ප්‍රදේශ පාරිසරික සංවේදී ප්‍රදේශ හෝ සමහර වෙනත් ප්‍රදේශ (උදා: ගංගා රක්ෂිත, ආරක්ෂිත ප්‍රදේශ වටා පිහිටි ප්‍රේරක කලාප) විය හැකි අතර, එම ප්‍රදේශවල පාරිසරික හා ජෛව විවධත්ව භායනය වැළැක්වීම සඳහා විශේෂ අවධානයක් යෙදවීම අවශ්‍ය

වේ. මෙම ප්‍රදේශ විධිමත් ලෙස කළමනාකරණය කිරීම සමස්ත ද්‍රෝණියේ ම නිෂ්පාදන හැකියාවන් නඩත්තු කරන අතර ම, ජෛව විවිධත්වයේ පැවැත්ම තහවුරු කිරීමට උපකාරී වේ. එමනිසා, පාරිසරික සංවේදී ප්‍රදේශ සහ සුවිශේෂී ඉඩම් පරිහරණ නිර්දේශ අවශ්‍ය වන අනෙකුත් ප්‍රදේශ ද පදනම්ව සැලසුම් තීරණ ගන්නා ලදී. එම තීරණ වඩාත් සවිස්තරාත්මකව පහත දක්වා ඇත.

4.2.1 තීරණ 01: තෝරාගත් පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ ඉඩම් පරිහරණය කළමනාකරණය හා වැඩි දියුණු කිරීම

ඉඩම් පරිහරණ සැලසුම්කරණ අභ්‍යාසයේ ප්‍රධාන ක්‍රියාකාරකම වනුයේ ජෛව විවිධත්වයේ වැදගත්කම මත පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනා ගැනීම හා සලකුණු කිරීම ය. එම නිසා ඉඩම් පරිහරණය හා භූමි ආවරණය නියාමනය මඟින් පාරිසරික සංවේදී ප්‍රදේශ ආරක්ෂා කිරීම හා සංරක්ෂණය ජෛව විවධත්ව සංරක්ෂණය සඳහා ප්‍රමුඛ වේ යන්න ප්‍රධාන උපකල්පනය වේ.

පාරිසරික සංවේදී ප්‍රදේශ කෙසේ කළමනාකරණය කළ යුතු ද යන්න තීරණය කිරීමේ දී පළමු පියවර වනුයේ ඉතිරිව ඇති සියලු ස්වභාවික වාසස්ථාන පිළිබඳ සමීක්ෂණයක් සිදු කර වර්තමාන තත්ත්වය අනුව ඉහළ වටිනාකමක් තිබෙන ස්ථාන සහ තත්ත්වය වෙනස් කළහොත් අවම වටිනාකමක් සහිත ස්ථාන තීරණය කිරීම ය. අනෙක් සියලු ජීව විද්‍යාත්මක සහ සමාජීය පරාමිතීන් ද මෙම සමීක්ෂණයට ඇතුළත් කළ යුතු වේ. පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනා ගැනීමේ නිර්ණායක, තොරතුරු මත පදනම්ව ස්ථාපිත කළ යුතු වේ. පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා වන ජාතික ක්‍රමයක් සඳහා පියවර හතරක් යෝජනා කෙරේ.

පියවර 1 - වාසස්ථානවල රටාව සහ වෘක්ෂලතා, පස, ඛනිජ සම්පත්, භූ විෂමතාව, ගංගා සහ අනෙකුත් ජල විද්‍යාත්මක ලක්ෂණ, දේශගුණය, වත්මන් ඉඩම් පරිහරණය, ජාතින් හා ජන ඝනත්වය යනාදිය තක්සේරු කිරීම.

පියවර 2 - පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා නිර්ණායක ස්ථාපිත කිරීම සහ යෝග්‍ය කළමනාකරණය සඳහා අරමුණු ගත මාර්ගෝපදේශ ලබා දීම.

පියවර 3 - ස්ථාපිත කරන ලද නිර්ණායක පදනම්ව විශේෂ අවදානම් සහිත ස්ථාන, ඉහළ ජෛව විවිධත්වයක් ඇති ප්‍රදේශ සහ ස්වභාවික තත්ත්වය මත ඉහළ ආර්ථික වටිනාකමක් ඇති ප්‍රදේශ හඳුනාගැනීම.

පියවර 4 - ජාතික අරමුණු ස්ථාපිත කිරීම, ආර්ථික සම්බන්ධතා හඳුනා ගැනීම, අවශ්‍ය නීති සම්පාදනය හා පාරිසරික සංවේදී ප්‍රදේශ සඳහා ආයතනික වගකීමක් ලබා දීම ද යන කරුණු ඇතුළත් පාරිසරික සංවේදී ප්‍රදේශ සංරක්ෂණය සඳහා ජාතික උපායමාර්ගයක් සැකසීම.

පාරිසරික සංවේදී ප්‍රදේශ පිළිබඳ තාක්ෂණික පත්‍රිකාවේ සංවේදී ප්‍රදේශ සංරක්ෂණය සඳහා ප්‍රමුඛතා ගත කිරීමට ස්ථර තුනක ප්‍රවේශයක් යෝජනා කර ඇත. මෙම ස්ථර මඟින් ක්‍රියාවලිය පියවර වශයෙන් පහත දක්වා ඇත.

පළමු ස්ථරය :

ජීව විද්‍යාත්මක නිර්ණායක **:** *මෙම ස්ථරය විද්‍යාත්මක ප්‍රවේශයක් පදනම් ව පියවර* **1** *හි විස්තර කර ඇති ලෙස ඉලක්ක කරන ලද අංග (විශේෂ, වාසස්ථාන සහ පාරිසරික ක්‍රියාවලින්) වන අ,තර ඒවා වෙනස් කළ නො හැකි (ජීවීන්ගේ ඒකදේශීයත්වය කෙරෙහි අවධානය යොදමින්) , සම්බන්ධතාවය සහ නිරූපාතාවය*[34]*.*

මෙම අභ්‍යාසයේ ප්‍රතිඵලය වනුයේ ඉලක්කගත භූ දර්ශන අංගයන්හි අවකාශීය ව්‍යාප්තිය වේ. (ඒවායේ අදාළ පාරිසරික කාණ්ඩ/ වර්ග අනුව වර්ගීකරණය කර ඇත). මෙය ඉලක්ක කරන ලද විවිධ අංග (සහ පාරිසරික කාණ්ඩවල) පිළිබඳ ව්‍යාප්තියක් සපයන අතර, භූ දර්ශනයේ එක් එක් ඉලක්කගත අංගවල ප්‍රමාණය හා තත්ත්වය ප්‍රමාණාත්මකව ගණනය කිරීමට හැකි වේ.

මේ සඳහා වෘක්ෂලතා සිතියම්, ගුවන් ඡායාරූප, දුරස්ථ සංවේදක නිරූපණ හෝ වෙනත් අවකාශීය දත්ත ප්‍රභවයන් භාවිත කිරීම කළ හැකි අතර, එම දත්ත භූමියේ සත්‍යාපනය කළ යුතු වේ.

ඉලක්කගත විශේෂයන්ගේ අවකාශීය අර්ථ දැක්වීම සිදු කිරීමේ දී, ඇතැම් ඉලක්කගත විශේෂයන් සඳහා බලපාන ඍතුමය වෙනස්කම් මතක තබා ගත යුතු වේ. උදාහරණයක් ලෙස සමහර විශේෂ සඳහා පරිසර පද්ධතියක් වනුයේ, කාලීනව ගං වතුරෙන් යටවන ප්‍රදේශයන් වේ (උදා: මහවැලි ගංගා පිටාර තැන්න).

දෙවන ස්ථරය:

*තර්ජන නිර්ණායක***:** *මෙම දෙවන ස්ථරයේ භූ දර්ශන තුළ සංරක්ෂණ ප්‍රදේශ "පැහැදිලි හා වර්තමානයේ අනතුරු දායක මට්ටමේ" පවතින බවට සාක්ෂි සපය යි.*

තෙවන ස්ථරය:

විදහා දැක්වීමේ විභවය පිළිබඳ නිර්ණායක; තෙවන ස්ථරය, තෝරා ගැනීමේ ක්‍රියාවලියේ අවසාන පියවර වනු ඇත. පියවර 3 හි ප්‍රතිඵලය වනුයේ භූ දර්ශනය තුළ ප්‍රමුඛතා සංරක්ෂණ ප්‍රදේශ (හෝ පාරිසරික සංවේදී ප්‍රදේශ) පෙන්වන සිතියමක්, ඒවායේ සංරක්ෂණ විභවතාවයන්, සංලක්ෂිත සංරක්ෂණ වටිනාකම්, තර්ජන/ ගැටුම් මට්ටම් සහ නිරූපණ විභවයන් වේ.

[34] For further reading see: Margules, C. R., & Pressey, R. L. (2000). Systematic conservation planning. *Nature*, *405*(6783), 243.

පාරිසරික සංවේදී ප්‍රදේශ නම් කිරීමේ හා කළමනාකරණය කිරීමේ නිර්ණායක

පාරිසරික සංවේදී ප්‍රදේශ නම් කිරීමේ හා කළමනාකරණය කිරීමේ නිර්ණායක සංවර්ධනය වැදගත් වන නමුත් එම නිර්ණායක තිබෙන තොරතුරු මත හා අදාළ ස්ථානයේ තත්ත්වය මත රටකින් රටකට හෝ ස්ථානයකින් ස්ථානයකට සුළු වශයෙන් වෙනස් විය හැකි වේ. නිර්ණායකවල ආකෘතියක් ඒවායේ වැදගත්කම අඩුවීමේ පිළිවෙල අනුව පහත දක්වා ඇත[35] . මෙම නිර්ණායක වලින් සමහර නිර්ණායක කලා ඔය ද්‍රෝණියේ පාරිසරික සංවේදී ප්‍රදේශ නම් කිරීමේදී යොදා ගන්නා ලදී.

1) මානව සමාජයට වැදගත්වන ආකාරය තීරණය කිරීමේ නිර්නායක;

(a) ***ආර්ථික ප්‍රතිලාභ:***
නිෂ්පාදන දිශානති අංශයන් සඳහා මෙම නිර්ණායකය ඉතා වැදගත් වේ. මෙම ස්ථානය සංරක්ෂණයෙන් ජල පෝෂක සංරක්ෂණය හෝ සංචාරක කටයුතු වැනි කාර්යයන් තුලින් දිගු කාලින ආර්ථික ප්‍රතිලාභ ලබා දේ.

(b) විවිධත්වය :
මෙම ස්ථානය විවධ වූ විශේෂ හා පරිසර පද්ධති වලින් යුක්ත වේ.

(c) තිවූ වාසස්ථාන (අන්තර්ජාතික හෝ ජාතික) :
මෙම ස්ථානය තර්ජනයට ලක්ව ඇති වෙනත් රටක නොමැති හෝ ජාතික වශයෙන් තර්ජනයට ලක්ව ඇති හෝ විශේෂ එකක් හෝ කිහිපයක පැවැත්ම සඳහා අවශ්‍ය වන හෝ විශේෂිත පරිසර පද්ධතියක් හෝ වේ.

(d)සංස්කෘතික විවිධත්වය :
මෙම ස්ථානය ආදී වාසීන් ඔවුන්ගේ තිරසාර ජීවන රටාව හා බැඳුණු පරිසර පද්ධතියක් වේ.

(e) හදිසි අවශ්‍යතාවය :
මෙම ස්ථානයට ඇතිව තිබෙන තර්ජන වැළැක්වීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමක් අවශ්‍ය වේ.

2) ස්ථානයක අගය වැඩිකිරීම සඳහා වන අමතර අංගයන් තීරණය කිරීම සඳහා වන නිර්ණායක;

(a) ප්‍රදර්ශනය :
මෙම ස්ථානය, ප්‍රතිලාභ, අගයන් හෝ ආරක්ෂා කිරීමේ ක්‍රම නිරූපණය කරයි. එසේ ම එය ස්වභාවික සම්පත් අගයන් හා මානව ක්‍රියාකාරකම් අතර ගැටුම් විසඳා ගන්නේ කෙසේ ද යන්න පෙන්වා දෙනු ලබයි.

(b) නියෝජිතතාවය/නිරූපණය :

[35]McNeely. Jeffrey A., Kenton R. Miller, Walter V. Reid, Russell A. Mittermeier and Timothy B. Werner. 1990. Conserving the World's Biological Diversity. IUCN, Gland, Switzerland; WRI, CI,WWF-US and the World Bank, Washington, D.C. 85p.

මෙම ස්ථානය, වාසස්ථාන වර්ගය, පාරිසරික ක්‍රියාවලින්, ජීව විද්‍යාත්මක ප්‍රජාව, භූ රූපණ, ලක්ෂණ හෝ වෙනත් ස්වභාවික ලක්ෂණ නිරූපණය හෝ නියෝජනය කරයි.

(c) භූ දර්ශනය :

මෙම ස්ථානය සුවිශේෂී ස්වභාවික අලංකාරයකින් යුතු වේ. මේවා අසමසම වන අතර, පහසුවෙන් විනාශ විය හැකි සහ සංචාරක ආකර්ෂණයට නතු විය හැකි ස්ථාන වේ. යම් කිසි වෙනස්කිරීමක් ඉතාමත් දැඩි ලෙස එහි ප්‍රසන්න භාවය අඩු කිරීමට හේතු වේ.

(d)විනෝදාස්වාදය :

මෙම ස්ථානය දේශීය ජනතාවට විනෝද වීමට හා ස්වභාවික පරිසරය පිළිබඳ ඉගෙනීමට අවස්ථාවක් ලබා දේ.

(e) පර්යේෂණ හා පසුවිපරම :

මෙම ස්ථානය වෙනස් කිරීමක් සිදු නො කරන ප්‍රදේශයක් බැවින් පර්යේෂණ සඳහා භාවිත කළ හැකි වේ. පාරිසරික වෙනසක් තක්සේරු කිරීමට එය පදනමක් සකසා දෙනු ලැබිය හැකි වේ.

(d) දැනුවත්කිරීම :

ප්‍රදේශිය වටිනාකම් අගය කිරීමට සහ දැනුම වැඩි කිරීමට මෙම ස්ථාන තුළ සිදු කරනු ලබන අධ්‍යාපන හා පහුණු වැඩසටහන් දායකත්වයක් ලබා දේ.

3) ස්ථානයක කළමනාකරණ හැකියාව තීරණය කිරීමේ නිර්ණායක;

(a) සමාජීය පිළිගැනීම :

මෙම ස්ථානය දැනටමත් ප්‍රදේශයේ ජනතාව විසින් ආරක්ෂා කර ඇති හෝ රජය විසින් නිල වශයෙන් ආරක්ෂා කිරීම සඳහා පිළිගැනීමක් සිදුවීම.

(b) අවස්ථාවෝචිතකම :

පවත්නා ක්‍රියාකාරකම් ඉදිරි ක්‍රියාකාරකම් සඳහා මග පෙන්වීමක් සිදු කරයි.

(c) උපයෝජ්‍යතාවය :

මෙම ස්ථානය ඕනෑම නීතිමය පාලනයකට පහසුවෙන් නතු කර ගත හැකි වේ.

(d) පහසුව :

විද්‍යාත්මක හා අධ්‍යාපනික අරමුණු සඳහා මෙම ස්ථානය පර්යේෂකයන්ට හා සිසුන්ට පිවිසිය හැකි වේ.

ඉහත සඳහන් සියලු නිර්ණායක කලා ඔය ද්‍රෝණියේ පාරිසරික සංවේදී ප්‍රදේශ නම් කිරීමේදී යොදා නොගත් නමුත් සමහර නිර්ණායක යොදා ගන්නා ලදී.

ද්‍රෝණියේ පවතින ශාක හා සත්ත්ව විශේෂවල තත්ත්වය, භූමි පරිහරණය/ආවරණය හා ඒවායේ කළමනාකරණය, පසේ ගුණාත්මය (පසේ ගැඹුර, පාංශු බාදන උපද්‍රව යනාදිය), මතුපිට ජලය ලබා ගැනීමේ හැකියාව සහ ජන ඝනත්වය වැනි ප්‍රධාන දර්ශක සැලකිල්ලට ගනිමින් පාරිසරික සංවේදී ප්‍රදේශ සඳහා යෝග්‍ය විය හැකි ස්ථාන 13 ආරම්භයේදී ම හඳුනා ගන්නා ලදී (සිතියම් අංක 14). භාවිත කරන ලද නිර්ණායක අනුව එම ස්ථාන 13 අතුරින් ස්ථාන පහක් පාරිසරික සංවේදී ප්‍රදේශ ලෙස තෝරා ගැනීම සඳහා සුදුසුකම් ලැබී ය. මෙම

සියලු ස්ථාන සැලකිල්ලට ගැනීමේදී ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා යම් වැදගත්කමක් ඇති නමුත් එම වැදගත්කම එක ස්ථානයකින් තවත් ස්ථානයකට වෙනස් වේ. එම නිසා මෙම ස්ථාන දහතුන අතුරින් වඩාත් ම වැදගත් ස්ථාන හඳුනාගැනීම සඳහා විශේෂඥ කණ්ඩායමක් විසින් සංවර්ධනය කරන ලද අගයන් ලබා දීමේ ක්‍රමයක් භාවිත කරන ලදී. ඒ අනුව වැඩිම අගයන් ලබා ගත් ස්ථාන පහක් තෝරා ගැනිණි. ඒවා නම්; පුත්තලම දිස්ත්‍රික්කයේ (1) විල්ලු පාරිසරික සංවේදී ප්‍රදේශය, (2) ගඟේ වාඩිය පාරිසරික සංවේදී ප්‍රදේශය, (3) වේවැල් කෑල්ලේ පාරිසරික සංවේදී ප්‍රදේශය ද, අනුරාධපුර දිස්ත්‍රික්කයේ (4) මානෑවකන්ද පාරිසරික සංවේදී ප්‍රදේශය, (5) කලා ඔයේ ඉවුරු දෙපස මීටර 60 ක රක්ෂිත ප්‍රදේශයේ කිලෝ මීටර් හතරක දුරක් අයත් වන ලෙස සලකුණු කළ පාරිසරික සංවේදී ප්‍රදේශය වේ.

පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනාගැනීම සඳහා යෝජිත ක්‍රියාවලිය

මෙම ව්‍යාපෘතිය යටතේ පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා ක්‍රියාවලියක් යෝජනා කරන ලදී[41]. ඒ අනුව, පාරිසරික සංවේදී ප්‍රදේශයක් හඳුනා ගැනීමේදී ආරක්ෂිත ප්‍රදේශවලට පිටතින් පිහිටි මිනිසුන් වාසය කරනු ලබන සංරක්ෂණ වටිනාකමක් ඇති කුඩා ප්‍රදේශ සැලකිල්ලට ගෙන සංවේදී ප්‍රදේශයක් තෝරා ගැනීමට යෝජනා කරන ලදී. මෙම හඳුනා ගැනීමේදී පහත දක්වා ඇති ප්‍රධාන ලක්ෂණ භාවිත කිරීම යෝජනා කර ඇත.

I. පාරිසරික සංවේදී ප්‍රදේශයේ විශාලත්වය
හෙක්ටයාර 5 කට වඩා විශාල ප්‍රදේශයක් වීම වඩා යෝග්‍ය වේ (වඩාත් ත්‍රිව්‍ර ජෛවවිවිධත්වයන් හා පාරිසරික කරුණු ඇත්නම් හෙක්ටයාර පහට වඩා අඩු ප්‍රදේශ ද සලකා බැලිය හැකි වේ).

II. ලක්ෂණ
පහත දක්වා ඇති ලක්ෂණ අතුරින් එකක් හෝ කිහිපයක් පාරිසරික සංවේදී ප්‍රදේශය තුළ තිබිය යුතු වේ.

a) භෝලීය වශයෙන්, කලාපීය වශයෙන් හෝ ජාතික වශයෙන් සංරක්ෂණ වැදගත්කමින් යුත් විශේෂ ගහනයක් (උපද්‍රවයට භාජනය වී ඇති, තර්ජනයට ලක්ව ඇති, අවදානම් සහිත ජීවීන් විශේෂ) ජීවත්වීම හෝ පැවතීම.
b) සුවිශේෂී ජීව විද්‍යාත්මක වැදගත්කමින් යුත් විශේෂ ගහනයක් ප්‍රමාණවත් අයුරින් සිටීම (ඒකදේශීය, දේශීය, බෝග වන දර්ශයන් හෝ සංක්‍රමික විශේෂ).
c) අද්විතීය ලක්ෂණ වලින් යුත් භෞමික, ගංගාශ්‍රිත, මිරිදිය, වෙරළබඩ සහ සමුද්‍රීය පරිසර පද්ධති (හෝ මිශ්‍ර පරිසර පද්ධති).
d) සුවිශේෂී ස්වභාවික ලක්ෂණ හෝ භූ දර්ශනයන් හෝ වැදගත් භූ විද්‍යාත්මක හෝ සංස්කෘතික ලක්ෂණයන්ගෙන් යුත් ප්‍රදේශ.
e) අර්බුධකාරී අවස්ථාවන්හිදී පාරිසරික සේවා සපයනු ලබන ප්‍රදේශ (උදා: ඉතා වැදගත් ජල පෝෂක, පාංශු බාදන වැළැක්වීම සඳහා උපකාරී වන ප්‍රදේශ සහ ආක්‍රමශීලි ශාක පැතිරීම සඳහා බාධක ලෙස ක්‍රියාකරන ප්‍රදේශ)
f) වැදගත් වාසභූමි එකිනෙක සම්බන්ධ කිරීම තහවුරු කිරීම සඳහා වන ප්‍රදේශ (ජීව විද්‍යාත්මක ඒකාබද්ධතාවය නඩත්තු කිරීම සඳහා) හෝ ප්‍රධාන ජීව විද්‍යාත්මක සාධක හෝ පවතින ආරක්ෂිත ප්‍රදේශවල ජීව විද්‍යාත්මක ශක්‍යතාවය වැඩි දියුණු කිරීම සඳහා වන ප්‍රදේශ.


[41]Malcolm A. Jansen. 2020.A Decision Support System for Identification of Environmentally Sensitive Areas in Sri Lanka. UNDP.

g) ස්වභාවික සම්පත් සංවර්ධනය කිරීමේ ප්‍රවේශයන් විදහා දැක්වීම සඳහා අවස්ථාවන් ලබා දිය හැකි ප්‍රදේශ

III. කළමනාකරණ හැකියාවන්

එම ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගෙන් සැදුම්ලත් කණ්ඩායමක් විසින් කළමනාකරණය කරනු ලබන හෝ යම් කණ්ඩායමක් මඟින් කළමනාකරණය සම්බන්ධීකරණය කරනු ලබන ප්‍රදේශයක්. උදාහරණ ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ප්‍රජා සංවර්ධන සංවිධාන, වන සංරක්ෂණ හෝ වනජීවී දෙපාර්තමේන්තු, ධීවර දෙපාර්තමේන්තුව වැනි ආයතන.

එසේ වුව ද, පාරිසරික සංවේදී ප්‍රදේශ කළමනාකරණය සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් අවශ්‍ය වන අතර, සැලසුම්කරණය, තීරණ ගැනීම, නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ පසුවිපරම් කිරීම යන කාර්යයන් වෙනුවෙන් ප්‍රජාව විශාල කාර්යභාරයක් සිදු කළ යුතුව ඇත. එමනිසා මෙම සමස්ත ක්‍රියාවලිය තුළ ප්‍රජා සහභාගිත්වය ඉතා වැදගත් වේ. විශාල කලාපයන් පාරිසරික සංවේදී ප්‍රදේශ ලෙස තෝරා ගැනීම තුලින් ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීම දුෂ්කර වීමට ඉඩ තිබේ. වඩාත් ඵලදායී ප්‍රජා කණ්ඩායම් ඇතිකරලීම සඳහා පාරිසරික සංවේදී ප්‍රදේශය කළමනාකරණය කළ හැකි විශාලත්වයකින් යුක්ත වීම සදුසු වේ. එම ප්‍රදේශය විශාල වැඩි නම් කළමනාකරණය කළ හැකි කුඩා ඒකක වලට බෙදීම තුලින් එම කුඩා ප්‍රදේශ පිළිබඳ අවබෝධයක් ඇති පිරිස් වල එකතුවෙන් ප්‍රජා කණ්ඩායම් සකස් කිරීම කළ හැකි වේ.



සිතියම් අංක: 14. පාරිසරික සංවේදී ප්‍රදේශ වශයෙන් තෝරා ගැනීම සඳහා සලකා බැලීමට පළමුව තෝරා ගත් ස්ථාන (රතු පැහැති රේඛාවකින් සලකුණු කර ඇත) .

මෙම ක්‍රියාවලියේදී අගයන් ලබා දීම තුලින් පාරිසරික සංවේදී ප්‍රදේශ පහක් තෝරා ගත් අතර, එමඟින් ඉතිරි ප්‍රදේශ ජෛව විවිධත්ව සංරක්ෂණය අතින් වැදගත් නොවන බවක් ගම්‍ය නොවේ. එම ප්‍රදේශ ද ජෛව විවිධත්වය අතින් වැදගත් වන නමුත් මෙම අවස්ථාවේ දී ලකුණු ලබා ගැනීම අනුව ප්‍රමුඛත්වය ප්‍රදේශ පහකට හිමි විය. මෙහිදී මෙම ප්‍රදේශ පහ තුළ නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙන් ලබන අත්දැකීම් පසුව ඉතිරි ප්‍රදේශ සඳහා ද යොදා ගැනීමට හැකි වනු ඇත. මුලින් හඳුනාගත් ප්‍රදේශ දහතුන අතුරින් පාරිසරික සංවේදී ප්‍රදේශ ලෙස සුදුසුකම් ලැබූ ප්‍රදේශ වනුයේ;

1. විල්ලු පාරිසරික සංවේදී ප්‍රදේශය (ESA)
2. ගඟේ වාඩිය පාරිසරික සංවේදී ප්‍රදේශය (ESA)
3. වේවැල් කැලේ පාරිසරික සංවේදී ප්‍රදේශය (ESA)
4. මානෑවකන්ද පාරිසරික සංවේදී ප්‍රදේශය (ESA)
5. කලා ඔය ගංගාශ්‍රිත රක්ෂිත පාරිසරික සංවේදී ප්‍රදේශය (ESA)

පාරිසරික සංවේදී ප්‍රදේශ මායිම්

මෙහිදී භූමි පරිහරණය/භූමි ආවරණය ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගනිමින් පාරිසරික සංවේදී ප්‍රදේශවල මායිම් සිතියමක සලකුණු කරන ලදී. මෙම මායිම් පරමාදර්ශීය වන නමුත් භූමියේ පහසුවෙන් හඳුනාගැනීමට නො හැකි නිසා තරමක් ප්‍රායෝගික නො වීමට ඉඩ තිබේ. එබැවින් මෙම මායිම්, ස්වභාවික භූ ලක්ෂණ (උදා: ඇළවල්, මාර්ග, වනාන්තර මායිම්, කඳු වැටි වැනි) පදනම් කර සංශෝධනය කර ගැනීම අවශ්‍ය වනු ඇත. මෙවැනි මායිම් සංශෝධනයක් අත්‍යවශ්‍ය වන බැවින් ඉඩම් පරිහරණය කරන්නන්ගේ ද සහභාගිත්වය ඇතිව පාරිසරික සංවේදී ප්‍රදේශ කළමනාකරණ ක්‍රියාවලියේ දී මෙය වෙන ම අභ්‍යාසයක් ලෙස සිදු කිරීම සුදුසු වේ. තවද, එම ප්‍රදේශයේ ජනතාවට පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනා ගැනීමේ පුවරු ස්ථාපිත කිරීම ද නිර්දේශ කෙරේ.

පාරිසරික සංවේදී ප්‍රදේශයන්හි භූමි ප්‍රමාණය


පාරිසරික සංවේදී ප්‍රදේශයන්හි භූමි ප්‍රමාණයන විවධ වන අතර ඒවා පහත වගුවේ දක්වා ඇත.

වගු අංක 6 තෝරා ගත් පාරිසරික සංවේදී ප්‍රදේශයන්හි භූමි ප්‍රමාණයන්


පාරිසරික සංවේදි ප්‍රදේශ	දල වපසරිය (ha)
ESA 1- විල්ලු	2187
ESA 2 - ගඟේ වාඩිය	3748
ESA 3 - වේවැල් කැලේ	47
ESA 4 - මානෑවකන්ද	856
ESA 5 - ගංගාශ්‍රිත	49

වේවැල් කැලේ සහ ගංගාශ්‍රිත පාරිසරික සංවේදී ප්‍රදේශ අනෙක් ප්‍රදේශ තුනට වඩා සාපේක්ෂව කුඩා වේ. විශාලතම පාරිසරික සංවේදී ප්‍රදේශය වනුයේ ගඟේ වාඩිය පාරිසරික සංවේදී ප්‍රදේශය වේ.


සාමාන්‍යයෙන්, ප්‍රදේශයේ ප්‍රජාවගේ සහභාගිත්වය ඇතිව පාරිසරික සංවේදී ප්‍රදේශ වඩාත් ඵලදායී ලෙස කළමනාකරණය කළ හැකි වේ. එබැවින් විශාල ප්‍රදේශ, කළමනාකරණය කළ හැකි කුඩා ඒකක වලට බෙදා ප්‍රජා සහභාගිත්ව කළමනාකරණය පහසු කිරීම නිර්දේශ කෙරේ. කලින් සඳහන් කළ පරිදි ප්‍රදේශය කළමනාකරණය කළ හැකි ප්‍රමාණයේ ප්‍රදේශයක් නම් කළමනාකරණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම කිරීම පහසු වනු ඇත.




සිතියම් අංක. 15. විශේෂවල තත්ත්වය හා සුදුසකම් ලැබූ පාරිසරික සංවේදී ප්‍රදේශ ද්‍රෝණියේ පිහිටා ඇති ආකාරය දැක්වෙන සිතියම.



සිතියම් අංක. 15a. තෝරාගත් පාරිසරික සංවේදී ප්‍රදේශ පැහැදිලිව දැක්වීම සඳහා විශාල කරන ලද සිතියම (ගඟේ වාඩිය (1), විල්ලු (2) සහ වේවැල් කැලේ (3))



සිතියම් අංක. 15b. තෝරාගත් පාරිසරික සංවේදී ප්‍රදේශ පැහැදිලිව දැක්වීම සඳහා විශාල කරන ලද සිතියම (මානෑවකන්ද (4) සහ ගංගාශ්‍රිත පා.සං.ප්‍ර. (5))



සිතියම් අංක. 15c. අංක 5 ගංගාශ්‍රිත පාරිසරික සංවේදී ප්‍රදේශ පැහැදිලිව දැක්වීම සඳහා විශාල කරන ලද සිතියම

පාරිසරික සංවේදී ප්‍රදේශයන්හි ඉඩම් පරිහරණය සහ භූමි ආවරණය

අදාළ පාරිසරික සංවේදී ප්‍රදේශවල ඉඩම් පරිහරණය සහ භූමි ආවරණයේ විශාලත්වය එම ප්‍රදේශවල මුළු භූමි ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස වගුව 7 හි දක්වා ඇත.

වගුව 7: පාරිසරික සංවේදී ප්‍රදේශවල ඉඩම් පරිහරණය සහ භූමි ආවරණයේ විශාලත්වය එම ප්‍රදේශවල භූමි මුළු භූමි ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස

ප්‍රධාන ඉඩම් පරිහරණ/භූමි ආවරණ කාණ්ඩ	භූමි ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස (%)				
	ගඟේ වාඩිය **ESA 01**	විල්ලු **ESA 02**	වේවැල් කැලේ **ESA 03**	මානෑවකන්ද **ESA 04**	ගංගාශ්‍රිත **ESA 05**
ජනාවාස සහ ගොඩනැගිලි සහිත බිම්	7.11	14.07	--	1.92	20.42
කෘෂිකාර්මික භාවිතයන්	14.18	52.64	--	52.98	34.04
වනාන්තර	64.23	25.74	100	296.02	18.66
ගල් සහිත ප්‍රදේශ	2.24	0.25	--	14.74	--
ජලාශ, ඇළ,දොළ, ගංගා	5.16	0.72	--	77.65	26.88
තෙත් බිම්	7.06	3.30	--	--	--
හිස් ඉඩම්	--	3.28	--	--	--

සාමාන්‍යයෙන්, ජනාවාස සහ වගා කරනු ලබන ප්‍රදේශවල මානව බලපෑම් අනෙක් ප්‍රදේශවලට සාපේක්ෂව වැඩි වේ. විල්ලු සහ මානෑවකන්ද ප්‍රදේශ තුළ වගා බිම ප්‍රමාණය වැඩි අතර, එය 52% ක් පමණ වේ. මානෑවකන්ද පාරිසරික සංවේදී ප්‍රදේශය තුළ අඩුම වශයෙන් ජනාවාස පිහිටා ඇත. (1.92%) වේවැල් කැලේ ප්‍රදේශය තුළ කිසිදු ජනාවාසයක් නොමැති අතර, වන ආවරණයට පමණක් සීමා වී පවතී. රජයේ ඉඩම් ආඥා පනතේ ප්‍රතිපාදන අනුව මීටර් 60 ක රක්ෂිත තීරුවක් ලෙස සලකුණු කළ ගංගාශ්‍රිත පාරිසරික සංවේදී ප්‍රදේශය තුළ 20.4% ක ප්‍රමාණයක ජනාවාස දක්නට ලැබේ. එසේ වුව ද, අදාළ පනතේ ප්‍රතිපාදන අනුව ගඟ දෙපස රක්ෂිත තීරුව සලකුණු කළ හැකි වන්නේ රජයේ ඉඩම් සඳහා පමණක් වේ. එබැවින් එම ප්‍රදේශය තුළ ප්‍රජා සහභාගිත්වය ඇතිව ගඟට වන අයහපත් බලපෑම් අවම කිරීම සහ ප්‍රදේශයේ ජෛව විවිධත්වය සංරක්ෂණය තහවුරු කිරීම සඳහා විධිමත් ලෙස ඉඩම් පරිහරණය නියාමනය කළ යුතු වේ. පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ ඉඩම් පරිහරණය/ භූමි ආවරණය විවධ වන බැවින් ඉඩම් පරිහරණ නිර්දේශයන් එක සංවේදී ප්‍රදේශයකින් අනෙක් ප්‍රදේශයට වෙනස් වේ.

පසේ තෙතමනය සිමා වී ඇති බැවින් සාමන්‍යයෙන් පොදුවේ මෙම ප්‍රදේශයේ ඇති ගෙවතු ඌණ පරිහරණ තත්ත්වයේ ඇත. එබැවින් භූමි ආවරණය දුර්වල වී ඇති අතර, එය විශේෂයෙන් වර්ෂා කාලයේ දී පාංශු ඛාදනය වැඩි කිරීමට හේතුවක් වී ඇත. තව ද, පසේ සාරවත්භාවය හීන වීම, පස තද වීම, පසේ කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය අඩු වීම වැනි හේතු නිසා තව දුරටත් භූමි ආවරණය දුර්වල වීම සිදුවේ. මෙම තත්ත්වය කුඹුරු හැර මෙම ප්‍රදේශයේ අනෙකුත් වගා බිම්වලට ද පොදු ලක්ෂණයකි. එබැවින් කෘෂිකාර්මික පරිසර පද්ධතීන්වලට පාංශු හා ජල සංරක්ෂණ ක්‍රමෝපායන් හඳුන්වා දීම තුලින් ඉඩම් පරිහරණය හා භූමි ආවරණය වැඩි දියුණු කිරීම කළ යුතු වේ. එසේ වුව ද, මෙම සංරක්ෂණ ක්‍රියාකාරකම් පාරිසරික සංවේදී ප්‍රදේශවලට පමණක් සීමා නො කර පාංශු ඛාදන හා තෙතමන සිමා වීමේ ප්‍රබලත්වය අනුව විවධ ත්‍රිව්‍රතාවයන්ගෙන් අනෙක් ප්‍රදේශවල ද ක්‍රියාත්මක කිරීම යෝජනා කෙරේ.

වගා බිම්වල විශේෂයෙන් වී වගාවේ දී කෘෂි රසායන නිර්දේශිත ප්‍රමාණ ඉක්මවා භාවිත කිරීමේ අවස්ථා නිරීක්ෂණය කර ඇත. නමුත් ඒ සඳහා වන දත්තවල ඌණතාවය නිසා එය ඔප්පු කිරීම දුෂ්කර වී ඇත. එසේ වුව ද, පසුගිය කාල සීමාව තුළ කෘෂි රසායන ආනයනයේ පැහැදිලි වැඩි වීමක් පෙන්වන අතර, එය මෙලෙස කෘෂි රසායන අධිකව භාවිත කිරීම පෙන්වා දිය හැකි වක්‍ර දර්ශකයක් ලෙස සැලකිය හැකි වේ. රසායනික පොහොර භාවිතය ද සමහර අවස්ථාවන්හි දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශ ඉක්මවා යන අවස්ථා ඇති අතර, දිස්ත්‍රික් අතර පොහොර භාවිතයේ විෂමතාවයන් නිරීක්ෂණය වේ[42].

බෝගවල පරාගනයට ඉවහල් වන සතුන් විනාශ වීම බෝග අස්වැන්න අඩු වීමට බලපානු ලැබේ. පලිබෝධකයින්ගේ ස්වභාවික හතුරන් විනාශ වීම තුලින් ස්වභාවික කෘමි මර්ධනය අඩාල වීම නිසා පලිබෝධ හානිය ඉහළ මට්ටමක පැවතීම සිදු වේ. කෘමිනාශකවලට ප්‍රතිරෝධී කෘමින් ඇතිවීම කෘමිනාශක භාවිතය තවදුරටත් වැඩි වීමට හේතුවක් වී ඇති අතර, එමඟින් පස හා ජලය දූෂණය වීම, ගොවින් තුළට විෂ ද්‍රව්‍ය ඇතුළත් වීම නිසා සෞඛ්‍ය තර්ජන ඇතිවීම සිදුවේ. පාලනයකින් තොරව කෘෂි රසායන භාවිතයේ එක ප්‍රතිඵලයක් ලෙස පරිසරයේ ඇති ජෛව විවධත්ව හානිය හඳුනාගත හැකි වේ.

[42]Weerahewa.J. and Kanthilanka.H. (2016). Do farmers over use fertilizers. Some empirical evidence from paddy cultivation during 2005-2015.Department of Agricultural Economics & Business Management, Faculty of Agriculture, University of Peradeniya.

පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ ඇති කෘෂිකාර්මික පරිසර පද්ධතීන්ගේ ජෛව විවධත්ව සංරක්ෂණය තහවුරු කිරීම සඳහා ඒකාබද්ධ පලිබෝධ පාලනය, ශාකමය පලිබෝධනාශක භාවිතය දිරි ගැන්වීම වැනි ක්‍රියාකාරකම් වඩාත් සුදුසු නිර්දේශයන් වේ. එසේ ම මෙම නිර්දේශයන් ද්‍රෝණියේ අනෙක් ප්‍රදේශවලට ද යොදා ගත හැකි වේ. එබැවින්, ඉඩම් භාවිත කරන්නන් අතර මෙවැනි ක්‍රියාකාරකම් ජනප්‍රිය කිරීම සඳහා ඒකාබද්ධ පලිබෝධ පාලනය, ශාකසාර පලිබෝධ නාශක සැකසීම, කොම්පෝස්ට් සැකසීම වැනි ක්‍රියාකරම් සඳහා පුහුණු හා දැනුවත් කිරීම පැවැත්විය යුතු වේ. එසේම, හැකි නම් මෙවැනි ක්‍රියාකාරකම්වල යහපත් බලපෑම් විදහා දැක්වීම සඳහා ආදර්ශන ක්‍රියාත්මක කිරීම සුදුසු වේ.

පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ ජෛව විවධත්වය

වඩාත් ඵලදායි නිර්දේශ සකස් කිරීම සඳහා පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ ඇති ජෛව විවධත්ව දත්ත ප්‍රමාණවත් නොවූව ද, සියලුම ලබා ගත හැකි දත්ත සහ “Maxent” මෘදුකාංගය භාවිතයෙන් දත්ත අඩු ප්‍රදේශ සඳහා පුරෝකතනය කරන ලද දත්ත භාවිත කරමින් මෙම අභ්‍යාසය සම්පූර්ණ කරන ලදී.

අනෙකුත් ප්‍රදේශවලට සාපේක්ෂව පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ ජෛව විවිධත්වයට ඇති තර්ජන වැඩි අතර ම එහි ජෛව විවිධත්ව අගයද වැඩි වේ. එබැවින් මෙම ප්‍රදේශ පහ තුළ ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා ප්‍රමුඛත්වයක් ලබා දිය යුතු වේ. එය මුලින් හඳුනාගත් ඉතිරි ප්‍රදේශවල වැදගත්කම හීන වීමක් සිදු නො කරන අතර, පාරිසරික සංවේදී ප්‍රදේශවල සිදු කරනු ලබන ක්‍රියාකාරකම් වලින් උගත් පාඩම් පසුව අනෙක් ප්‍රදේශවලට ද යොදා ගැනීමේ හැකියාව ඇති කරනු ලබයි.

පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ ක්‍රියාවලින් සහ අනෙකුත් භෞතික ලක්ෂණ

බෑවුම සහ පාංශු ඛාදනය

පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ භූමියේ බෑවුම විවිධ වන අතර, බහුතරයක් භූමි ප්‍රදේශ සමතලා (0-8%) ස්වභාවයකින් යුක්ත වේ (වගු අංක 8). බෑවුම 8% ට වැඩි භූමි ප්‍රමාණයන් ඉතාමත් අල්ප වේ. මෙම බෑවුම් පාංශු ඛාදනය වැඩි කිරීමට දැඩි බලපෑමක් නො කරන නමුත් පසේ ඛාදන හැකියාව සහ වර්ෂාපතනයේ ත්‍රිවුරතාවය පාංශු ඛාදනය කෙරෙහි වැඩි බලපෑමක් ඇති කරයි. එබැවින්, විශේෂයෙන් මෝසම් වර්ෂා කාලය තුළ දී වැසි බිංදු නිසා සිදුවන විසිරි ඛාදනය අවම කිරීම සඳහා වගා බිම්වල සජීව වසුන් නඩත්තුව හෝ බෝග ඉපනැලි වසුන් භාවිතය ඉතා වැදගත් වේ. මෙයට අමතරව මෙලෙස භූමිය මතුපිට ආවරණය කිරීම වියළි කාලයේ දී පසෙහි තෙතමන සංරක්ෂණයට ඉවහල් වන අතර ම එමඟින් පසට කාබනික ද්‍රව්‍ය ලබා දීමක් මෙන්ම සජීව වසුන් ලෙස රනිල ශාක භාවිත කිරීමෙන් වායු ගෝලීය නයිට්‍රජන් තිර කිරීම ද සිදු කරනු ලබයි.

වගු අංක 8: පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ භූමියේ දක්නට ලැබෙන බෑවුම් කලාප සහ ඒවායේ විශාලත්වය සංවේදී ප්‍රදේශයේ මුළු බිම් ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස.

බෑවුම් කලාපය	ගඟේ වාඩිය (ESA 01) තුළ බෑවුම් කලාපවල විශාලත්වය %	විල්ලු (ESA 02) තුළ බෑවුම් කලාපවල විශාලත්වය %	වේවැල් කැලේ (ESA 03) තුළ බෑවුම් කලාපවල විශාලත්වය %	මානෑවකන්ද (ESA 04) තුළ බෑවුම් කලාපවල විශාලත්වය %	ගංගාශ්‍රිත (ESA 05) තුළ බෑවුම් කලාපවල විශාලත්වය %
0 % - 2%	98	86	100	51	96
2 % - 8 %	2	14	--	42	4
8 % - 16%	--	--	--	5	--
16 % - 30%	--	--	--	--	--

පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ පස

මහා පාංශු කාණ්ඩ කිහිපයක් පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ දක්නට ලැබේ. පාරිසරික සංවේදී ප්‍රදේශ අංක 1 හි 59% පමණ දියළු පස් සහ 16% පමණ රතු කහ ලැටසොල් පස පිහිටා ඇත. (වගු අංක 9). මෙයට අමතරව භූමියෙන්25% පමණ ප්‍රදේශයක් ඛාදනයට ලක්ව ඇත. පාරිසරික සංවේදී ප්‍රදේශ අංක 2 හි වැඩි බිම් ප්‍රමාණයක පස රතු කහ ලැටසොල් වේ. පාරිසරික සංවේදී ප්‍රදේශ අංක 4 සහ 5 හි ප්‍රධාන පාංශු කාණ්ඩයන් වනුයේ රතු දුඹුරු පස සහ අව භියුමික ගලේ පස වේ. සාමාන්‍යයෙන්, රතු දුඹුරු පස් සහ රතු කහ ලැටසොල් පස්වල ඛාදනය වීමේ හැකියාව සාපේෂව වැඩි බැවින් පස සංරක්ෂණය සඳහා සුදුසු භූමි ආවරණයන් නඩත්තු කිරීම අවශ්‍ය වේ. පස ප්‍රතිෂ්ඨාපනය භූමි ආවරණ නඩත්තුව සඳහා උපකාරී වන අතර එය අවසානයේ දී ජෛව විවධත්ව සංරක්ෂණ හිතකාමී පරිසරයක් නිර්මාණය කෙරේ.

වගු අංක 9: පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ මහා පාංශු කාණ්ඩ වල ව්‍යාප්තිය හා ඒවායේ වපසරිය ප්‍රතිශතයක් ලෙස.

මහා පාංශු කාණ්ඩ	දල වපසරිය ප්‍රතිශතයක් ලෙස				
	ESA 1	**ESA 2**	**ESA 3**	**ESA 4**	**ESA 5**
විවිධ ජලවහන තත්ත්වයන් හා වයන්යෙන් යුත් සමතලා භූමි වල ඇති දියළු පස්	59		85		
බදින බිම්	25	20	15		
රතු කහ ලැටසොල්; සුළු බෑවුම් හෝ රැලි බිම්	16	80			
රැලි බිම් වල පිහිටි රතු දුඹුරු පස් සහ අව භියුමික ගලේ පස්				98	75
ගල් සහිත බිම්				2	25

වගු අංක 10. පාරිසරික සංවේදී ප්‍රදේශවල දක්නට ලැබෙන පාංශු ශ්‍රේණි සහ ඒවායේ දල විශාලත්වය ප්‍රතිශතයක් ලෙස

පාංශු ශ්‍රේණි	දල වපසරිය ප්‍රතිශතයක් ලෙස				
	ESA 1	**ESA 2**	**ESA 3**	**ESA 4**	**ESA 5**
විවිධ වයනයන් හා ජල වහන තත්ත්වයන්ගෙන් යුත් දියළු පස් සම්භවයක් ඇති අවිහින්න පස් සමග සංගමනය වූ අරුවි ශ්‍රේණිය	58		9		
සියඹලා - පුත්තම සංගමනය	10				
මීගමු - පුත්තලම් සංගමනය	3	1			
විල්පත්තු-ගැඹුර-මාවිල්ලු-බොරුපන් සංගමනය	2	62			
තෝනිගල-ආනමඩුව-නවගත්තේගම සංකීර්ණය	9	0	91		
මැදවච්චිය-අලුත්වැව-දිවුල්වැව-හුරත්ගම-කහටගස්දිගිලිය සංගමනය				88	100
ගැටිති සහිත පාෂණ තැනි				10	
ඛාදන අවශේෂ	18	37		2	

පාංශු ශ්‍රේණි සිතියම අනුව (Mapa et.al. 2014) ESA1 හි විවිධ වයනයන් හා ජල වහන තත්ත්වයන්ගෙන් යුත් දියළු පස් සම්භවයක් ඇති අවිහින්න පස් සමග සංගමනය වූ අරුවි ශ්‍රේණිය දක්නට ඇති අතර, තෝනිගල - ආනමඩුව- නවගත්තේගම සංකීර්ණය ESA 3 හි ප්‍රමුඛ වේ. ESA 4 සහ ESA 5 හි මැදවච්චිය - අලුත්වැව - දිවුල්වැව - හුරත්ගම - නවගත්තේගම සංගමනය ප්‍රමුඛව දක්නට ලැබේ (වගු අංක 10). මෙම පාංශු ශ්‍රේණින්ගේ පාංශු ගුණාංගයන් එකිනෙකට වෙනස් වන බැවින් ඒ අනුව ඉඩම් පරිහරණයන් හා භූමි ආවරණයන් වෙනස් වීමෙන් විවිධ පාරිසරික තත්ත්ව නිර්මාණය වී ඇත.

ජීව-භෞතික ලක්ෂණ, අනෙකුත් ස්වභාවික සහ මානව ක්‍රියාවලින් සැලකිල්ලට ගෙන පාරිසරික සංවේදී ප්‍රදේශ සඳහා මැනිය හැකි සංරක්ෂණ ඉලක්ක සංවර්ධනය කිරීම නිර්දේශ කෙරේ. මෙම ඉලක්ක විවිධ පාර්ශවකරුවන් විසින් ව්‍යාපෘතියේ මැදිහත්වීමෙන් අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුලින් ළඟා කර ගත යුතු වේ.

පෙව විවධත්ව සංරක්ෂණයට අදාලව පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ පවතින පොදු තර්ජනයන්

විල්ලු පාරිසරික සංවේදී ප්‍රදේශයේ පවතින තර්ජන

a) විල්ලුවේ ඇති සමහර ප්‍රදේශ පොල් සිටුවීම සඳහා අනවසරයෙන් භාවිත කිරීම.
b) වන අලි සංචරණය සිමා කිරීම සඳහා විශාල කානු කැපීම හේතුවෙන් විල්ලුව ගොඩ වීම.
c) විල්ලුව අවට පදිංචි ජනතාව වගා කටයුතු සඳහා විල්ලු ප්‍රදේශය භාවිත කිරීම.
d) අනවසර පදිංචිය සඳහා විල්ලු ප්‍රදේශය භාවිත කිරීම.
e) සමහර විල්ලු ප්‍රදේශ කුඩා වැව් ලෙස සංවර්ධනය කිරීම.
f) අනවසර ඉඩම් අල්ලා ගැනීම් ඇතුළු ඉඩම් අයිතියේ ගැටලු නිසා විල්ලු ප්‍රදේශයට තර්ජන ඇතිවීම.

g) විල්ලුවේ ඇති වෘක්ෂලතා ගිනි තැබීම.
h) වගා කටයුතු සඳහා කෘෂි රසායන අධික ලෙස භාවිතය නිසා විල්ලුවේ වෘක්ෂලතා ආදියට සහ ජෛව විවිධත්වයට අයහපත් බලපෑම් ඇතිවීම
i) පාංශු බාදනය නිසා විල්ලුව ගොඩ වීම.

ගහේ වාඩිය පාරිසරික සංවේදී ප්‍රදේශය තුළ ඇති තර්ජන

a) නිරන්තරයෙන් ඇතිවන නියගයන් සහ ගංවතුර තත්ත්වයන්
b) පරිසරයට හානි දායක ලෙස දේශීය සංචාරකයින් විසින් කරනු ලබන යම් යම් ක්‍රියාකාරකම්.
c) නිදැල්ලේ යන ගවයන්ගේ අධික ලෙස තෘණ උලා කෑම.
d) පාලනයකින් තොරව කෙරෙන වැලි ගොඩ දැමීම.
e) නීති විරෝධී ධිවර ක්‍රම භාවිතය.
f) විවිධ අරමුණු සඳහා කඩොලාන විනාශ කිරීම.
g) ඝණ අපද්‍රව්‍ය නිසා සිදුවන පරිසර දූෂණය.

වේවැල් කැලේ පාරිසරික සංවේදී ප්‍රදේශය තුළ ඇති තර්ජන

a) පදිංචිය සඳහා අනවසර ඉඩම් අල්ලා ගැනීම්, බහු වාර්ෂික බෝග (පොල්) සහ කාලීන බෝග වගා කිරීම.
b) කළමනාකරණයකින් තොරව සිදුවන වේවැල් කැපීම හා වේවැල් කැපීම පහසු කිරීමට ගිනි තැබීම.
c) සතුන් දඩයම් කිරීම.
d) වේවැල් කැපීම පහසු කිරීමට බිම තෙත්ව නො තැබීම සඳහා කානු කැපීම
e) සිමෙන්ති නිෂ්පාදනය සඳහා මෙයට පෙර මැටි කැනීම් මෙම ප්‍රදේශයේ සිදු කර තිබූ අතර එය නැවත ආරම්භ කිරීමේ ප්‍රවණතාවයක් තිබීම.

මානෑවකන්ද පාරිසරික සංවේදී ප්‍රදේශය තුළ ඇති තර්ජන

a) වනාන්තර බිම් අනවසරයෙන් අල්ලා ගැනීම
b) ආක්‍රමණකාරී ආගන්තුක විශේෂවල පැතිරීම (IAS)
c) කැලෑ ගිනි තැබීම
d) අනවසර ලෙස සතුන් දඩයම් කිරීම
e) නියග තත්ත්වයන්
f) තිරසාර නොවන අකාරයෙන් කෘෂි රසායන භාවිත කරමින් ඒක බෝග වගාව.

ගංගාශ්‍රිත පරිසර සංවේදී ප්‍රදේශය තුළ ඇති තර්ජන

a) බොහෝ විට කන්න බෝග වගාව සඳහා අනවසර ඉඩම් අල්ලා ගැනීම්
b) කලා වැවේ වාන් ජලය ඉවතට යන මාර්ගයේ පදිංචිව සිටීම (මේ නිසා වැව වාන් දමන අවස්ථාවන්හිදී ඔවුන්ගේ නිවාස ජලයෙන් යටවීම සිදුවේ)
c) ජල දූෂණය
d) අනවසර ලෙස සතුන් දඩයම් කිරීම
e) කෘෂි රසායන අධික ලෙස භාවිතය.

4.2.2 තීරණය 02: කලා ඔයේ අඛණ්ඩත්වය සඳහා ඉඩම් කළමනාකරණය

‘‘ගංගා ද්‍රෝණියේ අර්ථසාධනය සහ ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා වන ප්‍රධාන සාධකය වනුයේ කලා ඔයේ ජල ප්‍රවාහය බාධාවකින් තොරව ගාලා යාමට ඉඩ සැලසීම ය’’ යන්න මෙහිදී එළඹී ප්‍රධාන උපකල්පනය වේ. එබැවින්, ඒ සඳහා ඔය දෙපස ගංගා රක්ෂිතය කළමනාකරණය කිරීම ඉතා වැදගත් වේ. මෙම රක්ෂිතයේ සීමාවන් 1946 රජයේ ඉඩම් ආඥා පනත අනුව සලකුණු කළ හැකි වේ (වගු අංක 11). එසේවුවද, එම පනතේ ප්‍රතිපාදන අනුව මෙවැනි රක්ෂිතයක් සලකුණු කළ හැකි වනුයේ රජයේ ඉඩම් සඳහා පමණක් වේ. පුද්ගලික ඉඩම්වලට මෙය අදාළ නොවේ.

ඔය දෙපස රජයේ ඉඩම්වල පස ආරක්ෂා කිරීම සහ ගංගාශ්‍රිත වෘක්ෂලතා තීරයේ පැවැත්ම තහවුරු කිරීමට මනා ඉඩම් පරිහරණ කළමනාකරණ විධි හඳුන්වාදීම නිදේශ කෙරේ. රක්ෂිත ප්‍රදේශයේ වෘක්ෂලතා තීරය සංරක්ෂණය කළ යුතු වේ. දැනට පවතින නීති රීති භාවිත කරමින් ගංගාශ්‍රිත වෘක්ෂලතා තීරයට සහ ගං ඉවුරට සිදුවන හානි නවතාලිය යුතු වේ. මෙම ඉඩම් පරිහරණ නිර්දේශ අදාළ පාර්ශවකාර ආයතන විසින් ක්‍රියාවට නැංවිය හැකි වේ.


රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම් ද සැලකිල්ලට ගෙන ඒවායේ ගංගාශ්‍රිත වෘක්ෂලතා තීරය ආරක්ෂා කිරීම සඳහා දැනට පවතින කළමනාකරණ ක්‍රම විමර්ශනය කිරීම සහ තාක්ෂණික ආයතනවල සහාය ඇතිව වඩාත් ඵලදායි කළමනාකරණ ක්‍රමයක් සංවර්ධනය කිරීම නිර්දේශ කෙරේ. ගංගාශ්‍රිත වෘක්ෂලතා තීරය හා ඉවුරු ආශ්‍රිත පස සංරක්ෂණය කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ ගංගාවේ ජල ප්‍රවාහයේ අඛණ්ඩත්වය තහවුරු කිරීම ය.

වගු අංක 11. රජයේ ඉඩම් කාර්යය සංග්‍රහයට අනුව ගඟක පළල අනුව තැබිය යුතු රක්ෂිත සීමාවන්.

ගඟේ පළල (අඩි)	ඉවුරේ සිට තැබිය යුතු රක්ෂිතය (අඩි)
15 අඩු	66 (දළ වශයෙන් 20 m)
15 - 50	132 (දළ වශයෙන් 40 m)
50 වැඩි	198 (දළ වශයෙන් 60 m)




ඡායාරූපය 2. කලා ඔය ඉවුරේ ඉදිරී බිම වැටී ඇති විශාල ගසක්




සිතියම් අංක . 16a. ඉඩම් අයිතිය සැලකිල්ලට නොගෙන සලකුණු කරන ලද කලා ඔය රක්ෂිතය (මෝයට සමීප ප්‍රදේශය).

කෙසේ වුව ද, ගඟ ආශ්‍රිත පුද්ගලික ඉඩම් කළමනාකරණය සඳහා වන ප්‍රවේශය මෙයට වඩා වෙනස් වේ. ගඟ ආශ්‍රිත පුද්ගලික ඉඩම් සඳහා ඉඩම් පරිහරණය කරන්නන්ගේ ද සහභාගිත්වය ඇතිව සහභාගිත්ව ප්‍රවේශය තුලින් යෝග්‍ය ඉඩම් පරිහරනයන් හඳුන්වා දීම කළ යුතු වේ. පුද්ගලික ඉඩම්වල ගංගාශ්‍රිත තීරය ආරක්ෂා කිරීම ධෛර්යමත් කිරීමට යම් මැදිහත්වීමක් අවශ්‍ය වනු ඇත.

ඉඩම් අයිතිය සැලකිල්ලට නොගෙන රජයේ ඉඩම් ආඥා පනතේ ප්‍රතිපාදන අනුව ගංගා රක්ෂිතය සිතියමක සලකුණු කළ අතර, එහි විශාල කරන ලද කොටස් 16a, b and c රූප සටහන්වල පෙන්වා දී ඇත. තිබෙන දත්ත අනුව දක්වා ඇති ප්‍රදේශයේ දල වශයෙන් රජයේ ඉඩම් හෙක්ටයාර 1264 සහ පුද්ගලික ඉඩම් හෙක්ටයාර 663 පමණ මෙම රක්ෂිතයට ඇතුළත් වේ. දත්ත නොමැතිකම නිසා සමහර ප්‍රදේශවල ඉඩම් අයිතිය හඳුනා ගැනීම දුෂ්කර වේ. සම්පූර්ණ කලා ඔය සහ එහි අතු ගංගාවල රක්ෂිත තීරුව දල වශයෙන් හෙක්ටයාර 4000 පමණ වේ .



සිතියම් අංක. 16b. ඉඩම් අයිතිය නොසලකා හරිමින් කලා ඔයේ ඉහළ මැද කොටසේ සලකුණු කරන ලද රක්ෂිත තීරුව.



සිතියම් අංක. 16c. ඉඩම් අයිතිය නොසලකා හරිමින් කලා ඔයේ ඉහළ කොටසේ සලකුණු කරන ලද රක්ෂිත තීරුව

කලා ඔය ද්‍රෝණිය තුළ තිරසර ඉඩම් භාවිතය කලා ඔයේ ජලය බාධාවකින් තොරව ගලා යාමට හේතු වන ප්‍රධානතම සාධකය වන බැවින්, ඔය දෙපස ඇති රජයේ ඉඩම් සංවේදී ඉඩම් ලෙස හඳුනා ගැනීමට හැකි අතර, එම ඉඩම්වල ගංගාශ්‍රිත වෘක්ෂලතා තීරය, පස සහ බෑවුම සංරක්ෂණය සඳහා විශේෂ සැලසුම් සකස් කළ යුතු වේ. මෙලෙස සලකුණු කරන ලද ප්‍රදේශයේ සිදු කරනු ලබන යම් සංවර්ධන ක්‍රියාවලියක දී පාරිසරික ඇගයීමක් මත සිදු කළ යුතු වේ. එසේ ම, අදාළ වගකීම් දරනු ලබන ආයතන ගංගාවේ ගැලීමට සිදු වන බාධාවන් අවම වීම තහවුරු වන ක්‍රියාමාර්ග ගර්හ යුතු වේ. ගංගාවේ බාධක ස්ථාපිත කර ඇති ස්ථානවල (උදා: ජලය හැරවීම සඳහා නිර්මාණය කර ඇති වේලි) සුදුසු ලෙස සතුන්ගේ සංචරණය සඳහා විශේෂයෙන් මාළුන්ගේ සංචරණය සඳහා වේලිවල සිදුරු (fish passes) තැබිය යුතු වේ.


පවතින නීති අනුව රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලාගෙන ඇති අවස්ථාවන්හි දී ක්‍රියා කර එම ගැටලු විසඳිය යුතු වේ. තවද, පවතින නීති හා ඒවායේ ප්‍රතිපාදනයන් අනුව ඉදිරි අනවසර අල්ලා ගැනීම් හා අපද්‍රව්‍ය මුදා හැරීම් පාලනය කළ යුතු වේ. එසේ ම පවතින නීති අනුව වැලි කැණීම, කඩොලාන ඇතුළු අනෙකුත් වෘක්ෂලතා එළිපෙහෙළි කිරීම සහ ඔය ඉවුරට හානි කිරීම් වළකා යුතු වේ.

මෙහි ප්‍රේරක කලාපය ලෙස සලකුණු කර ඇති රක්ෂිත තීරුව සඳහා එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ආංශික සැලසුම් සංවර්ධනය කළ යුතු වේ. තමන්ගේ ඉඩම්වල ඇති ගංගාශ්‍රිත වෘක්ෂලතා තීරය ආරක්ෂා කිරීම සඳහා ප්‍රජා වන වගා වැඩසටහන් හා සුවිශේෂී දිරිමත් කිරීමේ යෝජනා ක්‍රම හඳුනාගෙන එතුලින් මෙම තීරයන් ආරක්ෂා කිරීමට කැමැත්තක් දක්වන ප්‍රජාවගේ ක්‍රියාකාරී සහභාගිත්වය තහවුරු කර ගත යුතු වේ.


4.2.3 තීරණය 03: ද්‍රෝණියේ මානව හා පාරිසරික යහ පැවැත්ම සඳහා ආරක්ෂිත ප්‍රදේශ වටා පිහිටි පර්යන්ත ප්‍රදේශය හඳුනාගැනීම

ආරක්ෂිත ප්‍රදේශ වටා ඇති පර්යන්ත ප්‍රදේශය (ප්‍රේරක කලාපය) ආරක්ෂිත ප්‍රදේශයට අදාළ විසිරුම් කලාපය වේ (සිතියම් අංක. 17). ආරක්ෂිත ප්‍රදේශ තුළ ඇති සත්ත්ව හා ශාක විශේෂවල විසිරුම් කලාපය වන ප්‍රේරක කලාපය පෙව් විවිධත්වය අතින් වැදගත් වේ. එසේ ම මෙම කලාපය තුළ වගා බිම් පිහිටීමත් අවට ප්‍රජාව පදිංචිව සිටීමත් නිසා ගැටලු බහුල කලාපයක් වේ. අඩු ආදායම් තත්ත්වයත්, දුෂ්කර ජීවන රටාවත් නිසා බහුතරයක් ප්‍රජාව සංරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා අකමැත්තක් දක්වයි. මෙයට ප්‍රධාන හේතුවක් ලෙස වන සත්ත්ව උවදුරු ද බලපානු ලැබේ. එසේ වුවද, ආරක්ෂිත ප්‍රදේශ වල පර්යන්ත කලාපය පෙව් විවිධත්ව සංරක්ෂණය සඳහා වැදගත් බැවින් ඒ සඳහා විශේෂ ආංශික සැලසුම් හා ඉඩම් පරිහරණ කළමනාකරණයන් අවශ්‍ය වනු ඇත.

වර්තමානයේදී සැතපුමක සංවර්ධන සීමාවන් සහිත කලාපයක් තැබිය හැකි වනුයේ වනසත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනත යටතේ ප්‍රකාශයට පත් කර ඇති ජාතික රක්ෂිත භූමි සඳහා පමණක් වේ. විශේෂ සැලැස්මක් තුලින් ද්‍රෝණියේ සියලු ම ආරක්ෂිත ප්‍රදේශ වටා සැතපුමක සංවර්ධන සීමා කලාපයක් නිර්මාණය කිරීම සඳහා ඇති හැකියාව සොයා බැලීම සුදුසු බව යෝජනා කෙරේ. සියලු ආරක්ෂිත ප්‍රදේශ (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් යෝජිත ප්‍රදේශද ඇතුළත්ව) සිතියම් අංක 18 හි දක්වා ඇත. පර්යන්ත ප්‍රදේශ වල සංරක්ෂණ මිතුරු ප්‍රජාවක් ඇති කිරීම තුලින් ආරක්ෂිත ප්‍රදේශවල ආරක්ෂාව පවත්වා ගැනීමත්, මිනිස් හා වන සතුන් අතර ගැටුම් අවම කිරීමත්, එම ප්‍රදේශ වටා පිහිටි භූ දර්ශනයන්ට අවම බලපෑමක් වන ඉඩම් පරිහරණ රටාවන් තහවුරු කිරීමත් සඳහා ප්‍රජාව මූලික කර ගත් ආංශික සැලසුම් සැකසීම නිර්දේශ කෙරේ. ජාතික රක්ෂිත හැර අනෙකුත් ප්‍රදේශ වටා පර්යන්තයේ පිහිටි ප්‍රදේශයන්හි සංවර්ධන සීමාවන් සඳහා ප්‍රතිපාදන නොමැති බැවින් ඵලදායි සහභාගීත්ව කළමනාකරණ යාන්ත්‍රණයක් ඉඩම් පරිහරණය නියාමනය සඳහා හඳුන්වාදිය යුතු වේ.




සිතියම් අංක 17.කලා ඔය ද්‍රෝණිය තුල දැනට ඇති ආරක්ෂිත ප්‍රදේශ වටා අදින ලද ප්‍රේරක කලාපය. වම් පස ඇති හතරැස් ප්‍රදේශය කොරල් පරය වේ. නීති අනුව මෙම සැතපුමක සංවර්ධන සීමා ප්‍රදේශය ජාතික රක්ෂිත භූමි සඳහා පමණක් අදාළ වේ.




සිතියම් අංක. 18. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ යෝජිත රක්ෂිතද ඇතුලත්ව කළා ඔය ද්‍රෝණියේ ආරක්ෂිත ප්‍රදේශ සහ ආශ්‍රිත ප්‍රදේශ දැක්වෙන සිතියම.

ප්‍රේරක කලාපයේ වෙසෙන ජනතාවට ආර්ථික වශයෙන් ප්‍රතිලාභ ලැබෙන ලෙස එම වනාන්තර ඔවුන් මඟින් නඩත්තු කිරීම වැදගත් වේ. පාරිසරික හිතකාමී වගා ක්‍රම, අපද්‍රව්‍ය කළමනාකරණය, සතුන් හා ශාක පිළිබඳ අවබෝධය වැඩි කිරීම, ප්‍රජාවගේ නිෂ්පාදන සඳහා වෙළඳපල සම්බන්ධතා ගොඩනැගීම පිළිබඳව ප්‍රජාව ඔවුනට ම සුවිශේෂී වන අයුරින් දැනුවත් කිරීම මෙම ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා යොදා ගත හැකි එක් ක්‍රියාමාර්ගයක් වේ. මෙම ප්‍රදේශවල ඉඩම් පරිහරණය ප්‍රජා සහභාගිත්වයෙන් කළමනාකරණය කළ හැකි වේ. සංවර්ධන ක්‍රියාකාරකම් සුදුසු පාරිසරික ඇගයීම් අනුව සමීපව නියාමනය කළ යුතු වේ. වනසත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනත අනුව ස්වභාවික රක්ෂිතවල ප්‍රේරක කලාපයේ සංවර්ධන කටයුතු සීමා කළ යුතු වේ.


පහත දක්වා ඇති උදාහරණ තුන මඟින් එහි අවශ්‍යතාවය ඉස්මතුව දැක්වේ (සිතියම් අංක 19, 20 සහ 21).



සිතියම් අංක19: කලා වැව සහ බළලු වැව වටා කිලෝ මීටර 1.6 ප්‍රේරක කලාපයක් සලකුණු කළ විට දිස්වන අයුරු



සිතියම් අංක 20. ගහේ වාඩිය ප්‍රදේශය වටා ඇඳි කිලෝ මීටර් 1.6 ක ප්‍රේරක කලාපය. මෙම ප්‍රදේශයේ ඉඩම් පරිහරණය නියාමනය තුලින් ගංගා ඉවුර සංරක්ෂණය, සම්ප්‍රදායික ධිවර ප්‍රජාවගේ අදායම තහවුරු කිරීම, කඩොලාන සංරක්ෂණය තහවුරු වීම යනාදිය සිදුවේ.



සිතියම් අංක. 21. විල්පත්තු ජාතික වනෝද්‍යානයේ නැගෙනහිර මායිම වටා අඳින ලද කිලෝ මීටර් 1.6 ක ප්‍රේරක කලාපය.

මෙම ප්‍රදේශයන් තුළ පරිසර හිතකාමී වී වගාව, පාංශු සංරක්ෂණය, වනාන්තර ඇති කිරීම, මානව හා වන සත්ත්ව ගැටුම් අවම කිරීම ඇතුළු විශේෂ ඉඩම් පරිහරණ කළමනාකරණ විධි අවශ්‍ය වේ. විල්පත්තු ජාතික වන උද්‍යානයට නැගෙනහිරින් පිහිටි ප්‍රදේශය විශාල ලෙස වගා කටයුතු සඳහා භාවිත කර ඇත. මෙම ප්‍රදේශයේ කුඩා වැව් (ක්‍රියාත්මක සහ අත්හල) විශාල සංඛ්‍යාවක් පිහිටා ඇත. ආරක්ෂාකාරී ලෙස කෘෂි රසායන භාවිතය, මිනිස් සෞඛ්‍යට කෘෂි රසායනවල ඇති අයහපත් බලපෑම්, ගෙවතු මට්ටමින් ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීමේ වැදගත්කම, පරිසර හිතකාමී ගොවිතැන් ක්‍රම යනාදිය පිළිබඳව වර්තමානයේ දී මෙම ප්‍රදේශයේ ජනතාව ඇති දැනුම ප්‍රමාණවත් නො වන බව පෙනේ. තව ද, රටෙහි ප්‍රධාන ජාතික වන උද්‍යානයක් වටා ජීවත් වුව ද, එමඟින් ඔවුනට ආර්ථික ප්‍රතිලාභයක් දැනට හිමිව නැත. එසේම ආරක්ෂාකාරී ලෙස හා ප්‍රශස්ත ලෙස කෘෂි රසායන භාවිතය පිළිබඳ දැනුවත් කිරීම සඳහා කඩිනම් අවධානයක් යොමු කළ යුතු වේ.


වැව් සඳහා රක්ෂිතයන්

යෝජිත ගංගා රක්ෂිතවලට අමතරව සෑම වැවක් සඳහා ම වැව් රක්ෂිත සලකුණු කළ හැකි වේ. මෙම රක්ෂිත ප්‍රදේශවල විශාලත්වය භූ විෂමතාවය හා වැවේ ඉහළ ජල ගැලුම් සීමාව අනුව තීරණය වේ. මෙම ජලාශවල පැවැත්ම තහවුරු කිරීම සඳහා මෙම රක්ෂිත නිසි ලෙස කළමනාකරණය කළ යුතු වේ. පවතින නීති භාවිත කරමින් රක්ෂිතවල ඉඩම් පරිහරණයන් දැඩි ලෙස නියාමනය කළ යුතු වේ. වැව් රක්ෂිත තුළ සිදුවන ගඩොල් සැකසීම, කන්න බෝග වගාව වැනි අයෝග්‍ය ක්‍රියාකාරකම් වැළැක්විය යුතු අතර, විකල්ප ජීවනෝපායන් හඳුනාගත යුතු වේ. මෙම රක්ෂිත වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ වක්‍ර ලේඛ අනුව සලකුණු කළ හැකි වේ.

4.2.4 තීරණය 04: මිනිස්-අලි සහපැවතුම් (co-existence) කලාප නිර්මාණය සඳහා ඉඩම් පරිහරණ සැලසුම්කරණය

කලා ඔය ද්‍රෝණියේ අලින් විශාල සංඛ්‍යාවක් ආරක්ෂිත ප්‍රදේශවලට පිටතින් පහිටි ප්‍රදේශයන්හි සැලකිය යුතු කාලයක් ජීවත් වේ. මෙම අලි උප ද්‍රෝණි අතර මෙන්ම අවට පිහිටි මී ඔය, දැදුරු ඔය, මල්වතු ඔය, සහ මහවැලි ද්‍රෝණි අතර සංක්‍රමණය කරයි.

කලා ඔය ද්‍රෝණියේ වර්තමාන ආරක්ෂිත ප්‍රදේශ විසිරි පවතී. එලෙස ම අවට ද්‍රෝණිවල ද මෙම තත්ත්වය එසේම දක්නට ලැබේ. එබැවින් අලින් වැනි විශාල ශාක භක්ෂකයින් අහාර සඳහා හා සංචරණය සඳහා මෙම විසිර පවතින ආරක්ෂිත ප්‍රදේශ අතර සංක්‍රමණය සිදු කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස විශාල අලින් සංඛ්‍යාවක් වගා බිම් සහ මිනිස් වාසාස්ථානවල ගැවසේ. සිතියම් අංක 8 හි දක්වා ඇති ජන ඝනත්ව සිතියම අනුව මෙම ආරක්ෂිත ප්‍රදේශ අතර ප්‍රදේශය වැඩි ජන ඝනත්වයකින් යුතු අතර එමඟින් මිනිසුන් හා අලින් අතර ගැටුම්කාරී තත්ත්වයක් නිර්මාණය වී ඇත. තව ද, කුඩා වැව් විශාල සංඛ්‍යාවක් පැවතීම, මෙම වැව්වල රක්ෂිතයන්හි හුදකලා කුඩා කැලෑ ප්‍රදේශ සහ ලඳු කැලෑ තිබීම අලින්නගේ ගැවසීම තවදුරටත් වැඩි කිරීමට සහ ගැටුම් උග්‍ර වීමට හේතු වී ඇත. (සිතියම් අංක 22).



සිතියම් අංක. 22. කලා ඔය ද්‍රෝණියේ අලින්ගේ ව්‍යාප්තිය (මූලාශ්‍රය: BD survey data)

''මැක්සේන්ට්'' (Maxent[43]) මෘදුකාංගය, විශේෂවල පැතිරීම සහ පාරිසරික නිකේතන නිරූපණය සඳහා පදනම් වන උපරීම එන්ට්‍රොපි ප්‍රවේශයකි. ආරක්ෂිත ප්‍රදේශයන්ට පිටතින් පිහිටි ප්‍රදේශවල අලින්ට සුදුසු වාසස්ථාන මෙමඟින් නිරූපණය කළ හැකි අතර, එය සිතියම් අංක 22 හි දක්වා ඇත. මෙම ප්‍රදේශ ආරක්ෂිත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කළ නොහැකි බැවින් පහත දක්වා ඇති කලාප අලි කළමනාකරණ කලාප (MER) ලෙස කළමනාකරණය කළ හැකි වේ. මෙවැනි කලාප හතරක් හඳුනාගෙන ඇති අතර, ඒවා අලි කළමනාකරණ කලාප සංකල්පය යටතේ කළමනාකරණය කිරීම තුලින් මිනිස් - අලි ගැටුම් අවම කිරීම සහ මිනිස් අලි සහපැවත්ම තහවුරු කළ හැකි වේ. මෙම කලාප සලකුණු කිරීම ප්‍රධාන වශයෙන් ජන ඝනත්වය සහ අලින් සඳහා වන වාසස්ථාන යෝග්‍යතාවය පදනම් කර සිදු කරන ලදී.

එසේ ම දැනට හඳුනාගෙන ප්‍රකාශයට පත් කර ඇති අලි මංකඩ තුළ සංවර්ධන ක්‍රියාකාරකම් සීමා කිරීම ද යෝජනා කෙරේ.

මෙම කලාප හතරෙහි ඉඩම් පරිහරණය මිනිස් අලි සහපැවැත්ම ඉලක්ක කර සිදු කළ යුතු අතර, දැනට හඳුනාගෙන ඇති අලි මංකඩ ආරක්ෂා කිරීමට උත්සාහ ගත යුතු වේ.

මෙම කලාප අතර පහත දක්වා ඇත;

කලාපය A: කලා ඔය දකුණු ඉවුර ආශ්‍රිත ප්‍රදේශය:
මෙයට පහළ මාරගහ වැව සහ ඉහළ රාජාංගනය අයත් වේ. මෙය මල්වතු ඔය උප ද්‍රෝණියට සම්බන්ධ වේ.


කලාපය B: කලා ඔය වම් ඉවුර ආශ්‍රිත ප්‍රදේශය:
පහළ රාජාංගනය සහ සියඹලන්ගමුව උප ද්‍රෝණිවලට ඇතුළත් වන අතර, එය මී ඔය සහ දැවුරු ඔය උප ද්‍රෝණිවලට සම්බන්ධ වේ.

කලාපය C:
කලා ඔය ද්‍රෝණියේ ඉහළ පෝෂක ප්‍රදේශය වන අතර දඹුලු ඔය, මිරිස්ගොනියා ඔය හා ඉහළ කලා ඔය ප්‍රදේශ ඇතුළත් වන අතර, මල්වතු ඔය, යාන් ඔය, හා මහවැලි උප ද්‍රෝණිවලට සම්බන්ධ වේ.

කලාපය D: කලා ඔය ද්‍රෝණියේ පහළ ප්‍රදේශය වන අතර මී ඔය ද්‍රෝණියට සම්බන්ධ වේ.
තව ද, මෙම කලාපය විල්පත්තු ජාතික වන උද්‍යානය හා තබ්බෝව රක්ෂිතය යා කරනු ලබයි.

මෙම කලාපවල දල බිම් ප්‍රමාණයන් 12 වගුවේ දක්වා ඇත.

[43]http://biodiversityinformatics.amnh.org/open_source/maxent/




සිතියම් අංක 23. අලි සඳහා සුදුසු වාසස්ථාන “Maxent” නිමැවුමෙන් දක්වා ඇති අයුරු. කොළ පැහැති ප්‍රදේශ වැඩි යෝග්‍යතාවයක් සහිත ප්‍රදේශ ලෙසත් රතු ප්‍රදේශ අඩු යෝග්‍යතාවයක් සහිත ප්‍රදේශ ලෙසත් දිස්වේ. මෙම යෝග්‍යතාවය ඉඩම් පරිහරණය සහ ජල තල ස්ථරයන් භාවිතයෙන් නිර්මාණය කරන ලදී.

වගුව 12. සලකුණු කරන ලද කලාපවල දල වපසරිය.

කලාපය	දල වපසරිය (ha.)
A කලාපය	81459
B කලාපය	34321
C කලාපය	62841
D කලාපය	3289

මෙම ප්‍රදේශ සඳහා අනුගමනය කළ යුතු ප්‍රධාන ඉඩම් පරිහරණ ක්‍රියාකාරකම් වනුයේ ගම් පදනම් කර ඒ වටා විදුලි/ජීව වැටවල් ස්ථාපිත කිරීම, සතුන්ට ආහාර ලබා ගැනීම සඳහා පුරන් බිම් ඉතිරි කිරීම, වගාවන් නිසි ලෙස සැලසුම් කිරීම, හඳුනාගත් අලි මංකඩවල් අවහිර වීම වැළැක්වීම සඳහා ඒවා තුළ සංවර්ධන කටයුතු සිමා කිරීම, ප්‍රජා වන වගා ස්ථාපිත කිරීම, ප්‍රජාව සහ සතුන්ගේ අවශ්‍යතා සඳහා ජලය ලබා ගැනීම තහවුරු කිරීමට කුඩා වැව් පුනරුත්ථාපනය වේ.




සිතියම් අංක. 24. අලි-මිනිස් සහපැවත්ම සඳහා යෝජිත කලාප (කලාප A: කලා ඔය දකුණු ඉවුර, කලාප B: කලා ඔය වම් ඉවුර, කලාප C: කලා ඔයේ ඉහල පෝෂක ප්‍රදේශය සහ කලාප D: ද්‍රෝණියේ පහළ පෝෂක ප්‍රදේශය)


4.2.5 තීරණ 05: කලා ඔයේ මෝය සහ ඒ අවට පරිසරය ආරක්ෂා කිරීමේ උපාය මාර්ග

කලා ඔය මෝය සහ ඒ ආශ්‍රිත පරිසරය අද්විතීය වන අතර, එය කඩොලාන ඇතුළු විවිධ වූ ජලීය සහ භෞමික සත්ත්ව සහ ශාක විශේෂ සඳහා වාසස්ථාන සපය යි. එබැවින්, මෝය සහ ඒ ආශ්‍රිත ප්‍රදේශය ආරක්ෂා කිරීම ඉතා වැදගත් වේ. මෙම ප්‍රදේශය ජෛව විවිධත්වය අතින් වැදගත් වන බැවින් එය පාරිසරික සංවේදී ප්‍රදේශයක් ලෙස හඳුනා ගෙන ඇත.

වර්තමානයේ ඇති අණ පනත්වල (රජයේ ඉඩම් ආඥා පනත, වෙරළ සංරක්ෂණ පනත, වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනත, වන ආඥා පනත යනාදී) ප්‍රතිපාදන මෙම ප්‍රදේශය ආරක්ෂා කිරීම සඳහා භාවිත කළ හැකි වේ. කඩොලානවල සංරක්ෂණ තත්ත්වය **සිතියම් අංක** 24a සහ 24b මගින් පෙන්වා දී ඇත. එමගින් උපද්‍රවයට ලක්ව ඇති, තර්ජනයට ලක්වීමට ආසන්න සහ අවදානම් සහිත ලෙස කඩොලාන විශේෂ හඳුනා ගෙන ඇත. මෙම විශේෂ වලින් වැඩි ප්‍රමාණයක් ඔය ඉවුරට සමීපව වැවී ඇත.



සිතියම් අංක. 25a. කඩොලානවල සංරක්ෂණ තත්ත්වය.



සිතියම් අංක. 25b. කඩොලානවල සංරක්ෂණ තත්ත්වය (විශාල කරන ලද සිතියම)



ඡායාරූපය 3. මෝය පිහිටි ගඟේ වාඩිය ප්‍රදේශයේ ගුවනේ සිට ලබා ගත් දර්ශනයක්



ඡායාරූපය 4. කලා ඔය පහළ ප්‍රදේශයේ හොඳින් වැවුණු කඩොලාන


4.2.6 තීරණය 06: පෙව විවිධත්ව සංරක්ෂණය – ශාක හා සත්ත්ව විශේෂවල සංරක්ෂණ තත්ත්වය

සතුන් විශේෂ


සංරක්ෂණ වැදගත්කමින් යුත් තෝරාගත් විශේෂ භාවිත කරමින් ප්‍රමුඛ සංරක්ෂණ ප්‍රදේශ හඳුනාගැනීම තුලින් පෙව විවිධත්ව සංරක්ෂණය සැලසුම් කළ යුතු වේ. මෙම විශේෂ ඒකදේශීය හෝ තර්ජනයට ලක් වූ හෝ අවදානම් සහිත හෝ යන කාණ්ඩවලට අයත් විය හැකි ය. එසේ ම මෙම විශේෂ භූ දර්ශනයක් තුළ ජීවත්වන්නා වූ සුවිශේෂී විශේෂ (landscape species) හෝ යම් වාසස්ථානයකට විශේෂ වූ විශේෂ (habitat specialist species)/යම් පරිසර පද්ධතියක පැවැත්ම සඳහා වූ විශේෂ (keystone species)/සංක්‍රමික විශේෂ (migratory species)/ප්‍රධාන විශේෂ (flagship species) විය හැකි ය. පෙව විවිධත්ව සමීක්ෂණය මගින් තෝරාගත් විශේෂවල තත්ත්වය සහ ව්‍යාප්තිය පිළිබඳ සමහර තොරතුරු ලබා දී තිබේ. සිතියම් අංක 25 මගින් සියලු ම තෝරා ගත් සත්ත්ව සහ ශාක විශේෂවල සංරක්ෂණ තත්ත්වය පෙන්වා දී ඇත. මෙම සංරක්ෂණ තත්ත්වය සත්ත්ව විශේෂ වන උභයජීවීන්, පක්ෂීන්, සමනලුන්, බත් කූරන්, ක්ෂීරපායීන්, උරගයන්, කරදිය හා කිවුල්දිය මත්ස්‍යයන් සහ කරදිය ඇල්ගී සහ මුහුදු තෘණ ඇතුළත් ශාක විශේෂ සඳහා හඳුනා ගන්නා ලදී.

උභයජීවීන් (Amphibians)


ලබා ගත් දත්ත අනුව ද්‍රෝණිය තුළ තර්ජනයට ලක්වීමට ආසන්න හා අවදානම් සහිත විශේෂ ඇති බව හඳුනා ගන්නා ලදී (සිතියම් අංක 27). මොවුන් වැඩි වශයෙන් ද්‍රෝණියේ පහළ ප්‍රදේශයට සීමා වී ඇත. මෙම පෙව විවිධත්ව සමීක්ෂණය ආරම්භයේ දී ද්‍රෝණියේ ව්‍යාපෘතිය මගින් තෝරා ගත් ප්‍රදේශ දෙකක් සල්කිල්ලට ගෙන සිදු කරන ලද අතර, ද්‍රෝණියේ ඉහළ සහ පහළ ස්ථාන දෙකක දත්ත සාන්ද්‍රණය වැඩි වීමට එය හේතුවක් විය හැකි බව පෙනේ. එසේ වුව ද, “Maxent” නිමැවුම (සිතියම් අංක 28) තුලින්ද ද උභයජීවීන් සඳහා වඩාත් සුදුසු වාසස්ථාන ද්‍රෝණියේ පහළ කොටසේ ඇති බව දක්වයි. වැව් හෝ වෙනත් ජලාශ ඇති අනෙක් ප්‍රදේශ ද උභයජීවීන්ට වඩාත් යෝග්‍ය බව පෙන්නුම් කෙරේ. උභයජීවීන් වැඩි වශයෙන් ද්‍රෝණියේ පහළ ආරක්ෂිත ප්‍රදේශ තුළ දක්නට ලැබෙන අතර, ආරක්ෂිත ප්‍රදේශ වලින් පිටත වැව් ආශ්‍රිතව දක්නට ලැබේ. නම්කරන ලද පාරිසරික සංවේදී ප්‍රදේශ, ඔය රක්ෂිතය, සහ ඔයේ මෝයට ආසන්න ප්‍රදේශය යන ස්ථානවලට අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුලින් මෙම විශේෂ සඳහා ආරක්ෂාව ලැබෙනු ඇත. එසේ වුව ද, උභයජීවීන් සඳහා යෝග්‍ය බොහොමයක් වාසස්ථාන ජලය ආශ්‍රිතව දක්නට ලැබෙන බැවින් එම ජලාශ ගොඩ වීම වැළැක්වීම සඳහා උස් වගා බිම්වල පාංශු බාදනය අවම කිරීම, ජලයේ ගුණාත්මය තහවුරු කිරීම සඳහා කෘෂි රසායන භාවිතය අවම කිරීම අවශ්‍ය වේ.



සිතියම් අංක 26. කලා ඔය ද්‍රෝණියේ ශාක සහ සත්ත්ව විශේෂ වල සංරක්ෂණ තත්ත්වය.විවිධ වර්ණයන්ගෙන් යුත් වෘත්තාකාර තිත් සංරක්ෂණ තත්වයන් විදහා දක්වයි.




සිතියම් අංක. 27. ද්‍රෝණිය තුළ උභයජීවීන්ගේ සංරක්ෂණ තත්ත්වය



සිතියම් අංක 28. ‘‘Maxent’’ මගින් සැකසූ උභයජීවීන්ගේ වාසස්ථාන යෝග්‍යතාවය

පක්ෂීන්

කලා ඔය ද්‍රෝණිය තුළ පක්ෂීන්ගේ සංරක්ෂණ තත්ත්වය සිතියම් අංක 29 මගින් දක්වා ඇත. බහුතරයක් ආරක්ෂිත ප්‍රදේශ තුළ හා ඉතිරිය ද්‍රෝණිය උතුරු මායිමට ආසන්නයේ දක්නට ලැබේ. පක්ෂීන්ගේ පැවැත්ම සඳහා අයහපත් ලෙස බලපානු ලබන ක්‍රියාකාරකම් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමත්, මොවුන්ගේ පැවැත්ම තහවුරු කරනු ලබන ක්‍රියාමාර්ග විශේෂයෙන් නිෂ්පාදන කටයුතු සඳහා භාවිත කරනු ලබන ඉඩම් තුළ ප්‍රවර්ධනය කිරීමත් අවශ්‍ය වේ.




සිතියම් අංක 29. කලා ඔය ද්‍රෝණියේ පක්ෂීන්ගේ සංරක්ෂණ තත්ත්වය.


උදාහරණයක් ලෙස මිනිසා විසින් සිදු කරනු ලබන කැලෑ ගිනි තැබීම නිසා පක්ෂීන්ගේ කැදලි තනනු ලබන ස්ථාන විනාශ විනාශ වන බැවින් එවැනි ක්‍රියාකාරකම් වළක්වා ගැනීම සිදු කළ යුතු වේ.

සමනලුන්

සමනලුන්ගේ සංරක්ෂණ තත්ත්වය සිතියම් අංක 30 මගින් පෙන්වා දී ඇත. වාසස්ථාන යෝග්‍යතා සිතියම අනුව සමනලුන් සඳහා වඩාත් සුදුසු ප්‍රදේශ ප්‍රධාන වශයෙන් ද්‍රෝණියේ පහළ කොටසේ පිහිටා ඇත (සිතියම් අංක 31). එම සිතියම් අංක අනුව සාමාන්‍යයෙන් සමස්ත ද්‍රෝණිය ම සමනලුන් සඳහා යෝග්‍ය තත්ත්වයේ ඇති බැවින් එම ජීවීන්ගේ පැවැත්මට ප්‍රශස්ත අකාරයෙන් පොහොර සහ කෘෂි රසායන භාවිතය සඳහා මනා කෘෂිකාර්මික පිළිවෙත් (GAP) පිළිබඳව ගොවින් දැනුවත් කිරීම අවශ්‍ය වේ. තව ද, සමනලුන්ගේ ආහාර අවශ්‍යතා සඳහා මල් හට ගන්නා ශාක ආරක්ෂා කිරීමට ද පියවර ගත යුතු වේ.



සිතියම් අංක 30. කලා ඔය ද්‍රෝණියේ සමනලුන්ගේ සංරක්ෂණ තත්ත්වය.




සිතියම් අංක 31. සමනලුන් සඳහා වාසස්ථාන යෝග්‍යතා සිතියම




ඡායාරූපය 5. ද්‍රෝණිය තුළ සමනලයෙකු මලක් වෙතින් තම අහාර අවශ්‍යතා සපුරා ගැනීම.

කූරන් විශේෂ

කූරන් විශේෂවල සංරක්ෂණ තත්ත්වය සිතියම් අංක 32 හි දක්වා ඇත. තර්ජනයට ආසන්න සහ අවදානම් කූරන් විශේෂ වැඩි වශයෙන් ද්‍රෝණියේ පහළ ප්‍රදේශයට සීමා වී ඇත. වාසස්ථාන යෝග්‍යතාවය පිළිබඳ සිතියම් මගින් පෙන්වා ඇති පරිදි (සිතියම් අංක 33) වඩාත් සුදුසු ප්‍රදේශ ද්‍රෝණියේ පහළ දක්නට ලැබේ.




සිතියම් අංක 32. කලා ඔය ද්‍රෝණිය තුළ කූරන්ගේ සංරක්ෂණ තත්ත්වය



සිතියම් අංක 33. කලා ඔය ද්‍රෝණිය තුළ කූරන්ගේ වාසස්ථාන යෝග්‍යතා සිතියම

ක්ෂීරපායින්


සිතියම් අංක 34 මගින් ක්ෂීරපායින්ගේ (අලින්, දිවියන්, මුවන්, වදුරන් යනාදී සතුන්) සංරක්ෂණ තත්ත්වය දක්වා ඇත. එමගින් අන්තරාදායක තත්ත්වයට පත්, අන්තරාදායක තත්ත්වයට ආසන්න, තර්ජනයට ආසන්න සහ අවදානම් විශේෂ පෙන්වා දී ඇත. සමස්ත ද්‍රෝණිය තුළ ම මොවුන් දක්නට ඇති අතර, ද්‍රෝණියේ පහළ කොටසේ විශේෂයෙන් ආරක්ෂිත ප්‍රාදේශ තුළ වැඩි වශයෙන් දක්නට ලැබේ.




සිතියම් අංක 34. කලා ඔය ද්‍රෝණිය තුළ ක්ෂීරපායින්ගේ සංරක්ෂණ තත්ත්වය.

උරගයින්

උරගයින්ගේ සංරක්ෂණ තත්ත්වය හා වාසස්ථාන යෝග්‍යතාවය සිතියම් අංක 35 සහ 36 හි දක්වා ඇත. වාසස්ථාන යෝග්‍යතා සිතියම අනුව වඩාත් යෝග්‍ය වාසස්ථාන ද්‍රෝණියේ පහළ ප්‍රදේශයේ දක්නට ලැබෙන අතර, ලා රතු පැහැයෙන් දක්වා ඇති කුඩා ප්‍රදේශ හැර සාමාන්‍යයෙන් මුළු ද්‍රෝණිය ම උරගයින් සඳහා යෝග්‍ය බව පෙනේ.




සිතියම් අංක 35. කලා ඔය ද්‍රෝණිය තුළ උරගයිගේ සංරක්ෂණ තත්ත්වය.




සිතියම් අංක 36. කලා ඔය ද්‍රෝණිය තුළ උරගයින් සඳහා වාසස්ථාන යෝග්‍යතාවය.

සමුද්‍රීය හා කිවුල් දිය මත්ස්‍යයන්

අවදානමට ආසන්න සමුද්‍රීය හා කිවුල් දිය මත්ස්‍යයන්ගේ සංරක්ෂණ තත්ත්වය සිතියම් අංක 37 මගින් පෙන්වා දී ඇත. මෙම මසුන්ගෙන් වැඩි ප්‍රමාණයක් මෝය ආශ්‍රිතව ජීවත් වන අතර, කොටසක් කොරල් පරය ආශ්‍රිතව ජීවත් වේ. ඉඩම් පරිහරණ නිර්දේශ සහිතව යෝජිත පාරිසරික සංවේදී ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම මොවුන් ආරක්ෂා කිරීමට උපකාරී වේ.




සිතියම් අංක 37. කලා ඔය ද්‍රෝණියේ මත්ස්‍ය විශේෂවල සංරක්ෂණ තත්ත්වය.



සිතියම් අංක 38. කොරල් පරය ප්‍රදේශයේ මත්ස්‍ය විශේෂවල ව්‍යාප්තිය.

4.2.7 තීරණය 07: පෙව විවධත්ව සංරක්ෂණය – ශාක හා සත්ත්ව විශේෂවල තත්ත්වය


ශාක හා සත්ත්ව විශේෂවල තත්ත්වය සිතියම් අංක 39 හි දක්වා ඇත. සමහර විශේෂ ඒකදේශීය (endemic) වන අතර සමහර විශේෂ දේශීය(indigenous), සංචරණ(migratory), විදේශික/ආගන්තුක(exotic), දේශජ(native) වේ. සාමාන්‍යයෙන් මෙම විශේෂ ද්‍රෝණිය පුරාම ව්‍යාප්තව ඇතත් පොදුවේ ගත් කළ බොහෝ විශේෂ ආරක්ෂිත ප්‍රදේශ තුළ දක්නට ලැබේ.



සිතියම් අංක 39. කලා ඔය ද්‍රෝණිය තුළ ශාක හා සත්ත්ව විශේෂවල තත්ත්වය

4.2.8 තීරණය 08: ද්‍රෝණිය තුළ ඇති ආක්‍රමණශීලි ආගන්තුක විශේෂ

රටෙහි පෙව විවිධත්වයට ආක්‍රමණශීලි ආගන්තුක විශේෂ (IAS) වල ව්‍යාප්තිය පොදුවේ තර්ජනයක් බවට පත්ව ඇත. පෙවවිවිධත්ව ලේකම් කාර්යාලය සතුව ඇති IAS පැතිකඩ දත්ත වලින් මෙම විශේෂවල ව්‍යාප්තියේ ඝනත්වය පෙන්වා ඇත. මෙම දත්ත ප්‍රධාන වශයෙන් ආරක්ෂිත ප්‍රදේශවලට පිටතින් පිහිටි ප්‍රදේශය පාදක කර ඇති අතර, එම විශේෂවල පැතිරීම අධික, මධ්‍යස්ත හා අඩු ලෙස සිතියම් අංක 40 මගින් පෙන්වා දී ඇත. එක් එක් විශේෂවල ආක්‍රමණශීලිත්වය එකිනෙකට වෙනස් බැවින් යෝග්‍ය මට්ටමින් සුවිශේෂී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. භායනයට පත් ප්‍රදේශ පුනරුත්තාපනය එම ප්‍රදේශවල පාරිසරික ක්‍රියාවලි නියම ලෙස සිදු වීමටත්, එමගින් ආක්‍රමණශීලි විශේෂ නැවත ව්‍යාප්ත වීම වැළැක්වීමටත් හේතු වේ. එබැවින්, පුනරුත්තාපන සංකල්පය භාවිතයෙන් පාරිසරික පද්ධතියට හානිකර බලපෑම් කළමනාකරණය කිරීම ආක්‍රමණශීලි විශේෂ මර්ධනය කිරීමේ වැඩසටහනක ප්‍රධාන අංගයකි. එමනිසා, ආක්‍රමණශීලි ආගන්තුක විශේෂ පිලිබඳ ජාතික ප්‍රතිපත්තියේ සඳහන් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම ද්‍රෝණිය තුළ එම විශේෂ වඳ කිරීම සඳහා වැදගත් වේ.



සිතියම් අංක 40. කලා ඔය ද්‍රෝණියේ ආක්‍රමණශීලී විශේෂවල ව්‍යාප්තියේ ඝනත්වය
(මූලාශ්‍රය : උතුරු මැද සහ වයඹ පළාත් වල IAS පැතිකඩ)

4.2.9 තීරණය 09: ද්‍රෝණිය තුළ බෝග වන දර්ශයන්ගේ පැවැත්ම


ප්‍රධාන වශයෙන් මානව ක්‍රියාකාරකම් නිසා ශ්‍රී ලංකාව තුළ ස්වභාවික වාසස්ථානවල සීඝ්‍ර ලෙස බෝග වන දර්ශයන්ගේ ජානමය වශයෙන් හීන වීමක් දක්නට ලැබේ. මෙම වන දර්ශයන් අනාගත භාවිතය සඳහා සත්‍ය හෝ ජානමය විභවයක් සහිත මූලාශ්‍රයන් ලෙස සලකනු ලැබේ. එමනිසා, මෙම වන දර්ශයන් ඒවා තිබෙන ස්ථානවල ම (in-situ) සංරක්ෂණය කිරීමේ වැඩසටහන් සංවර්ධනය වැදගත් වේ. බෝග වන දර්ශ සංරක්ෂණ ව්‍යාපෘතිය මගින් එකතු කරන ලද දත්ත භාවිත කර කලා ඔය ද්‍රෝණිය තුළ ඒවායේ ව්‍යාප්තිය සිතියම් ගත කරන ලදී. (සිතියම් අංක 41) මෙම දත්ත අනුව ප්‍රධාන වශයෙන් වී විශේෂවල වන දර්ශයන් ද්‍රෝණිය තුළ හා ඒ ආසන්නයේ දක්නට ලැබේ. එයට අමතරව, සමහර *Vigna* විශේෂ ද ද්‍රෝණිය තුළ දක්නට ලැබේ. *Oryza* ගණය විශේෂ ලොව පුරා 22 කින් යුක්ත වන අතර, එයින් විශේෂ දෙකක් පමණක් වගා කරනු ලබන බැවින් ඉතිරි විශේෂ වන දර්ශ ලෙස පවතී. ශ්‍රී ලංකාව තුළ වී විශේෂවල වගා නොකරන විශේෂ පහක් සහ එක *Oryza* වලට සමීප ගණයක්දක්නට ලැබේ [44]. කලා ඔය ද්‍රෝණිය තුළ හා සහ ඒ අසල ප්‍රදේශය තුළ වී විශේෂවල වන දර්ශ තුනක් හඳුනාගෙන ඇත.

ලියනගේ ට අනුව, *Oryza nivara* හෙවත් සිංහලෙන් ඌරු වී වශයෙන් හඳුන්වන වී වර්ගය ශ්‍රී ලංකාව තුළ පුළුල්ව ව්‍යාප්තව ඇත. එසේම, *Oeichingeri* විශේෂය ආසියා හා අප්‍රිකාව තුළ පමණක් ව්‍යාප්තව පවතී. මෙම විශේෂ දෙකම ද්‍රෝණිය හා ද්‍රෝණිය අසල ප්‍රදේශයේ දක්නට ලැබේ.

[44]Liyanage.A.S.U. 2010.Eco-geographic survey of crop wild relatives. Crop wild relatives conservation project. Department of Agriculture

මෙම ස්වභාවික ජාන එකතුව අනාගත භාවිතය සඳහා ප්‍රජාවගේ සහභාගිත්වය ඇතිව සංරක්ෂණය කිරීම ඉතා වැදගත් වේ. වනාන්තර ගිනි තැබීම, ස්වභාවික වෘක්ෂලතා හෙළි පෙහෙළි කිරීම, වල් නාශක භාවිතය මෙම විශේෂ එම ස්ථාන වලින් වඳ වී යාමට හේතු වේ. එසේ වුව ද, මෙම විශේෂවල ජානමය වැදගත්කම පිළිබඳව දැනුවත්භාවය නොමැතිකම සහ කුඹුරුවල මෙය ව්‍යාප්ත වීම වැනි හේතු නිසා ජනතාව තුළ මෙම විශේෂ ආරක්ෂා කිරීම සඳහා කැමැත්තක් නැති බව පෙනේ. එමනිසා, මෙම බෝග වන දර්ශ පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම වැදගත් වේ. තව ද, මෙම බෝග වන දර්ශ ක්ෂේත්‍රයේ ම සංරක්ෂණය සඳහා යෝග්‍ය ප්‍රදේශ හඳුනාගැනීම අවශ්‍ය වේ.

මෙම වන දර්ශ සංරක්ෂණය කිරීමෙන් මිනිසුන් හට කිසිදු ප්‍රතිලාභයක් නො ලැබෙන බැවින් ඒවා සංරක්ෂණය සඳහා උනන්දු කෙරෙන යාන්ත්‍රණයක් හඳුන්වා දිය යුතු වේ. එසේ වුව ද, මෙම වන දර්ශ කුඹුරු අසල තිබෙන විට වගා කරනු ලබන වී වර්ග සමග මෙම වන දර්ශ පරාගනය වීමේ ගැටලුවක් උද්ගත වේ. මෙලෙස පරාගනය වැළැක්වීමට මෙම වන දර්ශ කුඹුරුවලට ප්‍රමාණවත් දුරකින් පවත්වා ගැනීම නිර්දේශ කෙරේ. තව ද, ජාන සංරක්ෂණ මධ්‍යස්ථාන තුළ (*ex-situ* conservation) සංරක්ෂණය කිරීම ක්ෂේත්‍රයේ පවතින මෙම ගැටලුවට විසඳුමක් වේ.




සිතියම් අංක 41. කලා ඔය ද්‍රෝණියේ බෝග වන දර්ශයන්ගේ ව්‍යාප්තිය.

4.2.10 තීරණය 10: උස් බිම්වල කෘෂිකාර්මික ශක්‍යතාවය සහ ඉඩම් පරිහරණ නිර්දේශ

උස් බිම් ඒවායේ දක්නට ලැබෙන සීමාකාරී සාධක (බෑවුම, පසේ ගැඹුර, ගල් සහිත බව, ජල වහන තත්ත්වය යනාදිය) අනුව ශක්‍යතා වර්ගීකරණයකට ලක් කළ හැකි වේ[45]. ප්‍රධාන වශයෙන් භූ විෂමතාවය පදනම් කර මෙවැනි වර්ගීකරණයකට උත්සාහයක් ගනු ලැබිණි. මෙහිදී කුඹුරු මෙම වර්ගීකරණයෙන් ඉවත් කරන ලදී.

ඇමෙරිකානු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වර්ගීකරණයට අනුව සීමාකාරී සාධකවල ප්‍රබලත්වය මත බෝග වගාව සඳහා ශක්‍යතාවය දැක්වීමට පන්ති අටකට බෙදා ඇත. මෙම වර්ගීකරණයේදී I පන්තියේ සිට IV පන්තිය දක්වා වන බිම් කෘෂිකාර්මික ශක්‍යතාවයකින් යුතු බිම වන අතර එම ශක්‍යතාවය I පන්තියේ සිට IV පන්තිය දක්වා යාමේදී ක්‍රමයෙන් අඩුවේ. එසේ ම V පන්තියේ සිට VIII පන්තිය දක්වා වන බිම්වල කෘෂිකාර්මික ශක්‍යතාවයක් නොමැත. එවැනි බිම් වන වගා, වන ජීවී කලාප වැනි කටයුතු සඳහා යෝග්‍ය වේ.

මෙම අභ්‍යාසයේ දී භූ විෂමතාවය පදනම් කර පන්ති හතරක් පමණක් හඳුනාගත් අතර එය සිතියම් අංක 42 හි පෙන්වා දී ඇත. අංක 1 සිට 4 දක්වා වන භූමි ඒකකවල කෘෂිකාර්මික ශක්‍යතාවය පිළිවෙලින් අඩු වේ. උදාහරණයක් ලෙස භූමි ඒකක 1 වැඩි කෘෂිකාර්මික ශක්‍යතාවයක් පෙන්වන අතර, ඒකක 4 බෝග වගාවට ඉතා අඩු ශක්‍යතාවයක් පෙන්වයි. එම නිසා භූමි සම්පතේ තිරසාරභාවය තහවුරු කිරීම සඳහා ඒකක 3 සහ 4 සංරක්ෂණ වනාන්තර සඳහා යොදා ගැනීම සිදු කළ හැකි වේ. ඒකක 1 තුළද වගා කටයුතුවල දී අවම ලෙස පසට බාධා කරමින් පාංශු බාදනය හා භූමි හායනය අවම වන ලෙස බෝග වගා කිරීම කළ යුතු වේ.



සිතියම් අංක 42. ද්‍රෝණිය තුළ කෘෂිකාර්මික ශක්‍යතාවය (පරිමාණය කුඩා බැවින් ඒකක එතරම් පැහැදිලි නැත)

[45]Klingebiel, A.A. and P.H. Montgomery. 1961. Land capability classification. USDA Agricultural Hand Book p.210.

4.3 කලා ඔය ද්‍රෝණිය සඳහා යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම

ඉහතින් සඳහන් කළ තීරණ පදනම් කර ගනිමින් ප්‍රධාන ප්‍රදේශ හෝ කලාප හයක් සලකුණු කරමින් ද්‍රෝණිය සඳහා ඉඩම් පරිහරණ සැලැස්මක් පිළියෙළ කරන ලදී (සිතියම් අංක 43). භූමියද ඇතුළුව පවතින ජෛව විවධත්වය සහ අනෙකුත් ස්වභාවික සම්පත්වල තිරසාරත්වය තහවුරු කිරීම සඳහා මෙම කලාප සඳහා වෙනස් ඉඩම් පරිහරණ කළමනාකරණ විධි අවශ්‍ය වනු ඇත. දැනට ආරක්ෂිත ප්‍රදේශ හා යෝජිත ප්‍රදේශ එම ප්‍රදේශ සඳහා පිළියෙළ කර ඇති කළමනාකරණ සැලසුම් මත පදනම්ව අදාළ ආයතන විසින් කළමනාකරණය කළ යුතු වේ. ජෛව විවධත්ව වැදගත්කම හා පවතින ගැටළු/තර්ජන නිසා හඳුනාගත් පාරිසරික සංවේදී ප්‍රදේශ සඳහා විශේෂ අවධානයක් අවශ්‍ය වනු ඇත. එමනිසා, පාරිසරික සංවේදී ප්‍රදේශ වෙනම කලාපයක් ලෙස සලකන ලදී. පාරිසරික සංවේදී ප්‍රදේශයන් තුළ පුද්ගලික හා රජයේ යන අංශ දෙකටම අයත් ඉඩම් පැවතිය හැකි ය. පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ විවිධ ඉඩම් පරිහරණ කාණ්ඩයන් සඳහා නිර්දේශ සැකසීමේදී සංරක්ෂණ හා නිෂ්පාදන යන අංශ දෙක ම සැලකිල්ලට ගන්නා ලදී.

දැනට බලපවත්නා නීති රීති අනුව සමහර ඉඩම් පරිහරණ යාන්ත්‍රණයන් අවශ්‍ය ද්‍රෝණිය තුළ පිහිටි විශේෂ ඉඩම් පරිහරණ කලාප ද හඳුනා ගන්නා ලදී. මෙම කලාප තුළ පුද්ගලික හා රජයේ ඉඩම් පිහිටා තිබිය හැකි ය. එබැවින්, යෝජිත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රජාවගේ සහභාගිත්වය ඇතිව ඵලදායී යාන්ත්‍රණයක් සැකසීම අවශ්‍ය වනු ඇත.

පාරිසරික සංවේදී ප්‍රදේශවලට පිටතින් පිහිටි ප්‍රදේශ වගා කටයුතු සඳහා, පදිංචිය සඳහා සහ නාගරික භාවිතයන් සඳහා භාවිත කර ඇති අතර, එම ප්‍රදේශ ඵලදායිතාවය අතින් වඩා වැදගත් වේ. එසේ වුව ද, මෙම ප්‍රදේශ දැඩි මානව ක්‍රියාකාරකම්වලට නතු වී ඇති බැවින් එම ප්‍රදේශවල ඇති පාරිසරික පද්ධති හායනයට මෙය මුලික වී ඇත. එමනි සා, මෙම ප්‍රදේශය වෙනම ඉඩම් පරිහරණ කලාපයක් ලෙස හඳුනා ගන්නා ලදී. එබැවින්, තිරසාර බව තහවුරු කිරීම සඳහා මෙහිදී ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.

කලා ඔය ද්‍රෝණියේ ඉහළ සහ පහළ පිහිටි ආරක්ෂිත ප්‍රදේශවලට මැදිව ද්‍රෝණියේ මධ්‍යම ප්‍රදේශය පිහිටා ඇත. මෙම ද්‍රෝණියේ දෙකෙළවර පිහිටි ආරක්ෂිත ප්‍රදේශ, හුදකලා විසිරුණු කැලෑ ප්‍රදේශ හා අනෙකුත් ඉඩම් පරිහරණයන් මගින් එකිනෙක යාවී ඇත. වන අලින් මෙම විසිරුණු කැලෑ ප්‍රදේශ හා වගා බිම් හරහා ද්‍රෝණියේ දෙකෙළවර පිහිටි ආරක්ෂිත ප්‍රදේශ අතර සංචරණය සිදු කරනු ලැබේ. එමනිසා, ද්‍රෝණියේ මධ්‍ය ප්‍රදේශයේ මිනිස් අලි ගැටුම් උග්‍ර ලෙස වැඩිවී ඇත. මෙම ගැටුම අවම කිරීම සඳහා සුදුසු උපායමාර්ග ක්‍රියාත්මක කිරීමට මිනිස් අලි සහපැවතුම් කලාපය හඳුනා ගැනීම වැදගත් වේ.

1) ආරක්ෂිත ප්‍රදේශය

දැනටමත් ආරක්ෂිත ප්‍රදේශ

මෙම ප්‍රදේශ නීති මගින් දැනටමත් ආරක්ෂා කර ඇත. මෙම ප්‍රදේශ එම ප්‍රදේශ කළමනාකරණය සඳහා සකස් කර ඇති කළමනාකරණ සැලසුම් අනුව අදාළ ආයතන විසින් කළමනාකරණය කළ යුතු වේ.

ආරක්ෂා කිරීමට යෝජනා කරනු ලබන ප්‍රදේශ

මෙම ප්‍රදේශය ආරක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට යෝජනා කෙරේ. මෙය එලෙස ප්‍රකාශයට පත් කළ පසු එය ආරක්ෂිත ප්‍රදේශ කාණ්ඩයට අයත් වේ.

2) පාරිසරික සංවේදී ප්‍රදේශ

මෙම ප්‍රදේශ ජෛව විවධත්ව සංරක්ෂණය සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතු ප්‍රදේශ වේ. එම ප්‍රදේශවල යෝග්‍ය නොවන පරිහරණයන් නොමැති නම් දැනට තිබෙන පරිහරණයන් සම්පූර්ණයෙන් වෙනස් කිරීමේ අවශ්‍යතාවයක් නැත. එසේ වුව ද, පවතින පරිහරණයන් ජෛව විවිධත්ව සංරක්ෂණය තහවුරු කිරීම සඳහා වැඩි දියුණු කිරීම කළ යුතු වේ. තිබෙන වගා ක්‍රම පරිසර හිතකාමී ලෙස වැඩි දියුණු කළ යුතු වේ. සියලු ආකාරයේ වනාන්තර හෙළි කිරීම් වළකාලිය යුතු වේ. අවම වශයෙන් පවතින වන ආවරණයවත් නඩත්තු කළ යුතු වේ. මෙම ප්‍රදේශයේ මායිම සලකුණු කිරීම ඇතුළු අනෙකුත් සියලු ක්‍රියාකාරකම් ප්‍රජාවගේ සහභාගිත්වය ඇතිව සිදු කළ යුතු වේ. පාරිසරික සංවේදී ප්‍රදේශ විධිමත් ලෙස කළමනාකරණය කිරීම සඳහා ග්‍රාමීය කළමනාකරණ කමිටු පිහිටුවීම සුදුසු ක්‍රියාමාර්ගයක් වනු ඇත. පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ ජීවත්වන ප්‍රජාව පෙළඹවීම සඳහා එම ප්‍රදේශ විධිමත් ලෙස කළමනාකරණය කිරීමෙන් ලැබෙන පාරිසරික සේවාවන් පිලිබඳ විදහා දැක්වීම කළ යුතු වේ..

3) විශේෂ ඉඩම් පරිහරණ කලාප

මෙම ප්‍රදේශය යම් යම් ඉඩම් පරිහරණ සීමා කිරීම් ක්‍රියාත්මක කළ යුතු ප්‍රදේශ වේ (උදා: ප්‍රේරක කලාප හා ජල මාර්ග රක්ෂිත). අවශ්‍ය අවස්ථාවන්හිදී පවත්නා නීති විධිමත් ලෙස ක්‍රියාත්මක කළ යුතු වේ. ප්‍රජා සහභාගිත්වය ඇතිව ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතු අතර විකල්ප ජීවනෝපායන් හඳුනාගැනීම මෙම ප්‍රදේශවල ජෛව විවිධත්වයට තිබෙන තර්ජන අවම කිරීම සඳහා අවශ්‍ය වේ.

4) පාරිසරික සංවේදී ප්‍රදේශවලට පිටතින් පිහිටි පරිසර හිතකාමී ලෙස වගාවන් ඉදිරියට කරගෙන යා හැකි කෘෂිකාර්මික ප්‍රදේශ


මෙම ප්‍රදේශයේ වපසරිය සාපේක්ෂව විශාල වන අතර, ආර්ථිකය සඳහා ඉහළ දායකත්වයක් සපයයි. මෙම ප්‍රදේශය වී වගාව හා උස බිම් වාගාවෙන් යුක්ත වේ. එසේ වුව ද, වර්තමානයේ මෙම වගාවන් පරිසරයට වඩාත් අහිතකර ලෙස සිදුවන බැවින් මෙම තත්ත්වය අවම කර ඉඩම් භාවිතය විධිමත් කිරීමට පුහුණු හා දැනුවත් කිරීම් අවශ්‍ය වනු ඇත. පාරිසරික හිතකාමී වගා රටාවන් ප්‍රවර්ධනය සඳහා ගොවීන්ට උපකාර කළ හැකි සුදුසු වැඩසටහන් හඳුනාගැනීම අවශ්‍ය වේ.

5) පාරිසරික සංවේදී ප්‍රදේශවලට පිටතින් පිහිටි නාගරික හා නේවාසික කලාප

හැකි සෑම විටම තවදුරටත් භූමියේ සිදුකරනු ලබන තිරස් ව්‍යාප්තිය සීමා කර සිරස් ව්‍යාප්තිය දිරිමත් කළ යුතු වේ. නාගරික ප්‍රදේශ සංවර්ධනය නාගරික සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සකස් කර ඇති නාගරික ප්‍රදේශ සැලසුම් අනුව කළ යුතු වේ.

6) වන අලි කළමනාකරණ ක්‍රම හඳුන්වා දිය යුතු මිනිස් අලි සහපැවතුම් කලාපය

මෙම කලාපය අලි සංරක්ෂණය පිලිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුව කළමනාකරණය කිරීම සුදුසු වේ. මෙහි ප්‍රධාන අරමුණ වනුයේ මෙම ප්‍රදේශයේ සිදුවන අලි මිනිස් ගැටුම අවම කිරීම ය. එසේ වුව ද, මෙම ප්‍රදේශයේ ඇති ජනාවාස වලින් වන අලින් ඈත්ව තැබීම සඳහා අදාළ ස්ථානයන්ට වඩාත් සුවිශේෂී වූ ක්‍රියාමාර්ග පිළිබඳව පර්යේෂණ සිදු කළ යුතු වේ.



සිතියම් අංක 43: කලා ඔය ද්‍රෝණිය සඳහා යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම

4.4 යෝජිත පාරිසරික සංවේදී ප්‍රදේශ සහ විශේෂ ඉඩම් පරිහරණ කලාප (SLUZs) සඳහා ඉඩම් පරිහරණ නිර්දේශ.

ජෛව විවධත්ව සංරක්ෂණය තහවුරු කිරීම සඳහා පාරිසරික සංවේදී ප්‍රදේශ ප්‍රජාවගේ සහභාගිත්වය ඇතිව සුවිශේෂී ලෙස කළමනාකරණය කිරීම අවශ්‍ය වේ. පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ වර්තමානයේදී විවිධ වූ ඉඩම් පරිහරණයන් හා භූමි ආවරණයන් දක්නට ලැබේ. දැනට ඇති සමහර ඉඩම් පරිහරණයන් ජෛව විවිධත්වයේ යහ පැවැත්ම සඳහා අයහපත් ලෙස බලපා ඇත. එමනිසා, ආර්ථික කටයුතු නිසි අයුරින් පවත්වාගන්නා අතරම ජෛව විවධත්වය ආරක්ෂා කිරීම සඳහා සුදුසු ඉඩම් පරිහරණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වනු ඇත.

වගු අංක 13 හි දක්වා ඇති ඉඩම් පරිහරණ නිර්දේශ වඩාත් පුළුල් වන අතර ම, ස්වභාවයෙන් ඒවා සාමාන්‍ය නිර්දේශ වේ. නමුත් අනෙකුත් තාක්ෂණික ආයතන හා ඉඩම් පරිහරණය කරනු ලබන ප්‍රජාවගේ ද සහාය ඇතිව එම නිර්දේශ වඩාත් සුවිශේෂී සහ ප්‍රායෝගික නිර්දේශ බවට පත් කිරීමට මෙය මග පෙන්වනු ඇත. මෙවැනි තත්ත්වයන් ඇති අනෙකුත් ද්‍රෝණි සඳහා ද මෙම ක්‍රියාවලිය නිර්දේශ කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන නිර්දේශවල බලපෑම නිරන්තරයෙන් පසුවිපරම් කළ යුතු වේ.

වගුව **13.** යෝජිත පාරිසරික සංවේදී ප්‍රදේශ, විශේෂ ඉඩම් පරිහරණ කලාප සහ අනෙකුත් ප්‍රදේශ සඳහා ඉඩම් පරිහරණ නිර්දේශ

යෝජිත **ESAs,** විශේෂ ඉඩම් පරිහරණ කලාප **(SLUZs)** සහ අනෙකුත් ප්‍රදේශ		ප්‍රධාන ගැටලු හා තර්ජන	ඉඩම් පරිහරණය හා භූමි ආවරණය වැඩිදියුණු කිරීම සහ විනාශකාරී ක්‍රියාවන් අවම කිරීම සඳහා නිර්දේශ	ක්‍රියාත්මක කිරීමේ වගකීම දරණ ප්‍රධාන ආයතන	සහාය ආයතන
ESAs	ESA01 විල්ලු	a) විල්ලුවේ ඇති සමහර ප්‍රදේශ පොල් සිටුවීම සඳහා අනවසරයෙන් භාවිත කිරීම. b) වන අලි සංචරණය සිමා කිරීම සඳහා විශාල කානු කැපීම හේතුවෙන් විල්ලුව ගොඩ වීම. c) විල්ලුව අවට පදිංචි ජනතාව වගා කටයුතු සඳහා විල්ලු ප්‍රදේශය භාවිතා කිරීම. d) අනවසර පදිංචිය සඳහා විල්ලු ප්‍රදේශය භාවිතා කිරීම. e) සමහර විල්ලු ප්‍රදේශ කුඩා වැව් ලෙස සංවර්ධනය කිරීම. f) අනවසර ඉඩම් අල්ලා ගැනීම් ඇතුළු ඉඩම් අයිතියේ ගැටළු නිසා විල්ලු ප්‍රදේශයට තර්ජන ඇතිවීම. g) විල්ලුවේ ඇති වෘක්ෂලතා ගිනි තැබීම. h) වගා කටයුතු සඳහා කෘෂි රසායන අධික ලෙස භාවිතය නිසා විල්ලුවේ වෘක්ෂලතා ආදියට සහ පෙව විවිධත්වයට අයහපත් බලපෑම් ඇතිවීම i) පාංශු බාදනය නිසා විල්ලුව ගොඩ වීම.	• අනවසර අල්ලා ගැනීම් වැළැක්වීම සඳහා පවත්නා නීති/රෙගුලාසි ක්‍රියාත්මක කිරීම. • වගා කටයුතු සඳහා ඉඩම් කෙරෙහි ඇති පිඩනය අවම කිරීමට කෘෂිකර්මයට පරිභාහිර වෙනත් ආදායම් මාර්ග ප්‍රවර්ධනය. • වන අලින් ගම් වැදීම වැළැක්වීමට විල්ලුව තුල කපනු ලබන කානු නියමිත ලෙස සැලසුම් කිරීම හෝ වෙනත් සුදුසු විකල්ප සොයා බැලීම. • ජනතාව දැනුවත් කිරීම . • සංරක්ෂණය ඉලක්ක කල ජීවනෝපායන් ප්‍රවර්ධනය. • දර භාවිතය සඳහා විකල්ප හඳුන්වා දීම . • නීති විරෝධී ධිවර කටයුතු වැළැක්වීම හා විකල්ප ජීවනෝපායන් සොයා බැලීම. • කඩොලාන සංරක්ෂණය සඳහා ක්‍රියාමාර්ග හඳුන්වාදීම. • ඉඩම් ගැටලු විසදීම සඳහා වැඩසටහන් සංවිධානය. • කැලෑ ගිනිතැබීම් හා වෙනත් විනාශකාරී ක්‍රියාකාරකම් වැළැක්වීමට විමසිලිමත් කණ්ඩායම් ස්ථාපිත කිරීම. • කෘෂි රසායන භාවිතය අවම කිරීම සඳහා මනා කෘෂිකාර්මික පිළිවෙත් හඳුන්වාදීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම. • ජනතාවට ප්‍රතිලාභ ලැබෙන නිෂ්පාදන සඳහා සහතික මිල/හොඳ මිල ක්‍රමයක් ස්ථාපිත කිරීම තුලින් පරිසරය සුරැකීමට පෙළඹවීම (උදා: නිෂ්පාදන සඳහා GAP සහතික ලබා දීම) • භූමි හායනය අවම කිරීම සඳහා පාංශු හා ජල සංරක්ෂණ වැඩසටහන් හඳුන්වා දීම. • පාංශු සෞඛ්‍ය නියාමනය සඳහා වැඩසටහන් සංවිධානය හා ඒ අනුව ක්‍රියාත්මක වීම	• ප්‍රාදේශීය ලේකම් කාර්යාල • වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව. • වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව. • පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව. • පොල් වගා කිරීමේ මණ්ඩලය. • පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව. • ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව	• ස්වභාවික සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව (කෘෂි. දෙපාර්ත.) • ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව • කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය • අදාළ පුද්ගලික සංවිධාන.

	ESA02 ගහේ වාඩිය	a) නිරන්තරයෙන් ඇතිවන නියගයන් සහ ගංවතුර තත්වයන් b) පරිසරයට හානි දායක ලෙස දේශීය සංචාරකයින් විසින් කරනු ලබන යම් යම් ක්‍රියාකාරකම්. c) නිදැල්ලේ යන ගවයන්ගේ අධික ලෙස තෘණ උලා කෑම. d) පාලනයකින් තොරව කෙරෙන වැලි ගොඩ දැමීම. e) නීති විරෝධී ධිවර ක්‍රම භාවිතය. f) විවිධ අරමුණු සඳහා කඩොලාන විනාශ කිරීම. g) ඝණ අපද්‍රව්‍ය නිසා සිදුවන පරිසර දූෂණය.	විශේෂිත පාරිසරික ප්‍රදේශ වල වැදගත්කම පිළිබඳව දේශීය සංචාරකයන් දැනුවත් කිරීම (උදා: දැන්වීම් පුවරු ස්ථාපනය, සුපරීක්ෂාකාරී කණ්ඩායම් ඇති කිරීම යනාදිය) පහත දේ වලක්වා ගැනීමට පවතින නීති ක්‍රියාත්මක කිරීම • අනවසර අල්ලා ගැනීම් • නීති විරෝධී ධිවර කටයුතු • කඩොලාන විනාශ කිරීම • නීති විරෝධී සතුන් දඩයම කඩොලාන විනාශය වැළැක්වීම සඳහා දර වෙනුවට වෙනත් විකල්ප පිලිබඳ සොයා බැලීම	• ප්‍රාදේශීය ලේකම් කාර්යාල • පළාත් සභාව • වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	
	ESA03 වේවැල් කැලේ	a) පදිංචිය සඳහා අනවසර ඉඩම් අල්ලා ගැනීම්, බහු වාර්ෂික බෝග (පොල්) සහ කාලීන බෝග වගා කිරීම. b) කළමනාකරණයකින් තොරව සිදුවන වේවැල් කැපීම හා වේවැල් කැපීම පහසු කිරීමට ගිනි තැබීම. c) සතුන් දඩයම් කිරීම. d) වේවැල් කැපීම පහසු කිරීමට බිම තෙත්ව නොතැබීම සඳහා කානු කැපීම e) සිමෙන්ති නිෂ්පාදනය සඳහා මෙයට පෙර මැටි කැනීම් මෙම ප්‍රදේශයේ සිදු කර තිබූ අතර එය නැවත ආරම්භ කිරීමේ ප්‍රවනතාවයක් තිබීම.	තිරසාර ලෙස වේවැල් කැපීම සඳහා විධිමත් වැඩසටහන් සැලසුම් කිරීම. පහත දේ වළක්වා ගැනීමට පවතින නීති ක්‍රියාත්මක කිරීම • අනවසර අල්ලා ගැනීම් • නීති විරෝධී සතුන් දඩයම	• පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල • වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව • ප්‍රජා කණ්ඩායම් • මධ්‍යම පරිසර අධිකාරිය	

	ESA 04 මානෑවකන්ද	a) වනාන්තර බිම් අනවසරයෙන් අල්ලා ගැනීම b) ආක්‍රමණකාරී ආගන්තුක විශේෂ වල පැතිරීම (IAS) c) කැලෑ ගිනි තැබීම d) අනවසර ලෙස සතුන් දඩයම් කිරීම e) නියග තත්වයන් f) තිරසාර නොවන අකාරයෙන් කෘෂි රසායන භාවිතා කරමින් ඒක බෝග වගාව.	පහත දේ වලක්වා ගැනීමට පවතින නීති ක්‍රියාත්මක කිරීම • අනවසර අල්ලා ගැනීම් • නීති විරෝධී සතුන් දඩයම කෘෂි රසායන භාවිතය අවම කිරීම සඳහා මනා කෘෂිකාර්මික පිළිවෙත් හඳුන්වාදීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා විමසිලිමත් කණ්ඩායම් ස්ථාපිත කිරීම. ආක්‍රමණශීලි ආගන්තුක විශේෂ වඳ කිරීම සඳහා වැඩසටහන් පිළියෙළ කිරීම	• වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව • පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල • ප්‍රජා කණ්ඩායම් /ගොවි සංවිධාන • මධ්‍යම පරිසර අධිකාරිය	
	ESA 05 ගංගාශ්‍රිත ප්‍රදේශය	a) බොහෝ විට කන්න බෝග වගාව සඳහා අනවසර ඉඩම් අල්ලා ගැනීම් b) කළා වැවේ වාන් ජලය ඉවතට යන මාර්ගයේ පදිංචිව සිටීම (මේ නිසා වැව වාන් දමන අවස්ථාවන්හිදී ඔවුන්ගේ නිවාස ජලයෙන් යටවීම සිදුවේ) c) ජල දූෂණය d) අනවසර ලෙස සතුන් දඩයම් කිරීම e) කෘෂි රසායන අධික ලෙස භාවිතය.	• වාන් දමන ප්‍රදේශයේ පදිංචි ජනතාවට පදිංචිය සඳහා විකල්ප ඉඩම් හඳුනාගැනීම • ජනතාවගේ සහභාගිත්වය ඇතිව ඔය ඉවුරු ආශ්‍රිත වන තීර නඩත්තුව සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	• වාරිමාර්ග දෙපාර්තමේන්තුව • පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව • පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව • ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	

SLUZs	ජල මාර්ග රක්ෂිතයන්	a) වැලි කැණීම් b) අනවසර ඉඩම් අල්ලා ගැනීම් c) වනාන්තර කැපීම	• රජයේ ඉඩම් සඳහා; පවත්නා වෘක්ෂලතා ආරක්ෂා කිරීම, අනවසර අල්ලා ගැනීම් වැළැක්වීම, තිබෙන අනවසර අල්ලා ගැනීම් ඉවත් කිරීම • පුද්ගලික ඉඩම් සඳහා; සහනාධාර මගින් මෙහයවනු ලබන ඔය ඉවුරු සංරක්ෂණය සඳහා සහභාගිත්ව ක්‍රමවේදය තුලින් පියවර ගැනීම.	• ප්‍රාදේශීය ලේකම් කාර්යාල චාරිමාර්ග දෙපාර්තමේන්තුව (පළාත්/මධ්‍යම) • වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව • මධ්‍යම පරිසර අධිකාරිය ගොවි සංවිධාන/ප්‍රජා මූල සංවිධාන/රාජ්‍ය නොවන	
	කොරල් පරයේ ප්‍රේරක කලාපයද ඇතුලත්ව අනෙකුත් ආරක්ෂිත ප්‍රදේශ වල ප්‍රේරක කලාපයන්	a) නීති විරෝධී ධිවර කටයුතු b) නීති විරෝධී සතුන් දඩයම් කිරීම c) වනාන්තර කැපීම d) අනවසර ඉඩම් අල්ලා ගැනීම් e) නිසි ලෙස කළමනාකරණය නොකළ සංචාරක කටයුතු	• මෙම ප්‍රදේශ වල සංරක්ෂණය සහ ප්‍රජාවගේ සමාජීය යහ පැවැත්ම සඳහා විශේෂ වැඩපිළිවෙලක් අවශ්‍ය වේ. • සංවර්ධන කටයුතු සීමා කිරීම • කෘෂි රසායන අවම කිරීම සහ කෘෂි වන වගා ප්‍රවර්ධනය • විනාශකාරී ධිවර කටයුතු වැළැක්වීම • සංචාරකයින් කළමනාකරණය කිරීම • වනාන්තර කැපීම වැළැක්වීම	• වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව • පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව • මධ්‍යම පරිසර අධිකාරිය ධිවර අමාත්‍යාංශය	
	මෝය ප්‍රදේශය සහ ආශ්‍රිත වාසස්ථාන	a) අපද්‍රව්‍ය දැමීම b) වැලි කැණීම c) කඩොලාන විනාශ කිරීම	• ප්‍රදේශයේ පෙළ විවධත්ව සංරක්ෂණය තහවුරු කිරීම සඳහා රජයේ ඉඩම් ආඥා පනත, වෙරළ සංරක්ෂණ පනත, වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනත, වන සංරක්ෂණ ආඥා පනත යනාදී පනත් වල ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම.	• වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව • වෙරළ සංරක්ෂණ ධිවර අමාත්‍යාංශය • වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	
SLUZs	මිනිස් අලි සහපැවතුම් කලාපය	a) කුඩා වනාන්තර කැබලි විනාශ කිරීම b) අලින්ට තර්ජන වැඩි වීම c) වනාන්තර ප්‍රදේශ තුලට වගාවන් ව්‍යාප්ත වීම	• ගම් වටා විදුලි වැට ඉදිකිරීම • පිවිසුම් සංරක්ෂණය • වැව් පුනරුත්ථාපනය • පුරන් ඉඩම් /තෘණ බිම් නඩත්තුව	• වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව • පළාත් චාරිමාර්ග දෙ. • ගොවිජන සංවර්ධන දෙ. • පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	

	කුඩා වැව් ආශ්‍රිත වාසස්ථාන	• මැටි කැනීම • වනාන්තර කැපීම • අනවසර ඉඩම් අල්ලා ගැනීම	• කෘෂි රසායන භාවිතය අවම කිරීම • මනා කෘෂිකාර්මික පිළිවෙත් හඳුන්වාදීම • විකල්ප ජීවනෝපායන් ප්‍රවර්ධනය	• පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව • ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව.	
පාරිසරික සංවේදී ප්‍රදේශ වලට පිටතින් පිහිටි කෘෂිකාර්මික ප්‍රදේශ	කුඹුරු	• කෘෂි රසායන අධික ලෙස භාවිතය • රසායනික පොහොර අධික ලෙස භාවිතය • ජල කළමනාකරණ ගැටළු	• මනා කෘෂිකාර්මික පිළිවෙත්/ඒකාබද්ධ පලිබෝධ පාලනය ප්‍රවර්ධනය • කාබනික පොහොර භාවිතය, ශාක ශාර පලිබෝධනාශක භාවිතය ප්‍රවර්ධනය • දැනුවත් කිරීම	• ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව • ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	
	ගොඩ ඉඩම්	• කෘෂි රසායන අධික ලෙස භාවිතය • ජලය හිඟ කම • පාංශු ඛාදනය	• මනා කෘෂිකාර්මික පිළිවෙත් හඳුන්වාදීම • තෙතමන සංරක්ෂණය ප්‍රවර්ධනය • පාංශු සංරක්ෂණය හඳුන්වා දීම	• පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව • ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	
පාරිසරික සංවේදී ප්‍රදේශවලට පිටතින් පිහිටි ජනාවාස සහ නාගරික භාවිතයන්		• වනාන්තර ප්‍රදේශ තුළට ව්‍යාප්ත වීම • පොලිතින් ඇතුළු එවැනි ද්‍රව්‍ය භාවිතය නිසා පරිසර දූෂණය • ඉඩම් කැබලි වීම • ඉඩම් කෙරෙහි ජනගහන පීඩනය	• හැකි සෑම විටම සිරස් ව්‍යාප්තිය ප්‍රවර්ධනය • අනාගත ව්‍යාප්තියේදී ඉඩම් යෝග්‍යතා ඇගයීම හඳුන්වා දීම.	• නාගරික සංවර්ධන අධිකාරිය • නිවාස සංවර්ධන අධිකාරිය • ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	

4.5 නිෂ්පාදන හා සංරක්ෂණ ඉලක්ක

ජෛව විවධත්වය සංරක්ෂණය කරන අතර ම භූමි සම්පත තිරසාර භාවිතය තහවුරු කරමින් පහත දැක්වෙන නිෂ්පාදන හා සංරක්ෂණ ඉලක්ක යෝජනා කෙරේ.

1. දල වශයෙන් හෙක්ටයාර 4000 පමණ ද්‍රෝණිය තුළ පිහිටි ජල මාර්ග රක්ෂිත ඉඩම්වල ඉඩම් පරිහරණය සහභාගිත්ව ප්‍රවේශය තුලින් නියාමනය කිරීම.

2. ආරක්ෂිත ප්‍රදේශවල ප්‍රේරක කලාප ප්‍රජාවගේ සහභාගිත්වය ඇතිව කළමනාකරණය කිරීම. එම ප්‍රේරක කලාප වලින් 70% ක් පමණ එලෙස කළමනාකරණය කිරීම.

3. වී වගාවේදී සහ අනෙකුත් වගාවල දී කෘෂි රසායන භාවිතය අවම කිරීම සඳහා මනා කෘෂිකාර්මික පිළිවෙත් හඳුන්වා දීම. මෙහිදී කුඹුරු වලින් 70% කට සහ උස් බිම් වගා වලින් 50% කට මෙම ක්‍රම හඳුන්වා දීම.

4. ඌණ පරිහරණ ගෙවතු වලින් 50% ක් මනා භූමි ආවරණයක් පවත්වා ගනිමින් ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා සංවර්ධනය කිරීම. මී මැසි පාලනය හා සත්ත්ව පාලනය හඳුන්වා දීම.

5. මෝය ආශ්‍රිතව තිබෙන කඩොලාන අවම වශයෙන් දැනට තිබෙන ප්‍රමාණයවත් නඩත්තු කිරීම. විධිමත් වැඩසටහන් තුලින් කදොලාන් ස්වභාවිකව ඇතිවීම ප්‍රවර්ධනය.

6. යෝග්‍ය වැඩසටහන් මගින් විශේෂයෙන් ප්‍රේරක කලාප, ඉවුරු රක්ෂිත සහ පරිසර සංවේදී ප්‍රදේශ තුළ ආක්‍රමණශීලි ආගන්තුක විශේෂ ඉවත් කිරීම.

7. දල වශයෙන් හෙකටයාර 181,910 ha භූමි ප්‍රමාණයක් අලි මිනිස් සහපැවතුම් කලාපයක් ලෙස නඩත්තු කිරීම සහ යෝග්‍ය උපායමාර්ග හඳුන්වා දීම තුලින් අලි මිනිස් ගැටුම් අවම කිරීම

8. විශාල සහ කුඩා වැව්වල පෝෂක ප්‍රදේශයන් කළමනාකරණය තුලින් මෙම වැව්වල මනා පැවැත්ම තහවුරු කිරීම. කුඩා වැව් ආශ්‍රිත එල්ලංගා පද්ධතින්හි අංගවල සම්බන්ධතාවය තහවුරු කිරීම සහ සංවර්ධනය.

9. ආරක්ෂිත ප්‍රදේශ ආසන්නව පිහිටා ඇති විසිරි පවතින කුඩා කැලෑ රොදවල් නඩත්තු කිරීම. මෙම කොටස පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ හෝ පිටත තිබිය හැකි වේ. හැකි ප්‍රමාණයෙන් මෙම කැලෑ රොදවල් එකිනෙක සම්බන්ධ කිරීම තහවුරු කල යුතු වේ.

10. කොරල් පරය හා ඒ ආශ්‍රිත ප්‍රදේශය ආරක්ෂා කිරීම සඳහා සුදුසු යාන්ත්‍රනයක් ක්‍රියාත්මක කිරීම.

11. ද්‍රෝණියේ ජීවත්වන ගොවින් ඒකාබද්ධ පලිබෝධ පාලනය සහ මනා කෘෂිකාර්මික පිළිවෙත් පිලිබඳ දැනුවත් කිරීම හා පුහුණුව.

12. ප්‍රජා මිතුරු යාන්ත්‍රණයන් තුලින් පාරිසරික සංවේදී ප්‍රදේශ කළමනාකරණය පිලිබඳ 50% ක් ගොවින් දැනුවත් කිරීම.

4.6 ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය සහ පසු විපරම

මෙම සැලසුමේ නිර්දේශිත ක්‍රියාකාරකම් සහභාගිත්ව ක්‍රමවේදය භාවිත කර සිදු කළ යුතු වේ. එසේ ම මෙම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා ගම් මට්ටමින් ප්‍රජා කණ්ඩායම් ගොඩනැංවීම කළ යුතු වේ. මෙම කණ්ඩායම් විසින් ජෛව විවධත්ව සංරක්ෂණය සහ ජනතාවගේ ආර්ථික දියුණුව සඳහා කුඩා ව්‍යාපෘති සංවර්ධනය කළ හැකි වේ. මෙම ක්‍රියාකාරකම් පසුවිපරම් කිරීම අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සිදු කළ හැකි වේ.

4.7 අනාගත පර්යේෂණ අවශ්‍යතා

ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා දැනට පවත්නා නීති රීති විමර්ශනය කර ඒවායේ අඩු පාඩු හා සංශෝධනය විය යුතු ස්ථාන හඳුනා ගැනීම අවශ්‍ය වේ. සමුද්‍රීය හා මිරිදිය වාසස්ථාන මෙන් ම භෞමික වාසස්ථාන සම්බන්ධයෙන් ද පර්යේෂණ දිගු කළ යුතු වේ. එසේ ම කොරල් පරය පුනරුත්ථානය සම්බන්ධයෙන් ස්ථානීය පර්යේෂණ සිදු කර නිර්දේශ ලබා දීම අවශ්‍ය වේ.

ජෛව විවධත්වය සංරක්ෂණය කරන අතර ම ප්‍රශස්ත නිෂ්පාදනයක් ලභා කර ගැනීම සඳහා වන කෘෂිකාර්මික පර්යේෂණ සඳහා විශාල ඉඩක් පවතී. ප්‍රධාන වශයෙන් මනා කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳව පර්යේෂණ තව දුරටත් අවශ්‍ය වන අතර, එම පර්යේෂණ ගොවි බිම්වල අත්හදා බැලීම ඒවායේ උපයෝගිතාවය පරික්ෂා කිරීම සිදු කළ යුතු වේ. පාංශු සහ ජල සංරක්ෂණය, වාරි සහ ජල කළමනාකරණ කටයුතු, ඒකාබද්ධ පල්බෝධ පාලනය, ශාකසාර කෘමිනාශක වැඩි දියුණු කිරීම් යනා දී ක්ෂේත්‍ර පිළිබඳව පර්යේෂණ ත වදුරටත් දිගු කළ යුතු වේ. දේශීය තත්ත්වයන්ට ගැළපෙන ලෙස සහභාගිත්ව ප්‍රවේශයන් පිළිබඳ ක්‍රමවේද නවීකරණය කළ යුතු වේ.

තව ද, පාරිසරික සංවේදී ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා ජනතාව උනන්දු කිරීමේ යාන්ත්‍රණ පිළිබඳව සමාජ ආර්ථික පර්යේෂණ සිදු කිරීම අවශ්‍ය වේ. පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ ජීවත්වන ජනතාව හුදෙක් ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා ම මෙම ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා පෙළඹවීමක් නැති බැවින් මෙවැනි පර්යේෂණවල අවශ්‍යතාවය ඉස්මතුව ඇත. එම නිසා ජෛව විවිධත්වය හැර වෙනත් පාරිසරික සේවා සඳහා බලපාන අනෙකුත් සාධක හඳුනා ගැනීම අවශ්‍ය වේ. මෙම හේතු හඳුනා ගැනීම තුලින් පාරිසරික සංවේදී ප්‍රදේශ ආරක්ෂා කිරීමෙන් ජනතාවට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් කර ඔවුන් අභිප්‍රේරණය කළ හැකි වේ. මෙවැනි ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ලැබීම සඳහා සාපේක්ෂව දිගු කාලයක් ගත වන බැවින්, සහනාධාර ක්‍රමයක් තුලින් මෙහයවනු ලබන යාන්ත්‍රනයක් මුලින් හදුන්වා දීම සුදුසු වේ.